2026

# අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

**2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
ශ්‍රී ලංකාව

**2025 නොවැම්බර් 07**

# අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2026

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය,
ශ්‍රී ලංකාව

2025 නොවැම්බර් 07

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් නිකුත් කරනු ලැබේ.

කොළඹ 08, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 118 දරන ස්ථානයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරන ලදුව, ශ්‍රී ලංකාවේ කොළඹ 01, මහලේකම් කාර්යාලයේ පිහිටි මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් පළ කරන ලදී.

# පටුන


| | පිටු අංකය |
|---|---|
| මූලික ආර්ථික දර්ශක | vii |
| 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ඉදිරිපත් කළ යුතු වාර්තා | viii |
| අනුකූලතාව - 2025/2026 | x |
| **I කොටස** | |
| **01. මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය** | |
| 1.1 සමාලෝචනය | 5 |
| 1.2 සාර්ව රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය | 10 |
| 1.3 මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශනය | 13 |
| **II කොටස** | |
| **02. රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යනය** | |
| 2.1 සමාලෝචනය | 23 |
| 2.2 රාජ්‍ය ආදායම | 26 |
| 2.3 රජයේ වියදම | 39 |
| 2.4 භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය | 42 |
| 2.5 රාජ්‍ය ණය කළමනාකරණය | 43 |
| 2.6 විදේශ මූල්‍යනය | 43 |
| **03. ආර්ථික උපනතීන්** | |
| 3.1 සමාලෝචනය | 49 |
| 3.2 ආර්ථික වර්ධනය | 50 |
| 3.3 මුදල් අංශයේ වර්ධනයන් | 59 |
| 3.4 කොටස් වෙළෙඳපොළ | 63 |
| 3.5 විදේශ අංශයේ වර්ධනයන් | 63 |
| 3.6 ලෝක ආර්ථිකයේ ඉදිරි දැක්ම | 67 |
| **04. රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය** | |
| 4.1 සමාලෝචනය | 73 |
| 4.2 රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය | 73 |
| **05. 2026 අයවැය සැකසීම සඳහා යොදාගත් පදනම** | |
| 5.1 සමාලෝචනය | 85 |
| 5.2 දළ දේශීය නිෂ්පාදිතය | 85 |
| 5.3 පාරිභෝගික මිල ගණන් | 85 |
| 5.4 සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය | 85 |
| 5.5 විදේශ අංශය | 86 |
| 5.6 මුදල් සමස්තයන් | 86 |
| 5.7 ආදායම | 86 |
| 5.8 වියදම | 86 |
| 5.9 ණය ගැනීම් | 87 |
| 5.10 ඇස්තමේන්තුවල සංවේදීතාව | 87 |

පිටු
අංකය

## වගු


| | | |
|---|---|---|
| **I කොටස** | | |
| 1.1 වගුව | මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව 2025-2030 | 16 |
| **II කොටස** | | |
| 2.1 වගුව | රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය | 23 |
| 2.2 වගුව | ඇස්තමේන්තු හා තත්‍ය ආදායම සහ වියදම : 2025 | 25 |
| 2.3 වගුව | රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය | 28 |
| 2.4 වගුව | ආදායම් බදු කාර්යසාධනය | 29 |
| 2.5 වගුව | එකතු කළ අගය මත බදු කාර්යසාධනය | 30 |
| 2.6 වගුව | නිෂ්පාදන බදු/ සුරාබදු කාර්යසාධනය | 30 |
| 2.7 වගුව | මෝටර් රථ වාහන ආනයන | 32 |
| 2.8 වගුව | නිදහස් වෙළඳ ගිවිසුම් මඟින් ආවරණය වන තීරු බදු සහන යටතේ ආනයනය අපනයනය කරන ලද භාණ්ඩ හා වටිනාකම | 32 |
| 2.9 වගුව | ජාත්‍යන්තර වෙළඳාමෙන් ලද සෙස් බදු ආදායම | 32 |
| 2.10 වගුව | රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය | 33 |
| 2.11 වගුව | රාජ්‍ය වියදම් කාර්යසාධනය | 39 |
| 2.12 වගුව | රජයේ සුරැකුම්පත් මත ගෙවන පොළී අනුපාතයන්හි විනිමය අනුපාතයන්හි හැසිරීම (2024-2025) | 40 |
| 2.13 වගුව | සුභසාධන වැඩසටහන් සඳහා වියදම් | 41 |
| 2.14 වගුව | රජයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ (2025 ජන. - අගෝ.) | 42 |
| 2.15 වගුව | දළ දේශීය ණය මූලාශ්‍ර (2025 ජන. - අගෝ.) | 43 |
| 2.16 වගුව | 2025 ජනවාරි මස 01 සිට අගෝස්තු මස 31 දක්වා විදේශ මූල්‍යාන ප්‍රතිලබ්ධි ප්‍රමාණය | 44 |
| 3.1 වගුව | ස්ථාවර (2015) මිල ගණන් අනුව ද. දේ. නි. යෙහි ආංශික සංයුතිය | 51 |
| 3.2 වගුව | සේවා අංශයේ තෝරාගත් දර්ශකයන් | 57 |
| 3.3 වගුව | සංචාරක අංශයේ කාර්යසාධනය | 59 |
| 3.4 වගුව | දළ දේශීය නිෂ්පාදිත වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%) | 60 |
| 3.5 වගුව | පාරිභෝගික මිල උද්ධමනය (පාදක වර්ෂය 2021=100) | 62 |
| 3.6 වගුව | ප්‍රාග්ධන වෙළඳපොල වෙනස්වීම | 63 |
| 3.7 වගුව | විදේශීය වෙළඳාම | 67 |
| 3.8 වගුව | තෝරාගත් රටවල ප්‍රධාන ආර්ථික දර්ශක - 2025 (පුරෝකථනය) | 69 |
| 4.1 වගුව | විදුලි උත්පාදන සහ ධාරිතාවයෙහි සංයුතිය | 75 |
| 4.2 වගුව | ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන් 52 හි බදු පෙර ලාභය | 78 |
| 4.3 වගුව | රාජ්‍ය ව්‍යවසායන් වෙතින් ලද අයබදු ආදායම/ ලාභාංශ ආදායම | 80 |


## රූපසටහන්


| | | |
|---|---|---|
| **I කොටස** | | |
| 1.1 රූපසටහන | පොලී ගෙවීම් මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 6 |
| 1.2 රූපසටහන | රාජ්‍ය මූල්‍ය සමස්තයන් 2022-2024 | 12 |

| | | පිටු අංකය |
|---|---|---|
| | **II කොටස** | |


| | | |
|---|---|---|
| 2.1 රූපසටහන | මුළු ආදායම් සංයුතිය (2025 ජනවාරි - අගෝස්තු) | 27 |
| 2.2 රූපසටහන | මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම (2025 ජනවාරි - අගෝස්තු) | 28 |
| 2.3 රූපසටහන | නිෂ්පාදන බදු / සුරාබදු කාර්යසාධනය - (2025 ජනවාරි - අගෝස්තු) | 31 |
| 2.4 රූපසටහන | 2025 ජනවාරි 01 සිට අගෝස්තු මස 31 දක්වා සිදුවූ ප්‍රතිලබ්ධි සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ. ඩො. මිලියන) | 44 |
| 2.5 රූපසටහන | 2025 ජනවාරි සිට අගෝස්තු දක්වා සිදුවූ ප්‍රතිලබ්ධි ප්‍රධාන අංශ අනුව (ඇ. ඩො. මිලියන) | 45 |
| 3.1 රූපසටහන | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය | 49 |
| 3.2 රූපසටහන | දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය - 2025 පළමු භාගය | 49 |
| 3.3 රූපසටහන | කෘෂිකාර්මික අංශයේ සංයුතිය - 2025 පළමු භාගය | 53 |
| 3.4 රූපසටහන | කර්මාන්ත අංශයේ සංයුතිය - 2025 පළමු භාගය | 55 |
| 3.5 රූපසටහන | නිෂ්පාදන අංශයේ සංයුතිය - 2025 පළමු භාගය | 56 |
| 3.6 රූපසටහන | සේවා අංශයේ සංයුතිය - 2025 පළමු භාගය | 56 |
| 3.7 රූපසටහන | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය සහ සේවා වියුක්තිය | 59 |
| 3.8 රූපසටහන | පොලී අනුපාත, මුදල් සමස්තයන්, මුදල් සැපයුම හා පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය | 61 |
| 3.9 රූපසටහන | මතුපිට, මූලික සහ ආහාර උද්ධමනයේ විචලතා | 62 |
| 3.10 රූපසටහන | වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස්වීම් | 64 |
| 3.11 රූපසටහන | අපනයන සංයුතිය | 65 |
| 3.12 රූපසටහන | ආනයන සංයුතිය | 66 |


| | **සටහන්** | |
|---|---|---|


| | | |
|---|---|---|
| 1.1 සටහන | ශ්‍රී ලංකාවේ වෙනස් වන වයස් ව්‍යුහයෙහි සහ වර්ධනය වන යැපීම් අනුපාතයෙහි ආර්ථික බලපෑම | 8 |
| 2.1 සටහන | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග (2025 ජනවාරි - සැප්තැම්බර්) | 35 |


| | **ඇමුණුම්** | |
|---|---|---|


| | | |
|---|---|---|
| ඇමුණුම I | 2025.08.31 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කළ භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපි හිඟ වටිනාකම් ලැයිස්තුව | 89 |
| ඇමුණුම II | සාර්ව ආර්ථික දර්ශක | 92 |
| ඇමුණුම III | 2026 ආදායම් ඇස්තමේන්තු සඳහා පාදක වූ උපකල්පන | 100 |

**මූලික ආර්ථික දර්ශක**

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකක | වටිනාකම 2024 | 2025 |
|---|---|---|---|---|
| **මූර්ත අංශය** | | | | |
| ආර්ථික වර්ධනය | පළමු භාගය | % | 4.6 | 4.8 |
| කෘෂිකර්මාන්ත | පළමු භාගය | % | 1.8 | 0.6 |
| කර්මාන්ත | පළමු භාගය | % | 10.5 | 7.9 |
| සේවා | පළමු භාගය | % | 2.3 | 3.3 |
| උද්ධමනය ( වාර්ෂික ලක්ෂ්‍යමය)-කො.පා.මි.ද. (2021=100) | සැප්තැම්බර් අවසන | % | -0.5 | 1.5 |
| උද්ධමනය (සාමාන්‍ය)-කො.පා.මි.ද. (2021=100) | සැප්තැම්බර් අවසන | % | 2.4 | -1.4 |
| සේවා වියුක්ති අනුපාතය | පළමු කාර්තුව | % | 4.5 | 3.8 |
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය | පළමු කාර්තුව | % | 47.1 | 49.7 |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| අයවැය හිඟය | ජන-අගෝ. | රු.බිලි. | 911 | 411 |
| මුළු ආදායම | ජන-අගෝ. | රු.බිලි. | 2,558 | 3,295 |
| බදු ආදායම | ජන-අගෝ. | රු.බිලි. | 2,349 | 3,068 |
| බදු නොවන ආදායම | ජන-අගෝ. | රු.බිලි. | 209 | 226 |
| මුළු වියදම | ජන-අගෝ. | රු.බිලි. | 3,477 | 3,712 |
| වර්තන වියදම් | ජන-අගෝ. | රු.බිලි. | 3,042 | 3,381 |
| රාජ්‍ය ආයෝජන | ජන-අගෝ. | රු.බිලි. | 455 | 339 |
| රාජ්‍ය ණය | සැප්තැම්බර් අවසන | රු.බිලි. | 28,563 | 29,635 |
| **විදේශ අංශය** | | | | |
| **අපනයන** | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 8,506 | 9,077 |
| කෘෂි අපනයන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 1,804 | 2,030 |
| කාර්මික අපනයන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 6,666 | 7,015 |
| රෙදිපිළි හා ඇගළුම් | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 3,365 | 3,595 |
| අනෙකුත් | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 3,301 | 3,420 |
| ආනයන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 12,073 | 13,341 |
| පාරිභෝගික භාණ්ඩ | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,176 | 3,295 |
| අන්තර් භාණ්ඩ | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 7,750 | 7,437 |
| එයින් ඛනිජ තෙල් නිෂ්පාදන | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,897 | 2,521 |
| ආයෝජන භාණ්ඩ | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,140 | 2,597 |
| වෙළඳ ශේෂය | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | -3,566 | -4,264 |
| සංචාරක පැමිණීම් | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 1,362,668 | 1,566,523 |
| සංචාරක ඉපයීම් | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,167 | 2,290 |
| ශ්‍රමික ප්‍රේෂණ | ජන-අගෝ. | ඇ.ඩො.මිලි. | 4,288 | 5,116 |
| කළඹ ආයෝජනය (ශුද්ධ) | ජූනි අවසන | ඇ.ඩො.මිලි. | -26 | 557 |
| සමස්ත ගෙවුම් ශේෂය(BOP) | ජන-ජූනි | ඇ.ඩො.මිලි. | 1,761 | 522 |
| දළ නිල සංචිත | අගෝස්තු අවසන | ඇ.ඩො.මිලි. | 5,654 | 6,178 |
| විනිමය අනුපාතය (මාසය අග) | සැප්තැම්බර් අවසන | ඇ.ඩො./රු | 299.36 | 302.61 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍ය ) | ජන-සැප්. | ඇ.ඩො./රු | 301.15 | 302.20 |
| **මූල්‍ය අංශය** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | අගෝස්තු අවසන | % | 8.25 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | අගෝස්තු අවසන | % | 9.25 | 8.25 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සැප්තැම්බර් අවසන | % | 2.00 | 2.00 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (සතිපතා) | අගෝස්තු අවසන | % | 9.13 | 8.10 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 91) | අගෝස්තු අවසන | % | 9.49 | 7.58 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 364) | අගෝස්තු අවසන | % | 10.01 | 8.03 |
| මුදල් සැපයුම් වර්ධනය($M_{2b}$) | 2024 අගෝ./2025 අගෝ. | % | 9.3 | 10.7 |
| පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය | 2024 අගෝ./2025 අගෝ. | % | 8.7 | 20.5 |

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ඉදිරිපත් කළ යුතු වාර්තා

| වගන්තිය | අවශ්‍යතාවය | අරමුණ | අනුකූලතා ක්‍රමවේදය |
|---|---|---|---|
| 11 වන වගන්තිය | මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ11(4) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි වාර්ෂික අයවැය පිළියෙල කිරීමට පෙර ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ විධිමත් ප්‍රකාශයක් පාර්ලිමේන්තුව වෙත සහ මහජනතාව වෙත ඉදිරිපත් කිරීම, එළඹෙන වර්ෂයට අදාළ වාර්ෂික අයවැය සඳහා උපායමාර්ගික මාර්ගෝපදේශ සැපයීම, මූල්‍ය කාර්යසාධනය වාස්තවික ලෙස ඇගයීමේ පදනම පිහිටුවීම, ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපායෙහි කාර්යසාධනය පිළිබඳව වන පාර්ලිමේන්තුවේ අධීක්ෂණය ශක්තිමත් කිරීම සහ මූල්‍ය විනිවිදභාවය සහ වගවීම වැඩි කිරීම. | අමාත්‍යය මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් පසු, එක් එක් වර්ෂයේ ජූනි මස තිස්වන දින හෝ එදිනට පෙර මුදල් අමාත්‍යවරයා විසින් මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය පාර්ලිමේන්තුවේ දී නිවේදනය කළ යුතු ය. මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය. |
| 49 වන වගන්තිය | අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49(2) වගන්තිය යටතේ දක්වා ඇති කරුණු ඇතුළුව මූල්‍ය සහ ආර්ථික තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කෙරෙන ආණ්ඩුවේ සියලුම තීරණ හා වෙනත් සියලු පරිවේෂණ සැලකිල්ලට ගෙන තොරතුරු සැපයීම | සෑම වර්ෂයක දී ම විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දෙවන වර කියවීම සඳහා නියම කර ඇති දිනයේ දී, පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට මුදල් අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු ය. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු වාර්තාව මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය. |
| 50 වන වගන්තිය | වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 50(2) වගන්තිය යටතේ දක්වා ඇති කරුණු ඇතුළුව ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය හා සසඳමින් ආණ්ඩුවේ වර්ෂය මැද මූල්‍ය කාර්යසාධනය ඇගයීමේ පදනමක් වශයෙන් යොදා ගැනීම | අදාළ වර්ෂයේ ඔක්තෝබර් මස අවසාන දින හෝ අදාල වර්ෂයේ විසර්ජන පනත සම්මත කර මාස දහයක් ගතවීම හෝ යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ දී මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළකරනු ලැබිය යුතු ය; එමෙන්ම, වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් වේනම්, ඒ වාර්තාව නිකුත් කරන ලද දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය; හෝ වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් නොවන්නේ නම්, පාර්ලිමේන්තුව ඊළඟට රැස්වන දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය |

| වගන්තිය | අවශ්‍යතාවය | අරමුණ | අනුකූලතා ක්‍රමවේදය |
|---|---|---|---|
| 51 වන වගන්තිය | අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම (වාර්ෂික වාර්තාව) * | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 51(2) වගන්තිය යටතේ දක්වා ඇති කරුණු ඇතුළුව අදාළ මුදල් වර්ෂය සඳහා වන ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය හා සසඳමින් ආණ්ඩුවේ වාර්ෂික මූල්‍ය කාර්යසාධනය ඇගයීමේ පදනමක් වශයෙන් යොදා ගැනීම. | මුදල් වර්ෂය අවසාන වී මාස හයක් ගතවීමට පෙර මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.; එමෙන්ම වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් වේ නම්, වාර්තාව නිකුත් කරන ලද දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය; හෝ වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් නොවන්නේ නම් ඊළඟට රැස්වන දින සිට සති දෙකක් තුළ දී එම වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය |
| 52 වන වගන්තිය | මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම** | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 52(2) වගන්තිය යටතේ දක්වා ඇති කරුණු ඇතුළුව රටේ මූල්‍ය තත්ත්වය පිළිබඳ යාවත්කාලීන තොරතුරු මහජනයා වෙත නිකුත් කිරීම. | පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීම සඳහා මහ මැතිවරණයක් පැවැත්වීමට නියම කරමින් ප්‍රකාශනයක් හෝ ආඥාවක් ප්‍රසිද්ධ කර සති තුනක් ඇතුළත දී නිකුත් කිරීමට කටයුතු යෙදිය යුතු ය; එමෙන්ම, නව පාර්ලිමේන්තුව පළමුවරට රැස් වූ දින සිට සති දෙකක් ඇතුළත වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු අතර මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ ද පළ කරනු ලැබිය යුතු ය. මෙම වාර්තාව පිළියෙල කිරීමට භාණ්ඩාගාරයේ ලේකම්වරයාට හැකි වනු පිණිස, මුදල් අමාත්‍යවරයා විසින් ඔහුගේ දැනීම අනුව, සැලකිය යුතු ප්‍රමාණයකට මූල්‍යමය හෝ ආර්ථිකමය බලපෑමක් ඇති කරවන්නා වූ හෝ ඇති කිරීමට ඉඩ ඇති ආණ්ඩුවේ තීරණ සහ වෙනත් පරිවේෂණ භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත අනාවරණය කරනු ලැබිය යුතු ය. |
| 53 වන වගන්තිය | මුදල් අමාත්‍යයවරයාගේ අමාත්‍යාංශයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම* | රජයේ ආදායම් හා වියදම් ඇතුළු මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම. | අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර එම ප්‍රකාශය එක් එක් කාර්තුව අවසානයේ දින හතළිස්පහකට නොඅඩු දිනයක දී, නියම කරනු ලැබ ඇති ආකාරයට මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ සමගාමීව පළ කරනු ලැබිය යුතු ය. |

** මුදල් ඇමතිවරයා විසින්*

*** භාණ්ඩාගාර ලේකම් විසින්*

# අනුකූලතාවය – 2025

- **අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2025**

  2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 51(1) වගන්තියට අනුව 2025 වසරේ ජුනි මස තිස්වන දින මුදල් අමාත්‍යවරයා විසින් මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ ආමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ කොටසක් වශයෙන් අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව මහජනයා වෙත නිකුත් කරන ලදී.

- **මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - 2026**

  2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11(3) වගන්තියට අනුව 2025 වසරේ ජුනි මස තිස්වන දින මුදල් අමාත්‍යවරයා විසින් මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය පාර්ලිමේන්තුවේ නිවේදනය කරන ලදී. මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මුදල් අමාත්‍යවරයා විසින් නිවේදනය කිරීමෙන් අනතුරුව මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරන ලදී.

- **වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව – 2025**

  වසරේ පළමු මාස හයෙහි මූල්‍ය හා ආර්ථික තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් 2025 ඔක්තෝබර් මස 31 දින වන විට මහජනතාව වෙත ඉදිරිපත් කරන ලද අතර 2025 වසරේ නොවැම්බර් මස 07 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

- **අයවැය ආර්ථිකය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව – 2026**

  මෙම වාර්තාවට දළ දේශීය නිෂ්පාදිතය, පාරිභෝගික මිල ගණන්, රැකියාව සහ විරැකියාව, ගෙවුම් ශේෂය, ආදායම් හා වියදම් සහ ආණ්ඩුව විසින් ගනු ලබන ණය සම්බන්ධ ඇස්තමේන්තු, ඉහත සඳහන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී උපයෝගී කරගනු ලැබූ පදනම්, එම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී උපයෝගී කරගනු ලැබූ ආර්ථික හෝ වෙනත් පදනමක් සම්බන්ධයෙන් සිදුවිය හැකි වෙනස්වීම් සහ ඇස්තමේන්තුවල සංවේදීතාවයට අදාළ ප්‍රකාශයක්, මූල්‍ය තත්ත්වය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කළ හැකි අවදානම්, ප්‍රායෝගික වශයෙන් හැකිතාක් දුරට ප්‍රමාණාත්මක කළ ප්‍රකාශයක් ඇතුළු තවත් තොරතුරු ඇතුලත් වන අතර 2025 වසරේ නොවැම්බර් මස 07 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

## අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2026

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විතය : I කොටස මඟින් මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය දැක්වේ. II කොටස මඟින් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49(2) වගන්තියේ ඇති කරුණු ද ඇතුළත්ව මූල්‍ය හා ආර්ථික තත්ත්වය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් කෙරෙන ආණ්ඩුවේ සියලුම තීරණ සහ වෙනත් සියලු පරිවේෂණ දැක්වේ.

# I කොටස

# මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය | 01

## 1.1 සමාලෝචනය

රජය විසින් ක්‍රියාත්මක කරන ලද තීරණාත්මක හා දූරදර්ශී ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හේතුවෙන්, සාර්ව ආර්ථික දර්ශක මඟින් සනාථ කරන පරිදි, 2025 වසරේ පළමු මාස අට තුළ දී සාර්ව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් විය. 2025 වසරේ පළමු භාගයේ දී ආර්ථිකය දළ දේශීය නිෂ්පාදිතයෙන් (ද.දේ.නි. යෙන්) සියයට 4.8 කින් ප්‍රසාරණය විය. මාස එකොළහක අවධමනයකින් අනතුරුව 2025 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී උද්ධමනය ධන අගයකට පත් විය. එක්සත් ජනපද තීරුබදු ප්‍රතිපත්තීන්හි අවිනිශ්චිතතාවයන් සහ භූ දේශපාලනික ආතතීන් මධ්‍යයේ වුව ද විදේශ අංශය මනා ඔරොත්තු දීමේ හැකියාවෙන් යුක්ත විය. දළ නිළ සංචිත 2025 වසරේ සැප්තැම්බර් මස අවසන් වන විට ඇමරිකානු ඩොලර් (ඇ.ඩො) බිලියන 6.2 ක් විය. දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බදු එකතු කිරීම්, ආදායම් බදු සහ විශේෂයෙන් මෝටර් රථ සඳහා වන බදු මගින් ලද ඉහළ දායකත්වය හේතුවෙන් ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම ප්‍රාථමික අතිරික්තයත් සමඟ 2025 වසරේ දී බදු ආදායම ද.දේ.නි යට දක්වන අනුපාතය සියයට 14.8 දක්වා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පුරෝකථනය කර ඇති සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්ත ඉලක්කයටත් වඩා වැඩි අගයක් වාර්තා කිරීම, ණය සේවාකරණ පිරිවැය අඩු කිරීමටත් කාලයත් සමඟ ණය ප්‍රමාණයෙහි වෙනස් වීම වැඩිදියුණු කිරීමටත් පිටිවහලක් වී ඇත. ණය තිරසාරභාවය ළඟා කර ගැනීමට හැකිවන පරිදි ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය බොහෝ දුරට අවසන් වී ඇත. වේගවත් ලෙස ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමට මෙන්ම ස්ථාවරත්වය ළඟා කර ගැනීම සඳහා සහාය වන වඩාත් පුරෝකථනය කළ හැකි ප්‍රතිපත්තිමය පරිසරයක් සහතික කරමින් රජයේ පුළුල් දූෂණ විරෝධී ක්‍රියාමාර්ගය තුළින් විනිවිදභාවය සහ වගවීම ඉහළ නංවා ඇත.

2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී බලයට පත්වීමෙන් පසු, වසරක් ඇතුළත ශ්‍රී ලංකාවේ ආර්ථිකය, දේශපාලනික සහ පාලන ව්‍යුහයන් නව්‍යතාවයට පත් කිරීමේ දී රජය කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ගෙන ඇත. කඩිනම් ප්‍රතිසංස්කරණ සඳහා වන දැඩි කැපවීම හේතුවෙන්, එම කැපවීම් පුරවැසියන්ගේ සහ ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන්ගේ අපේක්ෂාවන් ළඟා කර ගත්තා පමණක් නොව බොහෝ අවස්ථාවන්හි දී එම අපේක්ෂාවන් ඉක්මවා ගොස් ද ඇත. රජයේ මෙම පෙර නොවූ විරූ කැපවීම මඟින් ශ්‍රී ලංකා ආර්ථිකයේ වටපිටාව කෙටි කාලයක් තුළ නව දේශපාලන හා ආර්ථික ආකෘතියක් බවට සැළකිය යුතු ලෙස පරිවර්තනයකට ලක්වී ඇත. එබැවින්, ආර්ථිකයේ සියලුම කොටස්කරුවන් මෙම ප්‍රතිසංස්කරණවල ප්‍රතිලාභ වර්තමානයේ දී නෙළා ගනිමින් සිටින අතර, ඒවා මධ්‍ය කාලීනව සහ දිගු කාලීනව බොහෝ සෙයින් ඵල දරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ආර්ථික වර්ධනයට සහ සමෘද්ධියට ප්‍රධාන බාධකයක් ලෙස හඳුනාගෙන ඇති දූෂණ අවදානම් අවම කිරීම සඳහා රජය සම්පූර්ණයෙන්ම කැපවී සිටියි. දැනට පවතින අධ්‍යන වලට අනුව, දූෂණ අවදානම් අඩු කිරීම ආර්ථික වර්ධනයට ධනාත්මක බලපෑමක් ඇති කරන බව පෙන්වා දී ඇත. එබැවින්, රාජ්‍ය මූල්‍ය පාලනය, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම (AML/CFT), රාජ්‍ය දූෂණ විරෝධී පියවර සහ නීතියේ ආධිපත්‍යය යන ක්ෂේත්‍රවල විනිවිදභාවය සහ වගවීම තහවුරු කිරීම සඳහා රජය පුළුල් ප්‍රතිසංස්කරණ මාලාවක් ආරම්භ කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් කරන ලද පාලනය පිළිබඳව වූ විනිශ්චයාත්මක ඇගයීම මඟින් ඉදිරිපත් කරන ලද ප්‍රධාන නිර්දේශ බොහොමයක් රජය සම්පූර්ණ කර ඇත. එසේ ආරම්භ කරන ලද පාලන ප්‍රතිසංස්කරණ මඟින් ශ්‍රී ලංකාවේ ආදායම් ව්‍යාප්තිය සහ ණය කාලයත් සමඟ විකාශනය වූ ආකාරය වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රතිසංස්කරණ මගින් රාජ්‍ය මූල්‍ය පාලනය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට (CIABOC) සාමාජිකයින් පත් කිරීම සඳහා කුසලතා මත පදනම් වූ සහ ස්වාධීන ක්‍රියාවලියක්, ඵලදායී හා ජනතාවට ප්‍රවේශ විය හැකි වත්කම් ප්‍රකාශන පද්ධතියක් සහ විනිවිද පෙනෙන ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සැකසීම යන කරුණු ආවරණය කෙරේ. වත්කම් ප්‍රකාශන සඳහා ජනතාවට ප්‍රවේශ විය හැකි බව, වත්කම් ගොනු නොකරන පුද්ගලයන් ප්‍රකාශයට පත් කිරීම, හෙළිදරව් කිරීමේ අවශ්‍යතා පුළුල් කිරීම සහ වඩාත් විනිවිද පෙනෙන ගිණුම් සහ වත්කම් පිළිබඳ තොරතුරු සැපයීම සඳහා වත්කම් ප්‍රකාශන පද්ධතිය වැඩිදියුණු කර ඇත. 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත මඟින් අපරාධ මඟින් උපයාගත් වත්කම් අත්හිටුවීමට, රාජසන්තක කිරීමට සහ කළමනාකරණය කිරීමට බලධාරීන්ට බලය ලබා දී ඇත. ජාතික දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම (NACAP) 2025-2029 මඟින් දූෂණ වැළැක්වීමේ, අධ්‍යාපනික සහ නීතිමය ප්‍රතිසංස්කරණ ගෙනහැර දක්වන අතර, CIABOC හි ස්වාධීනත්වය ශක්තිමත් කර ඇත. පාලන ප්‍රතිසංස්කරණවල කල් පවතින සාර්ථකත්වය සඳහා ඉහළ දේශපාලන සහයෝගය ලැබීමත් සමඟ, අපේක්ෂිත ප්‍රතිලාභ මධ්‍ය කාලීනව සහ දිගු කාලීනව තිරසාරව පවතිනු ඇත.

ප්‍රතිසංස්කරණවල බලපෑම හේතුවෙන් අවදානමට ලක්විය හැකි ජනගහනය මත පැටවෙන පීඩනය අඩු කිරීම සඳහා ඉලක්කගත සමාජ ආධාරක පියවරයන් සමඟ පුළුල් රාජ්‍ය මූල්‍ය හා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කර ඇත. රජය අඩු

ආදායම්ලාභී පවුල් සඳහා අස්වැසුම ගෙවීම් වැඩි කිරීමත් වැඩිහිටි හා වකුගඩු රෝගීන් සඳහා දීමනා වැඩි කිරීමත් සිදු කළ අතර එවැනි පවුල්වල පාසල් දරුවන් සඳහා ලිපි ද්‍රව්‍ය දීමනා ද ලබා දෙන ලදී. මෙම ඉලක්කගත ආධාර වැඩි කිරීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම (IMF-EFF) යටතේ සමාජ වියදම් සඳහා වූ ඉලක්කය ප්‍රථම වරට සපුරාගැනීමට උපකාරී වූ අතර, 2025 වසරේ මාර්තු මස අවසානයේ දී ළඟා කරගත යුතුව පැවති ඉලක්කය සපුරා ගත් අතර 2025 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී ළඟා වීමට නියමිත ඉලක්කය වෙත ද නිසි පරිදි ළඟා වීමට හැකිවනු ඇත. එවැනි සමාජ සුබසාධන වියදම් 2025 වසරේ අවසානය වන විට රු. බිලියන 230 ක් හෙවත් ද.දේ.නි. යෙන් සියයට 0.7 ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2026 වසරේ මැයි මාසය වන විට සම්පූර්ණ කිරීමට ඉලක්ක කර ඇති ප්‍රතිලාභීන් නැවත තහවුරු කිරීම අඛණ්ඩව සිදු කිරීම, විනිවිදභාවය තවදුරටත් වැඩිදියුණු කිරීම, කිහිපවරක් ලියාපදිංචිය වැළැක්වීම සහ ප්‍රතිලාභ වඩාත් අවශ්‍යතා ඇති අයට ළඟා වන බව ද සහතික කරනු ඇත. මේ අතර, මානව ප්‍රාග්ධන සංවර්ධනය කෙරෙහි දැඩි අවධානයක් පිළිබිඹු කරමින් සිසුන්ට සහාය වීම සඳහා මහපොළ ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර වැඩි කරන ලදී. ප්‍රතිසංස්කරණ වැඩසටහනෙහි සමාජ ආරක්ෂණය ප්‍රධාන අරමුණක් ලෙස පවතින අතර, ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය සුභසාධනය සැපයීම සඳහා දිගුකාලීන, ඒකාබද්ධ රාමුවක් සපයනු ඇත. අවදානමට ලක්විය හැකි ජනගහනයේ ජීවනෝපායන් නඟා සිටුවීම සඳහා රජයේ ප්‍රයත්නයට අනුකූලව, විශ්‍රාම වැටුප්, අස්වැසුම, පොහොර, ඖෂධ ඇතුළු සියලුම ගෘහ සහනාධාර ඇතුළුව මුළු සුභසාධන වියදම් 2024 වසරේ පළමු මාස නවය තුළ වූ රු. බිලියන 629.8 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළදී රු. බිලියන 731.7 දක්වා සියයට 16.2 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.

**1.1 රූපසටහන : පොලී ගෙවීම් මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස**




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා වූ ප්‍රයත්නයන් ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල ළඟා කරගෙන ඇත. මුළු ආදායමේ කොටසක් ලෙස පොලී ගෙවීම් 2022 වසරේ දී වූ සියයට 79.1 සිට 2024 වසරේ දී සියයට 66.7 දක්වා පහත වැටී ඇති අතර, 2030 වසර වන විට සියයට 42 ක් දක්වා ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෙම වර්ධනය ආදායම් ඉහළ නැංවීම සඳහා වන දැඩි ප්‍රයත්නයක් සහ නිසි පරිදි වියදම් කළමනාකරණයේ බලපෑම පිළිබිඹු කරයි. මධ්‍යම රජයේ ණය ද.දේ.නි යේ ප්‍රතිශතයක් ලෙස 2022 වසරේ දී වූ සියයට 114.2 සිට 2024 වසරේ දී සියයට 100.8 දක්වා අඩු වීම සඳහා ප්‍රාථමික අතිරික්තය ක්‍රමයෙන් වර්ධනය වීම ඉවහල් වූ සහාය වන අතර, 2030 වසර වන විට මධ්‍යම රජයේ ණය ද. දේ. නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 87.0 ක් පමණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ජයග්‍රහණ මගින් විදේශ ශේෂයන් ශක්තිමත් කිරීම, ජංගම ගිණුමෙහි තත්ත්වය වැඩිදියුණු කිරීම, දේශීය ණය පීඩනය ලිහිල් කිරීම සහ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය පිළිබඳ විශ්වාසය යථා තත්ත්වයට පත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. විනිවිදභාවයෙන් යුතු ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සහ සාර්ව ආර්ථික ස්ථායිතා ක්‍රියාමාර්ග මගින් ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් ඉහළ නංවා, ණය ලැබීම සඳහා වන සුදුසුකම් වැඩිදියුණු කර, ආයෝජක විශ්වාසය ශක්තිමත් කර ඇත.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණය, සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය (SVAT) අවලංගු කිරීම, අපනයනකරුවන් සඳහා එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ ඉහළ වත්කම් සහිත පුද්ගලයින්ගේ අවදානම් මත පදනම් වූ විගණනය වැඩිදියුණු කිරීම වැනි අඛණ්ඩ ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ මගින් බදු අනුකූලතාව සහ සාධාරණත්වය වැඩිදියුණු කරනු ඇතැයි අපේක්ෂා කරන අතරම බදු පැහැර හැරීම් ද වළක්වනු ලබයි. ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලනය ඩිජිටල්කරණය කිරීම මගින් බදු අනුකූලතාව ඉහළ නංවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඊට අමතරව, රජය විසින් 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරී පනත ක්‍රියාත්මක කර ඇති අතර, එමගින් සූදු ක්‍රියාකාරකම් නියාමනය කිරීම, ආදායම් රැස් කිරීම ශක්තිමත් කිරීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇති අතර එය වගකිවයුතු සහ සාධාරණ සූදු පිළිවෙත් තුළින් සංචාරක ව්‍යාපාරයට, රැකියා අවස්ථා උත්පාදනයට සහ ආර්ථික සංවර්ධනයට සහාය වනු ඇත.

රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීම සහ රාජ්‍ය වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් පාලන ප්‍රතිසංස්කරණ සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. නව රාජ්‍ය ව්‍යවසාය නීතිය මගින් අධීක්ෂණය ශක්තිමත් කිරීම, විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ වගවීම වැඩි දියුණු කරනු ඇත. රාජ්‍ය ව්‍යවසායයන් 36 ක් සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කරන ලද අතර, ඉතිරි ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් ජූනි මස අවසානය වන විට වාර්ෂිකව

ඔවුන්ගේ විගණනය කරන ලද ප්‍රකාශ ප්‍රකාශයට පත් කිරීමට බැඳී සිටිති. ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්ගේ බලතල ආයතනික අභිප්‍රාය ප්‍රකාශන හරහා පැහැදිලි කෙරෙන අතර, ප්‍රධාන කාර්යසාධන දර්ශක මත පදනම්ව තෘප්තිමත් විය හැකි ප්‍රතිඵල ලබා දීම සඳහා ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩල වගකිව යුතුය. බලශක්ති අංශයේ ප්‍රතිසංස්කරණ අතරට පිරිවැය-නිරූපිත විදුලි මිලකරණය, ලංකා විදුලිබල මණ්ඩලය කොටස්කර විසුරුවා හැරීම, ශක්තිමත් කරන ලද නියාමන අධීක්ෂණය සහ ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ශ්‍රීලංකන් ගුවන් සමාගමේ දිගුකාලීන ණය ක්‍රමයෙන් පියවීම ඇතුළත් වේ. රජය සතු බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලවල සාමාජිකයින් නව දෙනෙකුගේ සිට දහතුන දක්වා සංඛ්‍යාවක් සිටින බවත්, ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයක් සිටින බවත් තහවුරු කිරීමට ද පියවර ගන්නා ලදී.

රාජ්‍ය ප්‍රසම්පාදන නීතිය සහ රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත් කෙටුම්පත් මගින් ප්‍රසම්පාදනය සහ වත්කම් වෙන් කිරීම නවීකරණය කිරීමත්, අකාර්යක්ෂමතාව සහ දූෂණය අවම කිරීමත් අපේක්ෂා කෙරේ. 2025 අංක 12 දරන සමාගම් (සංශෝධන) පනත මගින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව, ආයතනික විනිවිදභාවය සහ අනුකූලතාව වැඩිදියුණු කරමින්, වාසිදායක හිමිකාරිත්ව රාමුවක් හඳුන්වා දෙන ලදී.

චීනය, ඉන්දියාව, ජපානය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමඟ ක්‍රමෝපායික හවුල්කාරිත්වයන් කෙරෙහි අවධානය යොමු කරමින්, ඉදිරි වසර තුළ ඇ. ඩො. බිලියන 2 ක පමණ ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම රජයේ අරමුණ වේ. සංශෝධිත ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති සහ වරාය නගර පනත් යටතේ විනිවිදභාවයකින්, රීති මත පදනම් වූ යාන්ත්‍රණ හරහා ආයෝජන දිරිගැන්වීම් ලබා දීමට අපේක්ෂා කෙරේ. ජාතික අපනයන උපායමාර්ගය සහ අඛණ්ඩ නිදහස් වෙළඳ සාකච්ඡා සමඟ ඒකාබද්ධව, තීරුබදු නොවන ආනයන මත වන අනෙකුත් බදු තාර්කිකකරණය, රේගු නවීකරණය සහ අපනයන විවිධාංගීකරණය ඇතුළු වෙළඳ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හරහා, ශ්‍රී ලංකාව කලාපීය සහ ගෝලීය වෙළඳපොළවල් සමඟ ඒකාබද්ධ වීම වර්ධනය කරනු ඇත.

ඩිජිටල් ආර්ථිකය ප්‍රවර්ධනයේ දී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර, ඒ අතරට GovPay, ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය, පාසල් පොත් සහ පොහොර සඳහා ඩිජිටල් වවුචර් නිකුත් කිරීම සහ තානාපති කාර්යාල හරහා පුරවැසි ලේඛන සඳහා මාර්ගගත ප්‍රවේශය සැලසීම වැනි මූලාරම්භයන් ඇතුළත් වේ. 5G තාක්ෂණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම, නවෝත්පාදනයන් වේගවත් කිරීම සහ උසස් ඩිජිටල් සේවාවන් නිර්මාණය කිරීමට හැකියාව ලබා දෙනු ඇත. සියලුම පුරවැසියන් සඳහා සේවා සඳහා ප්‍රවේශයට ඇති හැකියාව සහ වර්ධනයට ඇති අවස්ථා වැඩිදියුණු කරමින්, සම්පූර්ණයෙන්ම මුදල් හා කඩදාසි භාවිතයෙන් තොර සහ සියල්ල ඇතුළත් ඩිජිටල් ආර්ථිකයක් ස්ථාපිත කිරීමට රජය අපේක්ෂා කරයි.

2024 අංක 45 දරන ආර්ථික පරිවර්තන පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රජය සම්පූර්ණයෙන්ම කැපවී සිටින අතර, මෙයට පනතට අදාළ සහ ආර්ථික වර්ධනය මත පදනම් වූ සංශෝධන පනතට ඇතුළත් කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ. මේ අතර, යටිතල පහසුකම් සංවර්ධනයෙහි සහ රාජ්‍ය සේවාවන්හි පෞද්ගලික අංශයේ ක්‍රියාකාරී සහභාගීත්වය සඳහා නීතිමය රාමුවක් නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව නීතිය හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ. රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව නීතිය රාජ්‍ය - පෞද්ගලික ව්‍යාපෘති සඳහා අදාළ ක්‍රියාවලිය විධිමත් කරනු ඇති අතර, සංවර්ධන කටයුතු සඳහා අත්‍යවශ්‍ය ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහා පුද්ගලික ප්‍රාග්ධනය ආකර්ෂය කර ගනිමින් විනිවිදභාවය වැඩි දියුණු කරනු ඇත. ශක්තිමත් ලෙස ද. දේ. නි. යේ වර්ධනය, පහළ විරැකියාව, ඉහළ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය, අපනයන-නැඹුරු වර්ධනය, තිරසාර මූල්‍ය සමතුලිතතා, කෘෂිකර්මාන්තය නවීකරණය කිරීම, ඩිජිටල් ආර්ථිකය පුළුල් කිරීම, 2050 වන විට පාරිසරික ශුද්ධ-ශුන්‍ය විමෝචනය සාක්ෂාත් කර ගැනීම සහ දරිද්‍රතාවය අඩු කිරීම ඉලක්ක කර ගනිමින් සියල්ලන්ට ප්‍රතිලාභ හිමිවන වර්ධනය, තිරසාර සංවර්ධනය සහ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම සඳහා රජය දැනටමත් මූලාරම්භයක් ගෙන තිබේ.

රජය මෙම ප්‍රතිසංස්කරණ හරහා, ඵලදායිතාව වැඩිදියුණු කිරීම, විවිධාංගීකරණය වූ අපනයන සහ ශක්තිමත් පෞද්ගලික අංශයක් මගින් මෙහෙයවනු ලබන මධ්‍ය කාලීනව සියයට 6 - 8 අතර තිරසාර වර්ධන වේගයක් අත්කර ගැනීමට ඉලක්ක කරයි. ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණවල අරමුණ වනුයේ නම්‍යශීලී බව වැඩි කිරීම, විධිමත් රැකියා දිරිමත් කිරීම සහ අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව නැගී එන කර්මාන්ත අවශ්‍යතා සමඟ, විශේෂයෙන් තාක්ෂණය, නිෂ්පාදනය, සැපයුම් සහ පුනර්ජනනීය බලශක්තිය යන ක්ෂේත්‍ර වලට අනුකූලවන ලෙස සැකසීමයි. පුනර්ජනනීය බලශක්තිය, ඩිජිටල් යටිතල පහසුකම් සහ නවෝත්පාදනයන්හි ආයෝජන හරිත ආර්ථිකය පුළුල් කරන අතරම රාජ්‍ය මූල්‍ය හා පාරිසරික තිරසාරභාවය වැඩි දියුණු කරනු ඇත.

මෙම පුළුල් පියවරයන්, ඔරොත්තු දෙන, සියල්ලන්ට ප්‍රතිලාභ හිමිවන සහ ඉදිරි දැක්මක්

සහිත ආර්ථිකයක් සඳහා අඩිතාලම දමමින් පවතී. මූල්‍ය විනය ආරක්ෂා කිරීම, ආයතන ශක්තිමත් කිරීම සහ පුළුල් වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම මගින්, සෑම ශ්‍රී ලාංකිකයෙකුටම ජාතියේ නව වර්ධන අවස්ථාවෙන් ප්‍රතිලාභ සැලසෙන බව රජය තහවුරු කරයි.

## 1:1 සටහන ශ්‍රී ලංකාවේ වෙනස් වන වයස් ව්‍යුහයෙහි සහ වර්ධනය වන යැපීම් අනුපාතයෙහි ආර්ථික බලපෑම

### (i ) හැඳින්වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලද "ජන හා නිවාස සංගණනය 2024" ට අනුව, ශ්‍රී ලංකාවේ ජනගහනය 2012 වසරේ වූ මිලියන 20.4 සිට 2024 වසරේ දී මිලියන 21.8 දක්වා වර්ධනය වී ඇති අතර, එය සියයට 0.5 ක අවම සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගයක් පිළිඹිබු කරයි. 2012 වසරේ පැවති සියයට 0.7 ක වර්ධන වේගයෙහි සිදුවූ අඩුවීම මඟින් ජන විකාශනයෙහි සැළකිය යුතු මට්ටමේ සංක්‍රමණයක් පැහැදිළි වන අතර, එමඟින් අනාගතයේ දී සිදු විය හැකි පුළුල් ආර්ථික බලපෑම් පැහැදිළි වේ.

### (ii) විශ්ලේෂණය

මෙම විශ්ලේෂණය මඟින් ජනගහන සංයුති ව්‍යුහයේ වෙනස්වීමට අදාළ ප්‍රවණතා සහ ඉන් ආර්ථිකයට ඇති විය හැකි අභියෝග හා පවතින අවස්ථාවන් පිළිබඳව පැහැදිළි කෙරේ.

**1 රූපසටහන : ජනගහනය සහ ජනගහන වර්ධන වේගය (1871-2024)**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**2 රූපසටහන : වයස් ව්‍යුහයේ වෙනස්වීම (1946-2024)**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**වගුව : ශ්‍රී ලංකාවේ දිගුකාලීන ජනගහන සංයුති ව්‍යුහයේ වෙනස්වීම (1946-2024)**

| වයස් කාණ්ඩය | 1946 දී ප්‍රතිශතය (%) | 2024 දී ප්‍රතිශතය (%) | ප්‍රවණතා විශ්ලේෂණය | ආර්ථිකය මත බලපෑම |
|---|---|---|---|---|
| ළමුන් (අවු.0-14) | 40-42% | ≈20% | ස්ථාවර, තියුණු සංකෝචනය | අනාගතයේ දී ශ්‍රම සැපයුම පටු වීම. |
| වැඩ කරන වයස (අවු. 15-59) | ≈52% | ≈61% | උපරිමයට ළඟා විය. වර්තමානයේ දී ස්ථාවර වෙමින් පවතී | ජනගහන සංයුති ව්‍යුහයේ ප්‍රතිලාභයෙහි (Demographic Dividend) අවසානය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාවය ඇති වීම. |
| වැඩිහිටි (අවු.60+) | ≈5% | ≈18% | 2001 වසරෙන් පසු වේගවත් වර්ධනය | වයස්ගත ජනගහනයේ යැපීම වැඩිවීම රාජ්‍ය මූල්‍ය අවකාශය මත ඇති පීඩනය ඉහළ නංවයි. |

**(අ) අනාගත තරුණ ජනගහනයේ (අවුරුදු 0-14) සැලකිය යුතු අඩුවීම**

2 රූප සටහන අනුව වයස අවුරුදු 0-14 අතර ළමුන්ගේ ජනගහන අනුපාතයේ තියුණු හා අඛණ්ඩ අඩු වීමක් දැක ගත හැකිය. සාඵල්‍යතා අනුපාතවල අඛණ්ඩ පහත වැටීම සහ විවාහ ප්‍රමාද වීමේ ප්‍රවණතාවය, සමාජීය දියුණුව හේතුවෙන් උසස් අධ්‍යාපනයට සහභාගී වීම වැඩිවීම, මෙම ජනගහන සංයුති ව්‍යුහයේ වෙනසට පාදක වන ප්‍රධාන සාධක වේ. වර්තමානයෙහි ජනගහනයට ඇතුළු වන ළමුන් සංඛ්‍යාවේ අඩු වීම ඉදිරි දශක කිහිපය තුළ ශ්‍රම බලකායට ඇතුළත් වන සංඛ්‍යාව අඩු වීම සඳහා ඇති ප්‍රවණතාවයෙහි පිළිබිඹුවකි. මෙය ශ්‍රම සැපයුම් වර්ධනයේ වේගය අඩු කරන අතර, මෙය ඵලදායිතාව ඉහළ නැංවීම මගින් විසඳා නොගතහොත් එමගින් සමස්ත ආර්ථිකයේ ප්‍රසාරණය සීමා වනු ඇත.

**(ආ) වැඩ කරන වයසේ පසුවන ජනගහනයේ වර්ධනය (අවුරුදු 15-59) ස්ථාවර වීම**

2012 වසරේ සිට 2024 වසර දක්වා මෑත කාලීන දත්ත අනුව ශ්‍රී ලංකාවෙහි ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වයසේ ජනගහනය පැහැදිලිවම ස්ථාවර වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. මෙම වයස් කාණ්ඩය 2012 වසරේ දී ජනගහනයෙන් සියයට 62.4 ක් වූ අතර 2024 වසරේ දී එම ජනගහනය සියයට 61.3 දක්වා සුළු වශයෙන් අඩු විය. මෙලෙස මෙම වයස් කාණ්ඩයෙහි ස්ථාවර වීමේ ප්‍රවණතාවය මඟින්, ශ්‍රී ලංකාව 1960 වසරේ සිට 2000 වසර දක්වා අත්විඳින ලද ජනගහන සංයුති ව්‍යුහයෙන් ලද ප්‍රතිලාභයෙහි අවසානයට ලඟා වී ඇති බව තහවුරු වේ. ජනගහන සංයුති ව්‍යුහයෙන් ලද ප්‍රතිලාභය අවසන් වීමත් සමඟ, ඉහළ ඉතුරුම්, ප්‍රාග්ධන එක්රැස් වීම සහ ශ්‍රමය මත පදනම් වූ ආර්ථික ප්‍රසාරණය ද සීග්‍රයෙන් අඩු වනු ඇත. ඒ අනුව, "ධනවත් වීමට පෙර මහලු වීම" එනම් රටේ ජනගහනය ඉහළ ආදායමක් හෝ ආර්ථික සමෘද්ධියක් අත්කර ගැනීමට පෙර වයස්ගත වෙමින් පැවතීමේ අවදානම අවම කිරීම පිණිස ව්‍යුහාත්මක නවීකරණය සඳහා ක්ෂණික අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

**(ඇ) වැඩිහිටි ජනගහනයේ සීඝ්‍ර වර්ධනය (අවුරුදු 60+)**

වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශතය 1946 වසරේ දී අවමය වූ සියයට 5 සිට 2024 වසරේ දී සියයට 18 දක්වා වර්ධනය විය. 2 රූප සටහන මඟින් වැඩිහිටි ජනගහන වර්ධනයේ තියුණු ලෙස ඉහළ යන ප්‍රවණතාවයක් පෙන්නුම් කරන අතර 2001 වසරෙන් පසු සැලකිය යුතු ලෙස එහි සීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබේ. මෙම ප්‍රවණතාවය ප්‍රධාන වශයෙන්ම වැඩිවන ආයු අපේක්ෂාව මඟින් මෙහෙයවනු ලැබේ. වයස්ගත වීමේ ස්ත්‍රීකරණය එනම් වයස අවුරුදු 70 ට වැඩි කාන්තාවන් පිරිමින්ට වඩා දිගු ආයු කාලයක් සහිතව ජීවත් වීම අඛණ්ඩව කාලයත් සමඟ වර්ධනය වෙමින් පවතී. මෙම ප්‍රවණතාවය රජය විසින් දැරිය යුතු දිගුකාලීන පිරිවැය බර ඉහළ නංවන අතර එමඟින් රාජ්‍ය මූල්‍ය අංශය මත පීඩනයක් ඇති කරනු ලබයි. මෙලෙස සමස්ත වයස්ගත වීමේ ප්‍රවණතාවය මඟින් මහලු වියේ යැපීම ඉහළ නැංවීම, ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය අඩු වීම සහ අනාගත විශ්‍රාම වැටුප් සහ සෞඛ්‍ය සේවා වියදම් ඉහළ යාම ආදී හේතූන් මත ආර්ථිකයට සැලකිය යුතු ලෙස බලපෑම් එල්ල කරනු ඇත.

**නිගමනය**

මෙම ජනගහන සංයුති ව්‍යුහයේ වෙනස මඟින් ඇතිවන ක්ෂණික අභියෝගය වන්නේ මහලු වියේ යැපුම් අනුපාතයේ වේගවත්ව වර්ධනය වීම හේතුවෙන් එය සමාජ ආරක්ෂණය සහ සෞඛ්‍ය සේවා පද්ධති මත පෙර නොවූ විරූ මූල්‍ය පීඩනයක් ඇති කරමින් රජයේ ඉතිරිකිරීම් සීඝ්‍රයෙන් ක්ෂය වීම සඳහා අහිතකර ලෙස බලපෑමයි. තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීම සඳහා සහ වයස්ගත ජනගහනය හේතුවෙන් ඇතිවන ආර්ථික වර්ධනයේ මන්දගාමීත්වය අවම කිරීම සඳහා ශ්‍රී ලංකාව ක්ෂණිකව ඒකාබද්ධ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළ යුතුය. එවැනි ප්‍රතිසංස්කරණ සඳහා ඌන උපයෝජිත කාන්තා ශ්‍රම සංචිත භාවිතයට ගැනීම, "රැකවරණ සේවකයින් " (care givers) ආර්ථිකයේ අත්‍යවශ්‍ය සංරචකයක් ලෙස හඳුනාගැනීම සහ ඔවුනට නිසි පිළිගැනීම ලබා දීම, සහ නැගී එන "රිදී ආර්ථිකය එනම් වැඩිහිටි ජනගහනයේ අවශ්‍යතා කෙරෙහි සම්පූර්ණයෙන්ම අවධානය යොමු කරමින් වයස මත පදනම් වූ වෙළෙඳපොල" සඳහා උපායමාර්ගික ආයෝජන දිරිමත් කිරීම ආදිය ඇතුළත් විය යුතුය.

## 1.2 සාර්ව රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය

ආර්ථිකය 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 4.6 ක වර්ධනයට සාපේක්ෂව, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 4.8 කින් වර්ධනය විය. මෙම වර්ධනය සඳහා කෘෂිකර්මය , කර්මාන්ත, සේවා සහ සහනාධාර අඩු කළ බදු යන සියලුම ප්‍රධාන ක්ෂේත්‍රවල ධනාත්මක කාර්යසාධනය ඉවහල් විය. 2024 වසරේ පළමු භාගයේ දී සියයට 1.8 ක වර්ධනයට සාපේක්ෂව, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී කෘෂිකර්ම අංශය සියයට 0.6 කින් සුළු වශයෙන් වර්ධනය විය. කර්මාන්ත අංශය 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 10.5 ට සාපේක්ෂව, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 7.9 ක මධ්‍යස්ථ වේගයකින් වර්ධනය විය. මේ අතර, සේවා අංශය 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 2.3 ට සාපේක්ෂව, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 3.3 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කරන ලදී. නිෂ්පාදන මත සහනාධාර අඩු කළ බදු, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 6.4 ට සාපේක්ෂව, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 10.6 කින් වර්ධනය විය. 2025 වසරේ අගෝස්තු මාසය සඳහා ශ්‍රී ලංකාවේ ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය ආර්ථිකයේ කැපී පෙනෙන ප්‍රසාරණයක් පිළිබිඹු කළ අතර, නිෂ්පාදන අංශයේ ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය 55.2 ක්, සේවා අංශයේ ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය 68.9 ක් සහ ඉදිකිරීම් අංශයේ ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය 61.1 ක් ලෙස සටහන් වූ අතර, එමගින් අංශ තුනෙහිම ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

දිගු කාලීන වශයෙන් ඉහළ අස්ථාවරත්වයක් තිබියදී වුව ද, වසර තුළ ඉහළ තීරුබදු ගැලපීම් මන්දගාමී වීම හේතුවෙන් ගෝලීය ආර්ථික වර්ධනය කෙටි කාලීනව මධ්‍යස්ථ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින්, 2025 වසරේ අප්‍රේල් මස නිකුත් කරන ලද ලෝක ආර්ථික දැක්මට සාපේක්ෂව 2025 වසරේ ඔක්තෝබර් මස නිකුත් කරන ලද ලෝක ආර්ථික දැක්මේ ගෝලීය වර්ධන පුරෝකථනයන් ඉහළ අගයක් දක්වා සංශෝධනය කර ඇත. දියුණු ආර්ථිකයන් සඳහා පිළිවෙළින් සියයට 1.5 ක් පමණ සහ නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සඳහා සියයට 4 ට වැඩි වර්ධන අපේක්ෂාවන් සමඟ, ගෝලීය වර්ධනය 2025 වසරේ දී සියයට 3.2 ක් සහ 2026 වසරේ දී සියයට 3.1 ක් දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එක්සත් ජනපදයේ තීරු බදු සහ ඉහළ ණය සමුච්චය හේතුවෙන් පැනනැගී රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය අවදානම් මෙන්ම ශ්‍රම සැපයුම් කම්පන හේතුවෙන් ගෝලීය ආර්ථිකයෙහි අපේක්ෂිත වර්ධනයට බාධා කරන අවිනිශ්චිතතාවයන් උග්‍ර වී ඇත. ආර්ථිකයන්හි යම් යම් වෙනස්කම් ඇතිව වුවද, සමස්තයක් ලෙස ගෝලීය උද්ධමනය පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2025 වසරේ ඔක්තෝබර් මස ලෝක ආර්ථික දැක්ම මඟින් අනපේක්ෂිත කම්පනවලට ඔරොත්තු දීම සඳහා රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක නැවත ගොඩනැංවීමත්, විශ්වාසය යථා තත්ත්වයට පත් කිරීමට සහ කම්පනවලට මුහුණ දීමට දැනට පවතින ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ දෙගුණ කිරීමත් සමඟ සියලු ක්ෂේත්‍රවල තිරසාර ප්‍රතිපත්තියක් තිබීමේ වැදගත්කමත් අවධාරණය කරයි.

ශ්‍රී ලංකාව 2025 වසරේ දී ද සිය ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරන ලදී. 2025 වසරේ පළමු මාස අට තුළ එකතු කළ අගය මත බද්ද, ආදායම් බදු සහ මෝටර් රථ සඳහා වන බදුවලින් ලද ඉහළ ආදායම් හේතුවෙන් රාජ්‍ය ආදායම සැළකිය යුතු ලෙස වර්ධනය විය. මෙම විශිෂ්ට ආදායම් එකතු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවල බලපෑම, පරිපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ යාම හේතු විය . තවද, ආදායම් එකතු කරන ප්‍රධාන ආයතන තුන විසින් ඩිජිටල්කරණය සඳහා ගන්නා ලද ආරම්භයන් ඇතුළු දූෂණ විරෝධී ක්‍රියාමාර්ග දැඩිව බලාත්මක කිරීම ද මෙයට ඉවහල් විය.

ආදායම් එක් රැස් කිරීම ඉහළ නැංවීම සඳහා, අවදානම් මත පදනම් වූ විගණන, විගණන කාර්යක්ෂමතාව, ඉහළ වත්කම් සහිත පුද්ගලයන්ගේ ඒකකය සඳහා අනුකූලතා ක්‍රියාමාර්ග ඉහළ නැංවීම, විශාල සහ විශාල නොවන බදු ගෙවන්නන් අතර බදු වාර්තා ගොනු කිරීමේ අනුකූලතාව, එකතු කළ හැකි ණය කළමනාකරණය සහ එකතු කළ අගය මත බදු ලියාපදිංචිය වැනි ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුන්වා දීම මගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය නිරීක්ෂණය කිරීමට සහ අධීක්ෂණය කිරීමට ප්‍රයත්නයන් යොදන ලදී. ආයතනික අඛණ්ඩතාව සහ විනිවිදභාවය ශක්තිමත් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව විසින් වැදගත් දූෂණ විරෝධී ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ස්වයංක්‍රියකරණය සහ ඩිජිටල්කරණය හඳුන්වා දී ඇති අතර, විධිමත් ආචාරධර්ම පද්ධතියක් අනුගමනය කරමින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ ධාරිතාව වැඩි දියුණු කර ඇත. ශ්‍රී ලංකා රේගුව විසින් ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතිය හඳුන්වා දීම, අභ්‍යන්තර අධීක්ෂණ ඒකක පිහිටුවීම සහ රේගු ප්‍රකාශන (CUSDEC) පිළිබඳ විමසා බැලීමේ පද්ධතිය සහ වාහනවල තොරතුරු සත්‍යාපනය කර බැලීම සඳහා පවතින ක්‍රමවේදය වැනි ඩිජිටල් ක්‍රමවේද සංවර්ධනය කිරීම ඇතුළු ඉලක්කගත ප්‍රතිසංස්කරණ

ක්‍රියාත්මක කර ඇත. මේ අතර, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ එක්ව සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සුරාබදු දෙපාර්තමේන්තුවේ අවංකභාවය සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සහ සහතික කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයකු පත් කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම සහ අභ්‍යන්තර කටයුතු, අවදානම් කළමනාකරණ සහ මූල්‍ය විමර්ශන ඒකක පිහිටුවීම වැනි සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග ගෙන ඇත.

එකතු කළ අගය මත බදු අනුකූලතාව වැඩි දියුණු කිරීම පිණිස සුදුසුකම් ලත් අපනයනකරුවන් සහ ඔවුන්ගේ සැපයුම්කරුවන් සඳහා සම්මත එකතු කළ අගය මත බදු මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලියකට මාරු වෙමින් සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමය 2025 වසරේ ඔක්තෝබර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කරන ලදී. 2025 වසරේ පළමු මාස අට තුළ බදු අනුකූලතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාමත් සමඟ, එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට පැවැති 21,542 සිට 2025 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට 31,134 දක්වා සියයට 44.5 කින් වර්ධනය විය. නේවාසික සහ විදේශීය සමාගම්වල ලියාපදිංචි කිරීම් ද 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට පැවති 100,409 හා සසඳන විට 2025 වසරේ සැප්තැම්බර් අවසානය වන විට 118,678 දක්වා සියයට 18.2 කින් වර්ධනය විය.

ප්‍රදාන ද ඇතුළුව රජයේ සමස්ත ආදායම, 2024 වසරේ පළමු මාස අට තුළ පැවැති රු. බිලියන 2,434.0 සිට 2025 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 3,301.5 දක්වා සියයට 28.7 කින් වර්ධනය විය. බදු ආදායමෙන් ලද ආදායම රු. බිලියන 3,068.5 ක් දක්වා වර්ධනය වූ අතර, එය 2025 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ නියම කරන ලද ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායකය රු. බිලියන 318 කින් ඉක්මවා යන ලදී. ආදායම් බදුවලින් ලද ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 624.7 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 702.4 ක් දක්වා සියයට 12.4 කින් වර්ධනය වීය. මෙය වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 60.2 ක් ලබා කර ගැනීමකි. භාණ්ඩ හා සේවා මත බදුවලින් ලද ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ පැවැති රු. බිලියන 1,421.3 සිට 2025 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,939.1 ක් දක්වා සියයට 36.4 කින් වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 1,084.3 ක් දක්වා සියයට 28.7 කින් වර්ධනය වීම සහ විශේෂයෙන් මෝටර් රථ මත වන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදුවලින් ලද ආදායම රු. බිලියන 607.9 ක් දක්වා සියයට 57.6 කින් වර්ධනය වීමයි. මෙම නිෂ්පාදන බදු ආදායම, සම්පූර්ණ වසර සඳහා වූ රු. බිලියන 598.5 ක ඉලක්කය ද ඉක්මවා යන ලදී. විදේශ වෙළෙඳාම මත වූ බදුවලින් ලද ආදායම රු. බිලියන 427.0 දක්වා සියයට 41.2 කින් වර්ධනය විය. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් යළි ආරම්භ වීම හේතුවෙන් දේශීය ක්‍රියාකාරකම් මත වූ එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ පැවැති රු. බිලියන 468.8 සිට 2025 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 567.5 ක් දක්වා සියයට 21.1 කින් වර්ධනය විය. භාණ්ඩ ආනයනයෙන් ලද එකතු කළ අගය මත බදු ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 374.0 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 516.8 දක්වා සියයට 38.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2025 වසරේ පෙබරවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම වාහන වර්ග සඳහා පනවා තිබූ ආනයන සීමාවන් ඉවත් කිරීම හේතුවෙන් ආනයනය කරන ලද වාහනවලින් ලද එකතු කළ අගය මත බදු ආදායම වර්ධනය වීමෙන් ආනයනය මත එකතු කල අගය මත බදු ආදායමෙහි වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

මෝටර් රථ ආනයනයට පනවා තිබූ සීමා ඉවත් කිරීම හේතුවෙන්, මෝටර් රථ මත වූ නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 36.5 සිට, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 270.5 දක්වා රු. බිලියන 234 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. රේගු ආනයන බද්දෙන් ලද ආදායම ද 2024 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 69.4 සිට, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 151.0 දක්වා සියයට 117.5 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. පිළිවෙළින් වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සහ සෙස් බද්ද මඟින් ලද ආදායම රු. බිලියන 115.9 දක්වා සියයට 1.7 කින් ද, රු. බිලියන 56.5 දක්වා සියයට 8.8 දක්වා ද වර්ධනය විය. ආනයන පරිමාවන් වර්ධනය වීම වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්දෙන් ලද ආදායම වර්ධනය වීමට හේතු විය. සෙස් බද්දෙන් ලද ආදායම වර්ධනය වීම සඳහා සෙස් අය කරන භාණ්ඩ සඳහා වූ ආනයන සීමා ඉවත් කිරීම සහ තෝරාගත් ආනයනික භාණ්ඩ සඳහා වූ සෙස් බදු අනුපාත ඉහළ දැමීම හේතු විය. බදු නොවන ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 209.3 සිට, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 226.2 දක්වා සියයට 8.1 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය විය. මෙය වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 61.1 ක ආදායම් ලබා කර ගැනීමකි.

සාර්ථකත්වය පිළිබිඹු කරමින් අයවැය හිඟය නාමික වශයෙන්, 2024 වසරේ පළමු මාස අට තුළ වාර්තා කළ රු. බිලියන 910.7 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 411.0 දක්වා අඩු විය. මධ්‍ය කාලීනව, ආදායම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ළඟා කර ගැනීමේ ක්‍රියාමාර්ග සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමත් සමඟ ප්‍රාථමික ශේෂය සහ සමස්ත ශේෂය වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළවලට ප්‍රවේශ වීම සීමා වීම හේතුවෙන්, රජය ප්‍රධාන වශයෙන් අයවැය හිඟය මූල්‍යකරණය සඳහා දේශීය මූලාශ්‍ර මත රැඳී ඇත. 2025 වසරේ පළමු මාස අට තුළ ශුද්ධ දේශීය මූල්‍යකරණය රු. බිලියන 462.9 ක් වූ අතර ණය ආපසු ගෙවීම් ප්‍රතිලාභී වූ ප්‍රමාණය ඉක්ම වූ බැවින් ශුද්ධ විදේශීය මූල්‍යකරණය රු. බිලියන ඍණ 51.8 ක් විය. කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ තිරසාර වර්ධනයට සහාය වීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රාජ්‍ය ආයෝජන කළමනාකරණ ඇගයීමට අදාළව නිර්දේශ ඇතුළත් කරමින්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීතීන්ට අනුකූලව මධ්‍ය කාලීනව රාජ්‍ය ආයෝජන සඳහා උපායමාර්ගිකව ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

2024 වසරේ සැප්තැම්බර් අවසානය වන විට රු. බිලියන 29,402 ක් වූ මධ්‍යම රජයේ නොපියවූ සමස්ත ණය ප්‍රමාණය 2025 වසරේ සැප්තැම්බර් මාසය අවසන් වන විට රු. බිලියන 30,928 ක් දක්වා සියයට 5.2 කින් වැඩි වී තිබේ. 2024 වසරේ සමාන කාල පරිච්ඡේදයට සාපේක්ෂව 2025 වසරේ සැප්තැම්බර් මාසය අවසන් වන විට නොපියවූ සමස්ත දේශීය ණය ප්‍රමාණය රු. බිලියන 19,660 ක් දක්වා සියයට 9.5 කින් වැඩි වී ඇති අතර, නොයියවූ සමස්ත විදේශ ණය ප්‍රමාණය රු. බිලියන 11,268 ක් දක්වා සියයට 1.6 කින් අඩු වී ඇත.

**1.2 රූපසටහන : රාජ්‍ය මූල්‍ය සමස්තයන් 2022-2024**




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

2025 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව වසර ආරම්භයේ සිට මේ දක්වා සියයට 3.3 කින් අවප්‍රමාණය වී ඇත. වසරකට ආසන්න කාලයක් අවධමනයක් වාර්තා කිරීමෙන් අනතුරුව 2025 වසරේ සැප්තැම්බර් මාසයේ දී උද්ධමනය සියයට 1.5 ක් සහ ඔක්තෝබර් මාසයේ දී සියයට 2.1 ක් ලෙස ධනාත්මක අගයන් වාර්තා කර ඇත. මෙම උද්ධමනකාරී තත්වයට බොහෝ දුරට හේතු වූයේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයන්ට අනුගත වීම සහ ආහාර උද්ධමනය වැඩිවීම හේතුවෙන් ඉල්ලුම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමයි. මාස එකොළහක් මුළුල්ලේ අවධමනයක් වාර්තා කිරීමෙන් අනතුරුව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද. 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2025 වසරේ අගෝස්තු මාසයේ දී සියයට 1.2 සිට 2025 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 1.5 දක්වා වැඩි විය. (වාර්ෂික ලක්ෂ්‍යමය) ආහාර උද්ධමනය 2025 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 2.9 දක්වා වේගයෙන් වර්ධනය වූ අතර (වාර්ෂික ලක්ෂ්‍යමය) ආහාර නොවන කාණ්ඩයන්ගේ උද්ධමනය සියයට 0.7 ක ස්ථාවරව පැවතුනි. රටේ ධනාත්මක ආර්ථික දැක්ම සැලකිල්ලට ගෙන, උද්ධමනය එහි ඉලක්කය කරා ගමන් කරනු ඇතැයි පුරෝකථනය කර ඇත.

2025 වසරේ ජනවාරි මාසයේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2024 වසරේ නොවැම්බර් මාසයේ සිට පවත්වාගෙන ආ සියයට 8.00 ක එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය තවදුරටත් පවත්වා ගැනීමට තීරණය කරන ලදී. 2025 වසරේ මැයි මාසයේ දී, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පදනම් අංක 25 කින් සියයට 7.75 ක් දක්වා අඩු කරන ලද අතර එමඟින් මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කරන ලදී. ඒ අනුව, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට පදනම් අංක ± 50 ක ආන්තිකයකින් සම්බන්ධ කර ඇති නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින් සියයට 7.25 සහ සියයට 8.25 දක්වා අඩුවිය. වර්තමාන මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය උද්ධමනය මධ්‍ය කාලීන ඉලක්කය කරා මෙහෙයවීම සඳහා සහාය දක්වන අතරම, පවතින ආර්ථික ප්‍රකෘතියට සහාය වන බව සලකනු ලබන බැවින්, ප්‍රතිපත්ති අනුපාතය එතැන් සිට මෙම මට්ටමේ පවත්වා ගෙන යනු ලැබේ. වර්තමාන මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය උද්ධමනය සියයට 5 ක මධ්‍ය කාලීන ඉලක්කය කරා ළඟා වීමට පිටිවහලක් වන අතරම, ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ අඛණ්ඩ ක්‍රියාවලියට සහාය වන බැවින්, ප්‍රතිපත්ති පොලී අනුපාතිකය එම මට්ටමේම පවත්වා ගෙන යනු ලැබේ.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් සහ සාර්ව රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයේ වර්ධනය පිළිබිඹු කරමින්, ප්‍රධාන ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන තුන විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නංවන ලදී. ෆිච් ශ්‍රේණිගත කිරීම්, මූඩීස් ආයෝජක සේවය සහ එස් ඇන්ඩ් පී ගෝලීය ශ්‍රේණිගත කිරීම් මඟින් රටේ ශ්‍රේණිගත කිරීම පිළිවෙළින් CCC+, Caa1 සහ CCC+/C දක්වා ඉහළ නංවා ඇති අතර, එමඟින් ආයෝජක විශ්වාසය වැඩිදියුණු වී රටේ රාජ්‍ය මූල්‍ය හා ආර්ථික කළමනාකරණය පිළිබඳ ධනාත්මක පරිසරයක් ගොඩනැගෙනු ඇත.

### 1.3 මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශනය

2024 වසරේ අගෝස්තු මස සිට බලපැවැත්වෙන පරිදි පනවන ලද 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් පාලනය වේ. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ නියෝග සහ විධාන ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත පූර්ණ ලෙස ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය ණය තිරසාර මට්ටමක පවත්වා ගැනීම, අනාගත අවිනිශ්චිත තත්ත්වයන්ගෙන් ආරක්ෂා වීම සඳහා රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක ගොඩනැගීම සහ පවත්වාගෙනයාම, රාජ්‍ය මූල්‍ය අවදානම් කළමනාකරණය කිරීම හා අවම කිරීම සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ විනය, විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම වැනි ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම පනත මගින් නීතිමය රාමුවක් සපයනු ලබයි. තවද, වාර්ෂික රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයක් සහ පස් අවුරුදු මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවක් ප්‍රකාශයට පත් කිරීමේ නීත්‍යානුකූල අවශ්‍යතාවය අනිවාර්යය කර ඇත.

රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මගින් ප්‍රකාශයට පත්කරනු ලබන මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව යටතේ දක්වනු ලබන ප්‍රාථමික ශේෂ ඉලක්කය සහ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13 ක් වූ ප්‍රාථමික වියදම් සීමාව මඟින් ණය අඩු කිරීමේ අරමුණ අධීක්ෂණය කෙරේ. පොලී නොවන වියදම් කළමනාකරණය කිරීම මඟින් හා ආදායම් වැඩි දියුණු කිරීමේ ක්‍රියාමාර්ග ඔස්සේ රාජ්‍ය මූල්‍ය විනය සහතික කරන අතර ප්‍රාථමික ශේෂය ශක්තිමත් කිරීම සඳහා ණය අඩු කිරීමට මෙම ආකෘති රාමුව සහාය දක්වනු ලබයි. 2025 වසරේ දී රජයේ ආදායම ද.දේ.නි. යෙන් සියයට 15.9 ඉක්මවනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, රජයේ වියදම් ද.දේ.නි. යෙන් සියයට 20.5 ක් පමණ වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ඒ අනුව, 2025 වසරේ ද.දේ.නි.යෙන් සියයට 3.8 ක පමණ ප්‍රාථමික ශේෂයක් පවත්වා ගැනීමට සහ අයවැය හිඟය සියයට 5.4 ක මට්ටමක පවත්වා ගැනීමට බලාපොරොත්තු වේ.

#### 1.3.1 රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය

2026 වසර සඳහා වන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ දක්වා ඇති මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව (2025–2030) සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ නියම කර ඇති රාජ්‍ය මූල්‍ය රීති මඟින්, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය මෙහෙයවනු ලබයි. 2026 වසරේ ද.දේ.නි. යෙන් සියයට 2.3 කට නොඅඩු ප්‍රාථමික අතිරික්තයක් අත්කර ගැනීම සඳහා රජය බැඳී සිටියි. මේ සඳහා අයවැය ඇස්තමේන්තු අනුව 2025 වසරේ දී රාජ්‍ය ආදායම ද.දේ.නි. යෙන් සියයට 15.1 දක්වා ඉහළ නැංවීම අරමුණු කරගත් ආදායම් ඉහළ නැංවීමේ පියවරයන් කිහිපයක් රජය විසින් ක්‍රියාත්මක කර ඇත. කෙසේ වෙතත්, මෙම පියවර ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ මෝටර් රථ ආනයනයෙන් අපේක්ෂිත ආදායමට වඩා වැඩි ආදායමක් ලැබීම හේතුවෙන්, රජය 2025 වසරේ සිය ආදායම් ඇස්තමේන්තුව ද.දේ.නි. යෙන් සියයට 15.1 සිට ද. දේ.නි. යෙන් සියයට 15.9 දක්වා ඉහළ නංවා ඇත. මෙම වැඩිදියුණු කිරීම් හේතුවෙන්, රාජ්‍ය ආදායම 2026 වසරේ ද.දේ. නි. යෙන් සියයට 15.2 ක් ලෙස පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර ප්‍රාථමික අතිරික්තය ද. දේ. නි.යෙන් අවම වශයෙන් සියයට 2.3 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බදු අනුකූලතාව ඉහළ නැංවීම, දූෂණ අවදානම් අවම කිරීම, බදු පරිපාලනය ඩිජිටල්කරණය සහ නවීකරණය කිරීම සහ ඵලදායී කළමනාකරණය සහ පාලනය කෙරෙහි අවධානය යොමු කරමින්, මධ්‍ය කාලීනව රජයේ ආදායම වැඩි කර ගැනීම පිණිස බදු පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා දැනටමත් පියවර ගණනාවක් ක්‍රියාත්මක කරමින් පවතී.

රාජ්‍ය ආදායම ඉහළ නංවන අතරම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුකූලව රජයේ වියදම් සහ ප්‍රාථමික වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13 ට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීමට රජය කැපවී සිටී. සමාජ ආරක්ෂණ ජාල ශක්තිමත් කරන අතරම ආර්ථිකයේ ප්‍රධාන ප්‍රමුඛතා අංශ සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම සහතික කෙරෙනු ඇත. රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය වර්ධනය සඳහා හිතකර ක්‍රියාමාර්ග, මිල සහ මූල්‍ය ස්ථායීකරණය සහතික කිරීම සහ පාලනය ශක්තිමත් කිරීම ඇතුළු සමස්ත ආර්ථික ස්ථායිකරණ ක්‍රියාමාර්ග මඟින් රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය සහාය ලබනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ ණය තිරසාරභාවය සඳහා අදාළ ඉලක්කවලට අනුකූලව ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජය කැපවී සිටියි. රජය දේශීය ණය ප්‍රශස්තකරණයේ සියලුම අංග අවසන් කර ඇති අතර විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් අදියරේ පවතී. 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීමත් සමඟ ශ්‍රී ලංකාව 2025 වසරේ දී, රාජ්‍ය ණය කළමනාකරණයේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලදී. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් 2025–2029 වසර සඳහා මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය ප්‍රකාශයට පත් කරන ලද අතර, රජයේ වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම සහ මධ්‍ය කාලීන උපායමාර්ගික දිශානතිය පෙන්නුම් කරනු ලබයි. සංශෝධිත මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය සහ වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම 2026 වසරේ අයවැය සමඟ ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබයි. මධ්‍ය

කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය මගින් දේශීය මූල්‍යකරණය ශක්තිමත් කරන අතරම නව විදේශීය ණය ගැනීම් ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික මූලාශ්‍රවලට සීමා කිරීම සිදුකරනු ලබයි. 2024 වසරේ ජූනි මාසයේ දී නිල ණයහිමි කමිටුව සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාව 2024 වසරේ අග භාගයේ දී සහ 2025 වසරේ මුල් භාගයේ දී එහි ප්‍රධාන ණයහිමියන් සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම් අවසන් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඇතැම් ද්විපාර්ශ්වික ණය සැපයුම්කරුවන් විසින් විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති සඳහා මුදල් ලබා දීම ආරම්භ කර ඇත. මෙම කාලය පුරාම, බහුපාර්ශ්වික අරමුදල් සැපයීම බාධාවකින් තොරව අඛණ්ඩව සිදු වූ අතර, එමඟින් රටේ මූල්‍ය අවශ්‍යතා සඳහා ස්ථාවර සහායක් ලබා දෙන ලදී.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11 (3) වගන්තියට අනුව, 2026 අයවැය සකස් කිරීම සඳහා උපායමාර්ගික සැලැස්ම සැපයීම සඳහා මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව ඇතුළුව රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය 2025 ජූනි මස 30 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.

2025 - 2030 සඳහා වන රාජ්‍ය මූල්‍ය ගමන් මග සහ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය සඳහා වූ සාර්ව ආර්ථික දිශානතිය පහත දැක්වේ:

**රාජ්‍ය මූල්‍ය ගමන් මග:**

- රාජ්‍ය ආදායම ඉහළ නැංවීමේ ස්ථාවර ප්‍රයත්නයන් සහ රජයේ වියදම් තාර්කිකරණය කිරීම තුළින් 2025 වසරේ දී සහ ඉදිරි වසරවල දී දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් අත්කර ගැනීම.

- බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීම ඔස්සේ 2025 වසර සහ ඉන් ඔබ්බට රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15 ට වඩා ඉහළ නැංවීම.

- ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා මාධ්‍යකාලීනව හා දිගු කාලීනව සියයට 20 ක ඉලක්කය කරා ළඟා වීමට දළ දේශීය නිෂ්පාදිතයට බදු ආදායම දක්වන අනුපාතය ඉහළ නැංවීම.

- නැගී එන සහ මධ්‍ය ආදායම් ලබන රටවල ප්‍රමිතීන්ට අනුකූලව, මධ්‍ය කාලීන සිට දීර්ඝ කාලීනව ඍජු සහ වක්‍ර බදු අතර අනුපාතය 25:75 සිට 40:60 වෙනස් කිරීම.

- මූලික බදුවල බදු අනුකූලතාවය වැඩි දියුණු කිරීම විශේෂයෙන්ම එකතු කල අගය මත බදු අනුකූලතාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන ඔස්සේ සරල කරන ලද එකතු කල අගය මත බදු පද්ධතිය ඉවත් කිරීම සහතික කිරීම සඳහා ක්‍රියාකාරී එකතු කල අගය මත බදු සම්පූර්ණයෙන්ම ආපසු ගෙවීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම.

- ගෙවීම, ගොනු කිරීම, වාර්තා කිරීම සහ ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රධාන කාර්යසාධන දර්ශක යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කටයුතු අධීක්ෂණය කිරීම.

- RAMIS 3.0 හඳුන්වා දීම මඟින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම.

- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13 ට වඩා පහළ මට්ටමක පවත්වා ගත යුතු ප්‍රාථමික වියදම් සීමාවට පහළින් ප්‍රාථමික වියදම් කළමනාකරණය කිරීම.

- සමාජයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි පාර්ශවයන්ට සහන සැලසීම සඳහා සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කිරීම.

- 2026 වසර සහ ඉන් ඔබ්බට, රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යෙන් සියයට 4 කට වඩා වැඩි ප්‍රතිශත අගයකින් පවත්වා ගැනීම.

- සෞඛ්‍ය, අධ්‍යාපනය, යටිතල පහසුකම් සහ සමාජ ආරක්ෂණය වැනි ප්‍රමුඛතා අංශ සඳහා වියදම් ප්‍රමාණවත් ලෙස වෙන් කර ඇති බව සහතික කරන අතරම, අයවැය යටතේ අරමුදල් සැපයිය යුතු රාජ්‍ය ආයෝජන, ව්‍යාපෘති සහ වැඩසටහන් තෝරා ගැනීම සඳහා නිසි අධ්‍යයනයකින් අනතුරුව ප්‍රමුඛත්වය ලබා දීම.

- ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය භාවිතයට සුදුසු මට්ටමට පැමිණි විට ඉලෙක්ට්‍රොනික රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය, භාණ්ඩාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීම, 2026 වසර වන විට චෙක්පත් ගෙවීම සහ ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරුව ආදී මධ්‍යම රජයේ ගෙවීම් සිදු කිරීමට ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය භාවිතා කිරීම.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුවේ යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය ඒකාබද්ධ භාණ්ඩාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීම.

- 2026 වසර සහ ඉන් ඔබ්බට අයවැය හිඟය, ක්‍රමයෙන් ද.දේ.නි.යෙන් සියයට 5 ට වඩා අඩු මට්ටමකට ගෙන ඒම සහ එමඟින් රජයේ දළ මූල්‍යයන අවශ්‍යතා අඩු කිරීම.
- නොගෙවූ බිල්පත් නිෂ්කාශන උපායමාර්ගයට අනුව, මාස 3 කට වඩා නොගෙවූ බිල්පත් එකතු වීම වැළැක්වීම.

- රජයේ ඇපකරවලින් පැන නගින රාජ්‍ය මූල්‍ය අවදානම් සීමා කිරීමේ අරමුණින්, සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ ම රජයේ ඇපකරවල සමස්ත තොගය අදාළ මූල්‍ය වර්ෂයේ සහ පෙර මූල්‍ය වර්ෂ දෙකෙහි සාමාන්‍ය ද.දේ. නි.යෙන් සියයට 7.5 නොඉක්මවන ලෙස රජයේ ඇපකර නිකුත් කිරීම අඩු කිරීම.

- ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මනා මූල්‍ය කාර්යසාධනය සහතික කිරීම සඳහා ස්වයංක්‍රීය ඉන්ධන සහ විදුලි මිලකරණ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම.

- රජය සතු ව්‍යවසායයන්හි මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ පාලනය ශක්තිමත් කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කළ ආකාරයට, මධ්‍යකාලීනව සියයට 5 ක උද්ධමන ඉලක්කයක් පවත්වා ගැනීම.

ඉහත දක්වා ඇති පරිදි, රාජ්‍ය මූල්‍ය ගමන් මඟ මූලික වශයෙන් පදනම් වී ඇත්තේ බදු ප්‍රතිපත්තිය මෙන්ම බදු පරිපාලනය සහ රාජ්‍ය වියදම් විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ආදායම් ඉහළ නැංවීමේ උපායමාර්ග මත ය. රාජ්‍ය මූල්‍ය දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා, රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රයත්නයන්, ශක්තිමත් ආයතනික රාමුව, ඩිජිටල්කරණය, ඩිජිටල් පද්ධති සහ දත්ත ඒකාබද්ධ කිරීම, වැඩිදියුණු කළ පාලනය හා වර්ධනය සහ ආර්ථිකයේ ස්ථාවරත්වය සහාය වනු ඇත.

### 1.3.2 මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව

මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව පහත සඳහන් කරුණු මත රඳා පවතී:

- 2025 වසරේ දී රාජ්‍ය ආදායම ද.දේ.නි. යෙන් සියයට 15 දක්වා ඉහළ නැංවීම සහ එය මධ්‍ය කාලීනව ක්‍රමිකව ඉහළ නැංවීම.

- ප්‍රාථමික වියදම ද.දේ.නි. යෙන් සියයට 13 ක් යටතේ පවත්වා ගැනීම සහ රාජ්‍ය ආයෝජන ද. දේ.නි. යෙන් සියයට 4 කට වඩා ඉහළ මට්ටමක පවත්වා ගැනීම.

- 2025 වසරේ දී අවම වශයෙන් ද.දේ.නි. යෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් ළඟාකර ගැනීම සහ කාලයත් සමඟ එම මට්ටම හෝ ඊට වැඩි මට්ටමක පවත්වා ගැනීම.

- 2026 වසරේ සහ ඉන් ඔබ්බට අයවැය හිඟය ද. දේ. නි. යෙන් සියයට 5 ට අඩු මට්ටමකට සීමා කිරීම.

- 2026 වසරේ දී ද. දේ. නි. යෙන් සියයට 96.8 ක් ලෙස වාර්තා වූ මධ්‍යම රජයේ ණය ප්‍රමාණය 2030 වසර වන විට ද. දේ. නි. යෙන් සියයට 87 ක් දක්වා ක්‍රමයෙන් තිරසාර මට්ටමකට ගෙන ඒම.

**1.1 වගුව : මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව : 2025 -2030**

*ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස*

| දර්ශකය | 2024 තාවකාලික | 2025 අයවැය | 2025 සංශෝධිත | 2026 | 2027 | 2028 | 2029 | 2030 |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | පුරෝකථන | | | | |
| **මුළු ආදායම හා ප්‍රදාන** | **13.7** | **15.1** | **15.9** | **15.4** | **15.5** | **15.5** | **15.5** | **15.5** |
| **මුළු ආදායම** | **13.5** | **15.0** | **15.9** | **15.3** | **15.4** | **15.4** | **15.4** | **15.5** |
| **බදු ආදායම** | **12.4** | **13.9** | **14.8** | **14.2** | **14.4** | **14.4** | **14.3** | **14.4** |
| ආදායම් බදු | 3.4 | 3.5 | 3.5 | 3.5 | 3.6 | 3.6 | 3.6 | 3.7 |
| භාණ්ඩ හා සේවා බදු | 7.4 | 8.4 | 9.2 | 8.9 | 8.9 | 8.9 | 8.7 | 8.7 |
| විදේශ වෙළඳාම සඳහා බදු | 1.6 | 2.0 | 2.0 | 1.9 | 1.9 | 1.9 | 2.0 | 2.0 |
| **බදු නොවන ආදායම** | **1.1** | **1.1** | **1.1** | **1.0** | **1.0** | **1.1** | **1.1** | **1.1** |
| **ප්‍රදාන** | **0.2** | **0.1** | **0.1** | **0.1** | **0.1** | **0.1** | **0.1** | **0.1** |
| **මුළු වියදම** | **20.5** | **21.8** | **20.5** | **20.5** | **20.0** | **19.8** | **19.6** | **19.4** |
| **වර්තන වියදම** | **17.9** | **17.8** | **17.3** | **16.5** | **15.9** | **15.7** | **15.5** | **15.2** |
| වැටුප් හා වේතන | 3.6 | 3.7 | 3.8 | 3.8 | 3.8 | 3.8 | 3.8 | 3.8 |
| භාණ්ඩ හා සේවා | 1.2 | 1.3 | 1.2 | 1.2 | 1.2 | 1.2 | 1.2 | 1.2 |
| පොළී ගෙවීම් | 9.0 | 8.9 | 8.3 | 7.6 | 7.1 | 6.9 | 6.7 | 6.5 |
| සහනාධාර සහ මාරුවීම් | 4.1 | 3.9 | 4.0 | 3.9 | 3.8 | 3.8 | 3.7 | 3.7 |
| **ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම** | | | | | | | | |
| රාජ්‍ය ආයෝජන | 2.6 | 4.0 | 3.2 | 4.0 | 4.0 | 4.1 | 4.2 | 4.2 |
| **ජංගම ගිණුමේ අතිරික්තය** | **(4.4)** | **(2.8)** | **(1.4)** | **(1.2)** | **(0.5)** | **(0.3)** | **(0.0)** | **0.3** |
| **ප්‍රාථමික අතිරික්තය** | **2.2** | **2.3** | **3.8** | **2.5** | **2.6** | **2.6** | **2.6** | **2.6** |
| **අයවැය අතිරික්තය** | **(6.8)** | **(6.7)** | **(4.5)** | **(5.1)** | **(4.5)** | **(4.3)** | **(4.1)** | **(3.8)** |

*මූලාශ්‍ර : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි වැඩසටහනේ පරාමිතීන්*

### 1.3.3 රාජ්‍ය මූල්‍ය රාමුවේ දක්වන ලද ඉලක්කයන්ගෙන් සිදු වූ අපගමනයන් සඳහාවන සාධාරණීකරණය

**රාජ්‍ය ආදායම:**

2025 වසරේ දී රාජ්‍ය ආදායම ද. දේ. නි. යෙන් සියයට 15 ක් දක්වා ඉහළ නැංවීම සහ මධ්‍ය කාලීනව එහි වර්ධනයක් පවත්වාගෙන යාම රාජ්‍ය ආදායම සඳහා වන ඉලක්කය විය. වගුව 1.1 දක්වා ඇති පරිදි 2025 වසර සඳහා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව ද.දේ.නි. යෙන් සියයට 15.9 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර එය මූලික අයවැය ඉලක්කය ඉක්මවා ගොස් ඇත. ඵලදායී ආදායම් පියවරන් සහ අනුකූලතාවය වැඩිදියුණු වීම පිළිබිඹු කරමින් විශේෂයෙන් භාණ්ඩ හා සේවා (ද. දේ. නි. යෙන් සියයට 9.2 ක්) සහ මෝටර් රථ ආනයනයන්ගෙන් අපේක්ෂිත ප්‍රමාණයට වඩා බදු ආදායම් ඉහළයාම මෙම ධනාත්මක වෙනසට හේතු විය. බදු අනුපාත ඉහළ නැංවීම බදු පදනම පුළුල් කිරීම සහ ආදායම් පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා දරන ප්‍රයත්නයන් සමඟ සමපාත වේ.

**ප්‍රාථමික අතිරික්තය:**

2025 වසරේ දී ද. දේ. නි. යෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් මෙම මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව මඟින් ඉලක්ක කරන ලදී. වගුව 1.1 මඟින් 2025 වසර සඳහා ද. දේ. නි. යෙන් සියයට 3.8 ක ඉලක්කය ඉක්මවා ගිය ප්‍රාථමික අතිරික්තයක් පෙන්වයි. ප්‍රාග්ධන වියදම් නිසි පරිදි ක්‍රියාත්මක නොවීමත් ඊට සමගාමීව ඉහළ ආදායම් එක් රැස් කිරීමත් මෙම ධනාත්මක වෙනස සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර එය අපේක්ෂා කළ ප්‍රමාණයටත් වඩා ඉහළ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයක් පෙන්නුම් කරනු ලබයි.

**අයවැය හිඟය:**

2026 වසර වන විට ද. දේ. නි. යෙන් සියයට 5 කට අඩු අගයක අයවැය හිඟය පවත්වා ගැනීම ඉලක්කය විය. 2025 වසර සඳහා සංශෝධිත අයවැය හිඟය ද. දේ. නි. යෙන් සියයට 4.5 ක් වන අතර එමඟින් වේගවත් රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධවීමක් පිළිබිඹු කරනු ලබයි. මෙම ඉලක්කය ඉක්මනින් සාක්ෂාත් කර ගැනීම තුළින් ආදායම් ඉහළ නැංවීමේ පියවරවල සඵලදායීතාවය සහ වියදම් කළමනාකරණය කිරීමේ විචක්ෂණශීලී බව පෙන්නුම් කරයි.

# II කොටස

## අයවැය, ආර්ථිකය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2026

### 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49 වැනි වගන්තිය යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් නිකුත් කරන ලදී.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49 වන වගන්තිය අනුව විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දෙවන වර කියවීම සඳහා නියම කර ඇති දිනයේ දී මෙම වාර්තාව සෑම වසරකම පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට ගරු මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතුය.

ඊට අනෙකුත් තොරතුරුවලට අමතරව දළ දේශීය නිෂ්පාදිතය, පාරිභෝගික මිල ගණන්, රැකියාව සහ විරැකියාව, ගෙවුම් ශේෂය, ආදායම් හා වියදම්, ආණ්ඩුව විසින් ගනු ලබන ණය සම්බන්ධ ඇස්තමේන්තු හා ඉහත සඳහන් ඇස්තමේන්තු පදනම් වූ සාධක අන්තර්ගත වේ. මෙම වාර්තාවේ අන්තර්ගත තොරතුරු, හැකිතාක් දුරට, මූල්‍ය සහ ආර්ථික තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කෙරෙන ආණ්ඩුවේ සියලුම තීරණ හා වෙනත් සියලු පරිවේෂණ සැලකිල්ලට ගෙන ඇත.

# රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය

# 02

## 2.1. සමාලෝචනය

දූරදර්ශී ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම හේතුවෙන් රාජ්‍ය ආදායම කැපී පෙනෙන ලෙස වර්ධනය වීම සහ රජයේ දූෂණ විරෝධී ක්‍රියාවලිය මඟින් පුනර්ජීවනය ලබමින් රජයේ පුනරාවර්තන වියදම් විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම හේතුවෙන් 2025 වසරේ පළමු මාස අට තුළ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. කෙසේ වුවද, 2025 වසරේ පළමු මාස හතර තුළ අතුරු සම්මත ගිණුමක් යටතේ අයවැය මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් දැරීම පහළ මට්ටමක පැවතුණි. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ සැප්තැම්බර් මාසය සඳහා වන ඉලක්කය ලෙස නියම කර තිබූ රු. බිලියන 300 ක ප්‍රාථමික ශේෂය සඳහා වන ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායකය ඉක්මවා යමින් ප්‍රාථමික අතිරික්තය 2024 වසරේ පළමු මාස අට තුළ පැවැති රු. බිලියන 648.8 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු.බිලියන 1,276.5 දක්වා සැළකිය යුතු ලෙස වර්ධනය විය. මෙලෙස වර්ධනය වූ ප්‍රාථමික අතිරික්තය ණය සේවා ගෙවීම් සඳහා සැළකිය යුතු ස්වාරක්ෂකයක් සපයමින්, රජයේ ණය ගැනීම සඳහා වන බාධාවන් සමනය කිරීම සඳහා උපකාරී විය. ප්‍රාථමික අතිරික්තය, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3 ක 2025 වසර සඳහා වන ඉලක්කය ඉක්මවා යනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමඟින් දිගුකාලීන ණය තිරසාරභාවය සඳහා වන මාර්ගය සහතික කෙරෙනු ඇත. ණය ව්‍යුහය කාලයත් සමඟ වෙනස් වීමෙහි වර්ධනයක් දක්නට ලැබුණු අතර සමස්ත අයවැය හිඟය 2024 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 911.0 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 411.0 දක්වා සියයට 54.9 කින් අඩු විය.

ප්‍රදාන ද ඇතුළු රජයේ සමස්ත ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ පැවැති රු. බිලියන 2,565.9 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3,301.5 දක්වා සියයට 28.7 කින් වර්ධනය විය. මෙය රු. බිලියන 4,990.0 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 66.2 ක ආදායම් ලඟා කර ගැනීමකි. 2025 වසරේ පළමු මාස අට තුළ දී බදු ආදායම රු. බිලියන 3,068.5 ක් දක්වා සියයට 30.7 කින් වර්ධනය වී ඇති අතර, බදු නොවන ආදායම රු. බිලියන 226.2 දක්වා සියයට 8.1 කින් වර්ධනය විය.

**2.1 වගුව : රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය**

*රු. මිලි.*

| අයිතම | ජනවාරි - අගෝස්තු | |
|---|---|---|
| | 2024 | 2025 (අ) |
| **ආදායම් හා ප්‍රදාන** | **2,565,921** | **3,301,459** |
| ආදායම | 2,557,792 | 3,294,740 |
| බදු | 2,348,529 | 3,068,495 |
| බදු නොවන | 209,263 | 226,244 |
| ප්‍රදාන | 8,129 | 6,720 |
| **වියදම්** | **3,476,885** | **3,712,492** |
| **පුනරාවර්තන** | **3,041,565** | **3,381,309** |
| වැටුප් | 659,502 | 760,687 |
| පොලී ගෙවීම් | 1,559,721 | 1,687,571 |
| අනෙකුත් | 822,342 | 933,051 |
| රාජ්‍ය ආයෝජන | 454,744 | 338,846 |
| අනෙකුත් | -19,424 | -7,663 |
| **ආදායම් හිඟය (-)/අතිරික්තය (+)** | **-483,773** | **-86,569** |
| **ප්‍රාථමික හිඟය (-)/අතිරික්තය (+)** | **648,757** | **1,276,538** |
| **සමස්ත අයවැය හිඟය (-)/අතිරික්තය (+)** | **-910,965** | **-411,033** |
| **මූල්‍යයනය** | **910,965** | **411,033** |
| විදේශ මූල්‍යයනය (ශුද්ධ) | 168,551 | -51,849 |
| දේශීය මූල්‍යයනය (ශුද්ධ) | 742,414 | 462,882 |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

(අ) *තාවකාලික*

පුළුල් බදු ප්‍රතිපත්තිය සහ බදු පදනම පුළුල් කිරීම ඉලක්ක කරගත් පරිපාලනමය ක්‍රියාමාර්ග සමඟින් එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම, ආදායම් බදු සහ මෝටර් රථ සඳහා වන බදු මඟින් ලද ආදායම ඉහළ යාම, 2025 වසරේ පළමු මාස අට තුළ රජයේ ආදායම විශාල වශයෙන් වර්ධනය වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2024 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 2,348.5 ක් වූ සමස්ත බදු ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු.බිලියන 3,068.5 දක්වා සියයට 30.7 කින් වර්ධනය විය. මෙම අගය මඟින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ 2025 වසරේ සැප්තැම්බර් මස අග වන විට ලඟා කර ගැනීමට නියමිත බදු ආදායමට අදාළ ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායකය වන රු.බිලියන 2,750, රු.බිලියන 318.5 කින් ඉක්මවා ගොස් ඇත. මෙලෙස ආදායම වර්ධනය වීම සඳහා රටේ ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම මෙන්ම, 2025 වසරේ පළමු මාස අට තුළ සිදු කරන ලද ප්‍රතිපත්තිමය සහ පරිපාලනමය වෙනස්කම් ද දායක විය. එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ පැවැති රු. බිලියන 842.5 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,084.2 දක්වා සියයට 28.7 කින් වර්ධනය විය. ආනයන සීමා ඉවත් කිරීම හේතුවෙන් ආනයනික මෝටර් රථ වාහන මඟින් ඉහළ එකතු කළ අගය මත බදු ආදායමක් හිමි වීම, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව වසරකට රු.මිලියන 80 සිට රු. මිලියන 60 දක්වා පහත හෙළීම සහ එකතු කළ අගය මත බද්ද සඳහා වන බදු අනුපාත සියයට 15 සිට සියයට 18 දක්වා ඉහළ නැංවීමෙහි සම්පූර්ණ බලපෑම සහ දේශීය ආර්ථිකයේ ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම මෙම ඉහළ ආදායම සඳහා විශාල වශයෙන් බලපෑ අතර එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම සමස්ත බදු ආදායමෙන් සියයට 35.3 ක් නියෝජනය කරමින් බදු ආදායම සඳහා විශාලම දායකත්වය දක්වන ලදී. සමස්ත බදු ආදායමෙන් සියයට 22.9 ක් සඳහා දායකත්වය දක්වමින් ආදායම් බද්දෙන් ලද ආදායම දෙවන ස්ථානයට විශාලතම දායකත්වය දක්වන ලද අතර සමස්ත බදු ආදායමෙන් සියයට 19.8 ක් නිෂ්පාදන බද්දෙන් ලද ආදායම නියෝජනය කරන ලදී. ආර්ථිකයේ ක්‍රියාකාරකම් පුළුල් වීම, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් වැඩිවීම සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලනය ශක්තිමත් වීම මඟින් අනුකූලතාව වර්ධනය වීම හේතුවෙන් ආදායම් බදු ආදායම ඉහළ යන ලදී. මෝටර් රථ, මත්පැන් සහ අනෙකුත් නිෂ්පාදන බදු අය කළ හැකි භාණ්ඩවලින් ඉහළ ආදායම් එකතු වීම හේතුවෙන් නිෂ්පාදන බද්ද මඟින් ලද ආදායම වර්ධනය විය.

2025 වසරේ දී, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතන ආදායම, අනුකූලතාවය, විනිවිදභාව ඉහළ නැංවීම සහ දූෂණ අවදානම් අවම කිරීම වැඩිදියුණු කිරීම සඳහා ප්‍රධාන පරිපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. මීට අමතරව, මෙම ප්‍රධාන ආදායම් එකතු කරන ආයතන තුන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිසංස්කරණ වැඩසටහනට අනුකූලව දූෂණ විරෝධී ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවා ඇත. දූෂණ අවදානම් අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල කාර්තුමය ප්‍රගති වාර්තා 2025 වසරේ අගෝස්තු මාසයේ සිට මුදල් අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කර ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ස්වයංක්‍රීයකරණය සහ ඩිජිටල්කරණය, විධිමත් ආචාර ධර්ම පද්ධතියක් සංවර්ධනය කිරීම හා අනුගමනය කිරීම සහ පවතින අවදානම් කළමනාකරණ ඒකකයේ ධාරිතාව වැඩිදියුණු කිරීම වැනි දූෂණ විරෝධී ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවා ඇත. ශ්‍රී ලංකා රේගුව විසින් ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම, අභ්‍යන්තර කටයුතු පිළිබඳ ඒකකයක් ස්ථාපනය කිරීම, ඩිජිටල්කරණය පිළිබඳ සමූහයක් ස්ථාපනය කිරීම සහ රේගු ප්‍රකාශනය පිළිබඳ විමර්ශනය කිරීමේ පද්ධතියක් සහ වාහනවල විස්තර පරීක්ෂා කර බලා සත්‍යාපනය කිරීම පිළිබඳ මාර්ගගත ක්‍රමවේදයක් හඳුන්වාදීම ඇතුළු ඉලක්කගත දූෂණ විරෝධී ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. සුරාබදු දෙපාර්තමේන්තුව ආයතනය තුළ පවතින දූෂණ අවදානම් වැළැක්වීම, හඳුනාගැනීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ එක්ව වැඩසටහන් මාලාවක් ආරම්භ කර ඇත. මෙම ප්‍රධාන ක්‍රියාමාර්ග අතර, විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම සහ සහතික කිරීම සඳහා වගකිව යුතු නිලධාරියෙකු පත් කිරීම, දැනුවත් කිරීමේ සහ වැළැක්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අභ්‍යන්තර කටයුතු ඒකකයක්, අවදානම් කළමනාකරණ ඒකකයක් සහ මූල්‍ය විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරීම ආදිය ඇතුළත් වේ.

එකතු කළ අගය මත බදු අනුකූලතාවය වැඩිදියුණු කිරීම සඳහා සුදුසුකම් ලත් අපනයනකරුවන් සහ ඔවුන්ගේ සැපයුම්කරුවන් වෙත සම්මත එකතු කළ අගය මත බදු මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලියකට මාරුවෙමින්, සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය 2025 වසරේ ඔක්තෝබර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වීම අත්හිටුවා ඇත. මේ අතර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය නිරීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුන්වා දී ඇත.

එලෙසම, එකතු කළ අගය මත බද්දෙහි අනුකූලතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන 2025 වසරේදීත් අඛණ්ඩව ක්‍රියාත්මක විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සංඛ්‍යාව 21,542 ක් වූ අතර එය 2025 වසරේ සැප්තැම්බර් මස අග වන විට 31,134 ක් දක්වා සියයට 44.5 කින් වර්ධනය විය. බදු

අනුකූලතාව ඉහළ නැංවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යකාලීන නවීකරණ උපායමාර්ගය සහ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සමඟින් එකතු කළ අගය මත බදු අනුකූලතාව වැඩිදියුණු කිරීමේ සැලැස්ම හඳුන්වා දී ඇත. මේ අතර, ඉහළ වත්කම් සහිත පුද්ගලයන්ගේ ඒකකය මඟින් බදු විගණන සිදු කර එම පුද්ගලයන්ගේ ආවරණය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

රාජ්‍ය වියදම 2024 වසරේ පළමු මාස අට තුළ පැවැති රු. බිලියන 3,476.9 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3,712.5 දක්වා සියයට 6.8 කින් සුළු වශයෙන් වැඩි විය. පුනරාවර්තන වියදම් 2024 වසරේ පළමු මාස අට තුළ පැවැති රු. බිලියන 3,041.6 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු.බිලියන 3,381.3 දක්වා සියයට 11.2 කින් වැඩි විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම පොලී ගෙවීම් සඳහා වන වියදම රු. බිලියන 1,687.6 දක්වා සියයට 8.2 කින් වැඩි වීම, 2025 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය අංශයේ මූලික වැටුප් සංශෝධනයට ලක් කිරීම හේතුවෙන් වැටුප් හා වේතන රු.බිලියන 760.7 දක්වා සියයට 15.3 කින් වැඩි වීම, සහනාධාර හා පැවරුම් රු.බිලියන 722.4 දක්වා සියයට 15.8 කින් වැඩි වීම සහ කුටුම්භ සඳහා පැවරුම් රු.බිලියන 647.2 දක්වා සියයට 16.5

**2.2 වගුව : ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම - 2025**

*රු. බිලි.*

| අයිතමය | වාර්ෂික ඇස්තමේන්තුව | ජන. - අගෝ. තාවකාලික | ළඟා කර ගැනීම (%) |
|---|---|---|---|
| **මුළු ආදායම** | **4,960.0** | **3,294.8** | **66.4** |
| **බදු ආදායම** | **4,590.0** | **3,068.5** | **66.9** |
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව** | | | |
| ආදායම් සහ ලාභ මත බද්ද | 1,167.0 | 702.4 | 60.2 |
| එකතු කල අගය මත බද්ද - දේශිය (ශුද්ධ) | 825.0 | 567.5 | 68.8 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (දේශීය) | 190.0 | 145.8 | 76.7 |
| වෙනත් | 13.2 | 10.7 | 80.8 |
| **උප එකතුව** | **2,195.2** | **1,426.3** | **65.0** |
| **ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව** | | | |
| එකතු කල අගය මත බද්ද - ආනයන (ශුද්ධ) | 790.0 | 516.8 | 65.4 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (ආනයන) | 74.00 | 45.0 | 60.9 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද | 185.0 | 115.9 | 62.6 |
| සෙස් බද්ද | 100.0 | 56.5 | 56.5 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 126.0 | 103.6 | 82.3 |
| ආනයන බද්ද | 240.0 | 151.0 | 62.9 |
| **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද** | | | |
| දුම්වැටි | 130.0 | 61.9 | 47.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 230.0 | 120.8 | 52.5 |
| මොටර් වාහන සහ අනෙකුත් | 239.0 | 278.6 | 116.6 |
| වෙනත් | 1.0 | 6.1 | 592.5 |
| **උප එකතුව** | **2,115.0** | **1,456.3** | **68.9** |
| **සුරාබදු දෙපාර්තමේන්තුව** | | | |
| මත්පැන්/දුම්කොළ | 242.0 | 146.6 | 60.6 |
| **උප එකතුව** | **242.0** | **146.6** | **60.6** |
| **අනෙකුත්** | | | |
| විදුලි සංදේශ බද්ද | 18.0 | 10.6 | 58.6 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 19.7 | 28.8 | 145.7 |
| **උප එකතුව** | **37.7** | **39.3** | **104.2** |
| **බදු නොවන ආදායම** | **370.0** | **226.2** | **61.1** |
| **මුළු වියදම** | **7,190.0** | **3,712.5** | **51.6** |
| **වර්තන වියදම** | **5,886.0** | **3,381.3** | **57.4** |
| වැටුප් හා වේතන | 1,230.0 | 760.7 | 61.8 |
| පොලී ගෙවීම | 2,950.0 | 1,687.6 | 57.2 |
| විශ්‍රාම වැටුප් ගෙවීම | 442.0 | 282.9 | 64.0 |
| රාජ්‍ය සංස්ථා සහ ආයතනවලට පැවරුම් | 172.0 | 75.2 | 43.7 |
| අනෙකුත් | 1,092.0 | 575.0 | 52.7 |
| **ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය** | **1,304.0** | **331.2** | **25.4** |

*මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

කින් වැඩි වීම සහ භාණ්ඩ හා සේවා මත වියදම් රු.බිලියන 210.6 දක්වා සියයට 6.1 කින් වැඩි වීම හේතු විය. 2025 වසරේ පළමු මාස අට තුළ සමස්ත පොලී වියදමෙන් සියයට 86.9 ක් සඳහා දායකත්වය දක්වන දේශීය ණය ගැනීම් මත වූ පොලී ගෙවීම් රු. බිලියන 1,687.6 දක්වා සියයට 0.5 කින් ඉතා සුළු වශයෙන් වැඩි වූ අතර විදේශීය ණය ගැනීම් මත වූ පොලී වියදම රු.බිලියන 221.1 දක්වා සියයට 121.1 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. මෙලෙස විදේශීය ණය ගැනීම් මත පොලී ගෙවීම් සැළකිය යුතු ලෙස ඉහළ යාම සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව චීන සංවර්ධන බැංකුව,ජපාන රජය, ඉන්දියානු අපනයන හා ආනයන බැංකුව ආදියෙන් ලබා ගත් ණය හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලට අදාළව සැබෑ පොලී ගෙවීම් නැවත ආරම්භ කිරීම ප්‍රධාන වශයෙන්ම හේතු විය. 2025 වසරේ මුල් මාස අට තුළ රාජ්‍ය සේවකයින්ගේ වැටුප් හා වේතන වියදම රු. බිලියන 760.7ක් දක්වා සියයට 15.3 කින් ඉහළ ගොස් ඇත.

2025 වසරේ පළමු මාස අට තුළ අතුරු සම්මත ගිණුමක් යටතේ අයවැය මෙහෙයුම් සිදු කිරීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් ක්‍රියාත්මක වීම මන්දගාමී වීම හේතුකොටගෙන රාජ්‍ය ආයෝජන 2024 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 454.7 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 338.8 දක්වා සියයට 25.5 කින් අඩු විය. වාර්ෂික ඇස්තමේන්තුවට සාපේක්ෂව රාජ්‍ය ආයෝජනවල ලඟා කර ගැනීම සියයට 25.8 ක් ලෙස සැළකිය යුතු තරම් අඩු මට්ටමක පැවතුණි. මේ තත්ත්වයට විසඳුම් ලබා දීම සඳහා, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන යටතේ රාජ්‍ය ආයෝජන කමිටුවක් ස්ථාපිත කිරීම, මධ්‍යකාලීන රාජ්‍ය ආයෝජන වැඩසටහනක් සකස් කිරීම, ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීම ශක්තිමත් කිරීම සහ විනිවිදභාවය හා වාර්තාකරණය වැඩි දියුණු කිරීම වැනි ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත.

සමස්ත අයවැය හිඟය 2024 වසරේ පළමු මාස අට තුළ පැවැති රු.බිලියන 911.0 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 411.0 දක්වා සියයට 54.9 දක්වා සැළකිය යුතු ලෙස අඩු විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ රාජ්‍ය ආදායමෙහි ඉහළ කාර්යසාධනය වන අතර සමස්ත ආදායම රු. බිලියන 3,294.7 දක්වා සියයට 28.8 කින් වර්ධනය වීම සඳහා ආදායම් බදු, භාණ්ඩ හා සේවා මත බදු, සහ විදේශ වෙළෙඳාම මත බදු මඟින් විශාල වශයෙන් ආදායම් එකතු කිරීම හේතු විය. මේ අතර, 2025 වසරේ දී වැටුප් වැඩිවීම හේතුවෙන් පුනරාවර්තන වියදම් ඉහළ ගියද එම වියදම් තාර්කීකරණය කිරීම සඳහා අඛණ්ඩ උත්සාහයන් දරන ලද අතර ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් රු. බිලියන 331.2 ක් ලෙස පහළ මට්ටමක පැවතුණි.

## 2.2 රජයේ ආදායම

බදු ආදායම රු. බිලියන 2,348.5 සිට රු. බිලියන 3,068.5 දක්වා සියයට 30.7 කින් වැඩිවීම හේතුවෙන් ප්‍රදාන රහිත රජයේ සමස්ථ ආදායම 2024 වසරේ මුල් මාස අට තුළ දී වූ රු. බිලියන 2,557.8 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3,294.7 ක් දක්වා සියයට 28.8 කින් සැලකිය වර්ධනයක් පෙන්නුම් කරන අතර එය 2025 වසර සඳහා වන ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 66.4 ක ලඟාකර ගැනීමකි. බදු ආදායම එකතු කිරීම සමස්ථ ආදායමෙන් සියයට 93.1 කට දායක වූ අතර එය 2025 වසර සඳහා වූ ඇස්තමේන්තුවෙන් සියයට 66.9 ක ලඟාකර ගැනීමකි.

බදු ආදායමේ ඉහළ යාමට හේතු වූයේ:

1. 2025 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක කරන ලද පුද්ගල ආදායම් බදු, සංස්ථාපිත ආදායම් බදු, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ රඳවා ගැනීමේ බදු ප්‍රතිපත්තීන්හි සිදුකළ වෙනස්කම්වල බලපෑම, රාජ්‍ය හා අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් වැඩිවීමේ බලපෑම, ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනය වීමේ ධනාත්මක බලපෑම සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීමේ පියවරවල ධනාත්මක බලපෑම මත ආදායම් බදු තුළින් ලද ආදායම සියයට 12.4 කින් එනම් රු. බිලියන 77.7 කින් වැඩිවීම;

2. එකතුකළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම, වැට් බදු ලියාපදිංචි කිරීමේ සීමාව වසරකට රු. මිලියන 80 සිට රු. මිලියන 60 දක්වා අඩු කිරීම සහ බදු පරිපාලන පියවරයන්, 2025 වසරේ පෙබරවාරි 01 දින සිට සියලුම වර්ගයේ මෝටර් රථ වාහන ආනයන සීමා ලිහිල් කිරීම හේතුවෙන් ආනයන මත එකතුකළ අගය මත බද්ද සියයට 38.3 කින් එනම් රු. බිලියන 516.8 දක්වා වැඩිවීම සහ දේශීය ක්‍රියාකාරකම් එකතුකළ අගය මත බද්ද සියයට 21.1 කින් එනම් රු. බිලියන 567.5 දක්වා වැඩිවීම හේතුවෙන් සමස්ථ එකතුකළ අගය මත බද්ද සියයට 28.7 කින් එනම් රු. බිලියන 241.8 කින් ඉහළ යාමයි. මූල්‍ය සේවා හැර ලියාපදිංචි බදු ගොනු සංඛ්‍යාව 2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ ගොනු 19,987 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ගොනු 29,960 දක්වා සියයට 49.9 කින් ඉහළ යාමක් පිළිබිඹු වේ;

3. 2025 වසරේ පෙබරවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි සියලු වර්ගවල මෝටර්

**2.1 රූපසටහන : මුළු ආදායම් සංයුතිය (%) (2025 ජනවාරි - අගෝස්තු)**




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

රථ වාහන සඳහා ආනයන සීමාවන් නිදහස් කිරීමත් සමඟ මෝටර් රථ වාහන ආනයනය වැඩිවීමේ බලපෑම සහ 2025 වසරේ ජනවාරි 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෝටර් රථ වාහන සඳහා උද්ධමනයට අනුකූලව දර්ශකගත කල නිෂ්පාදන බදු අනුපාත සියයට 5.9 කින් වැඩි කිරීම හේතුවෙන් මෝටර් රථ වාහන සඳහා නිෂ්පාදන බදු සියයට 640.5 කින් එනම් රු. බිලියන 234.0 කින් වැඩිවීම;

4. 2025 ජනවාරි 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි උද්ධමනයට අනුකූලව දර්ශකගත කල මත්පැන් සඳහා සුරාබදු අනුපාත සියයට 5.9 කින් වැඩිවීම හේතුවෙන් මත්පැන් සඳහා සුරාබදු ආදායම සියයට 9.1 කින් එනම් රු. බිලියන 12.1 කින් වැඩි විම;

5. අර්තාපල් සහ බී ළූණු සඳහා බදු අනුපාත ඉහළ නැංවීම සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට යටත් ප්‍රධාන භාණ්ඩවල ආනයන පරිමාව වැඩිවීම හේතුවෙන් විශේෂ වෙළඳ භාණ්ඩ බදු ආදායම සියයට 54.2 කින් එනම් රු. බිලියන 36.4 කින් වැඩි වීම;

6. ආර්ථික ක්‍රියාකාරකම්වල වැඩිවීම සහ වැඩිදියුණු කළ බදු පරිපාලන පියවරයන් හේතුවෙන් ලියාපදිංචි බදු ගොනු සංඛ්‍යාව 2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ ගොනු 11,083 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලච්ඡේදය තුළ ගොනු 14,898 දක්වා සියයට 34.4 දක්වා වැඩිවීම හේතුවෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම සියයට 18.8 කින් එනම් රු. බිලියන 30.2 කින් වැඩිවීම;

7. මෝටර් රථ වාහන සඳහා රේගු ආනයන බද්ද සියයට 20.0 ක් කිරීම හා අදාළ කාලපරිච්ඡේදය තුළ භාණ්ඩ ආනයනය වැඩිවීම හේතුවෙන් රේගු ආනයන බදු සියයට 117.5 කින් එනම් රු. බිලියන 81.6 කින් වර්ධනය වීම; සහ

8. ආනයන වැඩිවීම හේතුවෙන් සෙස් බද්දෙන් ලද ආදායම සියයට 8.8 කින් එනම් රු. බිලියන 4.6 කින් වැඩිවීම.

2025 වසරේ මුල් මාස අට තුළ බදු නොවන ආදායම සියයට 8.1 කින් එනම් රු. බිලියන 17.0 කින් වැඩිවීම ද ආදායම් වැඩිවීමට ධනාත්මක බලපෑමක් ඇති කළේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොලී ආදායම, කුලී ආදායම, දඩ මුදල්, ගාස්තු හා අයකිරීම් සහ සමාජ ආරක්ෂණ දායකත්වයෙන් ලැබෙන ආදායම වැඩිවීමයි.

**2.3 වගුව : රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය**

*රු. මිලි.*

| අයිතම | ජන. - අගෝ. 2024 | ජන. - අගෝ. 2025(අ) | වෙනස (%) |
|---|---|---|---|
| **බදු ආදායම** | **2,348,529** | **3,068,495** | **30.7** |
| **ආදායම් බදු** | **624,670** | **702,351** | **12.4** |
| **දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු** | **801,586** | **929,865** | **16.0** |
| එකතු කල අගය මත බද්ද (වැට්) | 468,759 | 567,470 | 21.1 |
| නිෂ්පාදන/සුරා බද්ද | 209,910 | 216,614 | 3.2 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 122,917 | 145,781 | 18.6 |
| **ආනයන මත පදනම් වූ බදු** | **889,813** | **1,380,169** | **55.1** |
| ආනයන බද්ද | 69,419 | 150,988 | 117.5 |
| එකතු කල අගය මත බද්ද (වැට්) | 373,728 | 516,778 | 38.3 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 37,737 | 45,032 | 19.3 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද | 113,926 | 115,886 | 1.7 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 67,222 | 103,641 | 54.2 |
| නිෂ්පාදන/සුරා බද්ද | 175,830 | 391,313 | 122.6 |
| සෙස් බද්ද | 51,951 | 56,529 | 8.8 |
| **බලපත්‍ර ගාස්තු සහ අනෙකුත්** | **32,460** | **56,110** | **72.9** |
| **බදු නොවන ආදායම** | **209,263** | **226,244** | **8.1** |
| **මුළු ආදායම** | **2,557,792** | **3,294,740** | **28.8** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

**2.2 රූපසටහන : මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම (%) (2025 ජනවාරි - අගෝස්තු)**




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**ආදායම් බදු**

2024 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 624.7 ක් වූ ආදායම් බද්දෙන් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 702.4 ක් දක්වා සියයට 12.4 කින් වර්ධනය වූ අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 60.2 ක ළඟා කර ගැනීමකි. බදු අනුකූලතාවය වැඩිදියුණු කිරීම් සහ බදු නිදහස් කිරීම ඉවත් කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම බලපා ඇත.

අත්තිකාරම් පුද්ගල බද්දෙන් ලද ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ වාර්තා කළ රු.බිලියන 134.0 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය

තුළ රු. බිලියන 143.9 ක් දක්වා සියයට 7.4 කින් වැඩි විය. 2025 වසරේ පළමු මාස අට තුළ අත්තිකාරම් පුද්ගල බද්දෙන් එකතු වූ ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 92.3 ක ළඟා කර ගැනීමකි.

2024 වසරේ පළමු මාස අටට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිඡේදය තුළ පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම සියයට 36.2 කින් වර්ධනය වී ඇත. ප්‍රධාන වශයෙන්, 2025 ජනවාරි මස සිට රාජ්‍ය අංශයේ වැටුප් වැඩි වීම් හා 2025 අප්‍රේල් මස සිට පෞද්ගලික අංශයේ අවම වැටුප් මට්ටම ඉහළ දැමීම මෙයට හේතු විය. 2024 වසරේ පළමු මාස අටට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිඡේදය තුළ දී සංස්ථාපිත බදු ආදායම රු.බිලියන 345.3 සිට රු. බිලියන 397.3 දක්වා සියයට 15.1 කින් වර්ධනය විය. 2025 අප්‍රේල් මස පළමු වන දින සිට ක්‍රියාත්මක කරන ලද මත්පැන්, දුම්කොළ ඔට්ටු සහ සූදු කර්මාන්ත සඳහා සංස්ථාපිත බදු අනුපාතය සියයට 40 සිට සියයට 45 දක්වා ඉහළ දැමීමත්, සේවා අපනයනය සඳහා සියයට 15 ක බදු අනුපාතයක් පැනවීමත් සමඟ ඉදිරි කාලපරිච්ඡේදයන්හිදී බදු පදනම පුළුල් වීම සහ විදේශ විනිමය ඉපැයීම් වර්ධනය වෙමින් පවතින ක්ෂේත්‍රයක් ග්‍රහණය කරගැනීම තුළින් සංස්ථාපිත බදු එකතු කිරීම තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2024 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 113.4 ක් වූ රඳවා ගැනීමේ බද්ද/ අත්තිකාරම් ආදායම් බද්දෙන් ලද ආදායම, 2025 වසරේ සමාන කාලපරිඡේදය තුළ දී රු. බිලියන 117.9 ක් දක්වා සියයට 3.9 කින් වර්ධනය විය. මෙය වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 230.0 න් සියයට 51.3 ක ළඟා කර ගැනීමකි. 2025 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වන පරිදි රඳවා ගැනීමේ බදු අනුපාතය සියයට 5.0 සිට සියයට 10.0 දක්වා ඉහළ දැමීම මෙහි වර්ධනයට බලපා ඇත.

**2.4 වගුව : ආදායම් බදු කාර්යසාධනය**

*රු. මිලි.*

| බදු පදනම | ජන. - අගෝ. 2024 | ජන. - අගෝ. 2025 (අ) | වෙනස (%) |
|---|---|---|---|
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන | 377,003 | 440,494 | 16.8 |
| උපයන විට ගෙවීම | 133,974 | 143,949 | 7.4 |
| පොළී ආදායම් මත බදු | 113,446 | 117,890 | 3.9 |
| ආර්ථික සේවා ගාස්තු | 248 | 19 | -92.3 |
| **එකතුව** | **624,670** | **702,351** | **12.4** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

### එකතු කළ අගය මත බද්ද

එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 842.5 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,084.2 දක්වා සියයට 28.7 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. 2025 වසරේ පළමු මාස අට තුළ දී දේශීය ක්‍රියාකාරකම් සහ ආනයන යන දෙආකාරයෙන්ම ලද එකතු කළ අගය මත බදු ආදායම වර්ධනය විය. දේශීය ආර්ථික කටයුතු ප්‍රසාරණය වීම හේතුවෙන් දේශීය ක්‍රියාකාරකම් මඟින් ලද එකතු කළ අගය මත බදු ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 468.8 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 567.5 දක්වා සියයට 21.1 කින් වැඩි විය. ආනයන මඟින් ලද එකතු කළ අගය මත බදු ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 373.7 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 516.8 දක්වා සියයට 38.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2025 වසරේ පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියලුම කාණ්ඩවල වාහන සඳහා ආනයන සීමාවන් ඉවත් කිරීමත් සමඟ ආනයනික වාහන වලින් ලද එකතු කළ අගය මත බදු ආදායම වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2025 වසරේ පළමු මාස අට තුළ සමස්ත ආදායම් කාර්ය සාධනය සඳහා එකතු කළ අගය මත බදු ආදායමේ දායකත්වය සියයට 32.9 ක් විය. 2025 වසරේ පළමු මාස අට තුළ ලද එකතු කළ අගය මත බදු ආදායම එහි වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 1,615.0 න් සියයට 67.1 ක ළඟාකර ගැනීමක් විය.

### නිෂ්පාදන බදු

දුම්වැටි සහ ඛනිජ තෙල් නිෂ්පාදන මඟින් ලද ආදායමේ සුළු අඩුවීමක් වාර්තා වුවද, මෝටර් වාහන, මත්පැන් සහ නිෂ්පාදන බද්දට යටත් අනෙකුත් අයිතම මඟින් ලැබුණු ආදායමේ ඉහළ වර්ධනය හේතුවෙන් සමස්ත නිෂ්පාදන/සුරාබදු ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 607.9 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 841.0 ක් දක්වා සියයට 57.6 කින් වර්ධනය විය. 2025 වසරේ මුල් මාස අට තුළ නිෂ්පාදන/සුරාබදු මඟින් ලද ආදායම බදු ආදායමෙන් සියයට 19.8 ක් සහ මුළු ආදායමෙන් සියයට 18.5 ක් වූ අතර වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 72.3 ක ළඟාකරගනිමකි.

**2.5 වගුව : එකතු කළ අගය මත බදු කාර්යසාධනය**

*රු. මිලි.*

| බදු පදනම | ජන. - අගෝ. | | වර්ධනය (%) |
|---|---|---|---|
| | 2024 | 2025 (අ) | |
| දේශීය | 468,759 | 567,470 | 21.1 |
| ආනයන | 373,728 | 516,778 | 38.3 |
| **ශුද්ධ ආදායම** | **842,488** | **1,084,248** | **28.7** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

මෝටර් වාහන මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2024 වසරේ පළමු මාස අට තුල වාර්තා වූ රු. බිලියන 36.5 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 270.5 දක්වා සියයට 640.5 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. මේ සඳහා 2025 වසරේ පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෝටර් රථ ආනයනය මත පනවා තිබූ තාවකාලික සීමාවන් ඉවත් කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය.

ඛනිජ තෙල් නිෂ්පාදනවලින් ලද අදායම 2024 වසරේ පළමු මාස අට තුල වාර්තා වූ රු. බිලියන 139.3 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 120.8 ක් දක්වා සියයට 13.3 කින් සැළකියයුතු ලෙස පහත වැටී ඇත. මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ගෝලීය ඉන්ධන මිල අඩුවීම, ඩීසල් ආනයන පරිමාවන් පහත වැටීම මෙන්ම ඇ. ඩොලරයට සාපේක්ෂව රුපියලේ වටිනාකම සුළු වශයෙන් ඉහළ යාමය.

සුරාබදු ආදායම 2024 වසරේ පළමු මාස අට තුල වාර්තා වූ රු. බිලියන 133.6 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 145.7ක් දක්වා සියයට 9.1 කින් වැඩි වූ අතර එය සමස්ත නිෂ්පාදන/සුරාබදු ආදායමෙන් සියයට 24.0 ක දායකත්වයකි. නිෂ්පාදන බදු උද්ධමනය සමඟ ගැලපුම් කිරීමේ ප්‍රතිපත්තියට අනුව, 2025 ජනවාරි මස 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සුරා බදු සියයට 5.9 කින් ඉහළ නංවන ලදී. 2025 වසරේ පළමු මාස අට තුළ සුරා බදු ආදායම 2025 වසරේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 60.7 ක ළඟා කර ගැනීමකි. 2024 වසරේ පළමු මාස අට තුළ නිෂ්පාදනය වූ නිරපේක්ෂ මධ්‍යසාර ලීටර මිලියන 21.4 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ නිරපේක්ෂ මධ්‍යසාර නිෂ්පාදනය ලීටර මිලියන 23.9 ක් දක්වා සියයට 11.5 කින් වැඩි විය. සැර මත්පැන් නිෂ්පාදනය නිරපේක්ෂ ලීටර මිලියන 14.1 දක්වා සියයට 15.9 කින් වැඩිවීමක් ද ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය නිරපේක්ෂ ලීටර මිලියන 9.6 ක් දක්වා සියයට 4.1 කින් සුළු වශයෙන් වැඩිවීමක් ද වාර්තා විය.

මේ අතර, පැණි රස පාන වර්ග, ශීතකරණ, පාම් තෙල් සහ මේද අම්ල ඇතුළු නිෂ්පාදන බද්දට යටත් අනෙකුත් අයිතම මඟින් ලද නිෂ්පාදන බදු ආදායම 2024 වසරේ පළමු මාස අට තුල වාර්තා වූ රු. බිලියන 4.7 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 8.1 ක් දක්වා සියයට 72.9 කින් සැළකියයුතු වැඩි විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ නිෂ්පාදන බදු උද්ධමනය සමඟ ගැලපුම් කිරීමේ ප්‍රතිපත්තියට අනුව ජනවාරි 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි සුරාබදු බදු අනුපාත සියයට 5.9 කින් ඉහළ නැංවීම මෙන්ම 2025 මුල් මාස අට තුළ ඉහළ ගිය ඉල්ලුම සහ ශක්තිමත් වූ ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙන් ඉහළ ගිය ආනයන හේතුවෙන්ය. කෙසේ වෙතත්, සිගරට් වලින් ලද ආදායම 2024 වසරේ පළමු මාස අට තුල වාර්තා වූ රු. බිලියන 71.6 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 62.8ක් දක්වා සියයට 12.3 කින් අඩු විය.

**2.6 වගුව : නිෂ්පාදන බදු / සුරාබදු කාර්යසාධනය**

*රු. මිලි.*

| බදු පදනම | ජන. - අගෝ. | | වර්ධනය (%) |
|---|---|---|---|
| | 2024 | 2025 (අ) | |
| මත්පැන් | 133,584 | 145,698 | 9.1 |
| දුම්වැටි/දුම්කොළ | 71,637 | 62,810 | -12.3 |
| මෝටර් වාහන | 36,532 | 270,526 | 640.5 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 139,298 | 120,787 | -13.3 |
| අනෙකුත් | 4,689 | 8,105 | 72.9 |
| **එකතුව** | **385,740** | **607,927** | **57.6** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

**2.3 රූපසටහන : නිෂ්පාදන බදු / සුරාබදු කාර්යසාධනය (2025 ජනවාරි - අගෝස්තු)**




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද

සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 160.7 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 190.8 දක්වා සියයට 18.8 කින් වර්ධනය විය. 2025 වසරේ අගෝස්තු මස 31 වන විට සමාජ ආරක්ෂණ දායකත්ව බදු ගොනු ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව 14,898 දක්වා සියයට 34.5 කින් වර්ධනය වීම මඟින් බදු පරිපාලන ක්‍රියාමාර්ගයන් වැඩිදියුණු කිරීම ද පිළිඹිබු කිරීමත් සමගම දේශීය හා විදේශීය අංශයේ ක්‍රියාකාරකම් පුළුල් වීම මෙයට හේතු විය. 2025 වසරේ පළමු මාස අට තුළ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම එහි වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 72.3 ක ළඟාකර ගැනීමක් විය.

### රේගු ආනයන බදු

2024 වසරේ මුල් මාස අට තුළ රැස් කරනලද රු. බිලියන 69.4 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රේගු ආනයන බදු තුළින් රැස් කරන ලද ආදායම සියයට 117.5 කින් රු. බිලියන 151.0 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආනයනික භාණ්ඩ බහුතරයක් සඳහා ආනයන සීමාවන් ඉවත් කිරීම සහ මෝටර් රථ වාහන ආනයන මත සියයට 20 ක අතිරේක රේගු බද්දක් පැනවීමයි.

### විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද

2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 67.2 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු තුළින් ආදායම් රැස් කිරීම රු. බිලියන 103.6 ක් දක්වා සියයට 54.2 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විශේෂ වෙළෙඳ භාණ්ඩ භාණ්ඩ බද්දට යටත් අයිතමවල ආනයන පරිමාව වැඩිවීමයි.

### භාණ්ඩ අපනයන සහනාධාර යෝජනා ක්‍රමය (සෙස්)

2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 52.0 ක් වූ සෙස් බද්දෙන් රැස් කළ ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 56.5 ක් දක්වා සියයට 8.8 කින් ඉහළ ගොස් තිබේ. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ආනයනික බොහෝ භාණ්ඩ සඳහා ආනයන සීමාවන් ඉවත් කිරීම සමඟ සෙස් බද්දට යටත් භාණ්ඩවල ආනයන පරිමාව වැඩි වීමයි.

### වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද

2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 113.9 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද තුළින් රැස් කරන ලද මුළු ආදායම රු. බිලියන 115.9 ක් දක්වා සියයට 1.7 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආනයන සීමාවන් නිදහස් කිරීමත් සමඟ ආනයන පරිමාව වැඩිවීමයි.

### විදුලි සංදේශ බද්ද

2025 වසරේ මුල් මාස අට තුළ විදුලි සංදේශ බද්ද තුළින් උපයන ලද ආදායම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රු. බිලියන 11.2 සිට රු. බිලියන 10.6 දක්වා සියයට 5.9 කින් සුළු වශයෙන් අඩු වී ඇති අතර, අන්තර්ජාල නොවන විදුලි සංදේශ සේවා සැපයුම් වටිනාකම අඩු වෙමින් පවතින අතර, විදුලි සංදේශ බද්ද අදාළ නොවන අන්තර්ජාල සේවාවන් හි වටිනාකම වැඩි වීම මේ සඳහා හේතුවිය.

### මෝටර් රථ වාහන මත සුඛෝපභෝගී බද්ද සහ අනෙකුත් බදු

මෝටර් රථ වාහන බදු සහ අනෙකුත් බදු වලින් උපයන ලද ආදායම 2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 21.1 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 45.1 දක්වා සියයට 113.3 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. සුඛෝපභෝගී මෝටර් රථ වාහන බද්දෙන් ලද ආදායම 2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 1.8 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 22.3 ක් දක්වා සියයට 1,115.7 කින් සහ මෝටර් රථ හිමිකම් බද්ද 2024 වර්ෂයේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 0.15 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 5.7 ක් දක්වා සියයට 3,705.5 කින් ඉහළගිය අතර මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2025 පෙබරවාරි මාසයේ සිට මෝටර් රථ වාහන සුඛෝපභෝගී බද්ද වැඩිවීම සහ මෝටර් රථ ආනයන සීමාවන් නිදහස් කිරීම ය. මේ අතර, ඔට්ටු ඇල්ලීම සහ සූදු ක්‍රීඩා වලින් ලැබෙන

ආදායම 2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 11.4ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 6.0 දක්වා සියයට 47.1 කින් අඩු වී ඇති අතර. 2024 සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රු. බිලියන 1.15 ට සාපේක්ෂව 2025 වසරේ මුල් මාස අට තුළ කොටස් ගනුදෙනු බද්දෙන් ලද ආදායම සියයට 212.5 කින් සැළකිය යුතු ලෙස රු. බිලියන 4.5 දක්වා ඉහළ ගොස් තිබේ. ආර්ථිකය ප්‍රකෘතිවීමේ ප්‍රතිඵලයක් ලෙස කොටස් ගනුදෙනුවල වටිනාකම සහ පරිමාව වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

**2.7 වගුව : මෝටර් රථ වාහන ආනයන**

*ඒකකය: ගණන*

| අයිතමය | ආනයන ජන. -අගෝ. 2024 | 2025 | වෙනස | % |
|---|---|---|---|---|
| මෝටර් රථ | 925 | 36,691 | 35,766 | 3,866.6 |
| බස් රථ හා මගී වෑන් රථ | 18 | 1,069 | 1,051 | 5,838.9 |
| ත්‍රිරෝද රථ | 62 | 9,454 | 9,392 | 15,148.4 |
| යතුරු පැදි | 11,411 | 97,952 | 86,541 | 758.4 |
| භාණ්ඩ ප්‍රවාහන රථ (අ) | 274 | 4,834 | 4,560 | 1,664.2 |
| ඉඩම් වාහන (ආ) | 3,224 | 4,302 | 1,078 | 33.4 |
| අනෙකුත් (ඇ) | 19,840 | 22,912 | 3,072 | 15.5 |
| **එකතුව** | **35,754** | **177,214** | **141,460** | **395.6** |

*මූලාශ්‍ර : ශ්‍රී ලංකා රේගුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව*

*(අ) ලොරි රථ, වෙනත් භාණ්ඩ ප්‍රවාහන වාහන සහ විශේෂිත වාහන*

*(ආ) ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර්, බවුසර් සහ අනෙකුත් ඉඩම් වාහන*

*(ඇ) කැබ් රථ, ද්විත්ව කාර්ය වාහන, ක්‍වාඩ් සයිකල් සහ මෝටර් නිවාස*

**2.8 වගුව : නිදහස් වෙළෙඳ ගිවිසුම් මගින් ආවර්ණය වන තීරු බදු සහන යටතේ ආනයනය/අපනයනය කරන ලද භාණ්ඩ හා වටිනාකම්**

| නිදහස් වෙළඳ ගිවිසුම | ජන. - අගෝ. 2025 තීරුබදු සහන සඳහා යටත්වන නිෂ්පාදන සංඛ්‍යාව | ආනයන වටිනාකම (ම්.ර.ගැ./ රු. මිලි.) | අපනයන වටිනාකම (නැ.තෙ.මි./ රු. මිලි.) |
|---|---|---|---|
| ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම් (APTA) | 808 | 5,771 | 44,920 |
| ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | 5,329 | 84,707 | 124,672 |
| පකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) | 6,200 | 3,557 | 9,310 |
| දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) | 5,932 | 3,661 | 20,410 |
| සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (SSFTA) | 4,334 | 1,008 | 19 |
| **එකතුව** | **22,603** | **98,704** | **199,331** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව සහ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**2.9 වගුව : ජාත්‍යන්තර වෙළඳාමෙන් ලද සෙස් බදු ආදායම**

*රු. මිලි.*

| අයිතම | ජන. -අගෝ. 2024 | 2025 (අ) |
|---|---|---|
| **අපනයන සෙස් බද්ද** | **1,416** | **954** |
| තේ - බදු සහ අපනයන පාලන පනත, තේ මණ්ඩල නීති යටතේ | 331 | 384 |
| රබර් - රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ | 10 | 5 |
| පොල් - පොල් සංවර්ධන අධිකාරී පනත යටතේ | 138 | 124 |
| අ.සං.ම සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ | 937 | 441 |
| **ආනයන සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ** | **50,534** | **55,575** |
| **එකතුව** | **51,951** | **56,529** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

### බදු නොවන ආදායම

2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 209.3 ක් වූ බදු නොවන ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 226.2 ක් දක්වා සියයට 8.1 කින් මධ්‍යස්ථව වැඩි විය. බදු නොවන ආදායම සියයට 6.9 කින් මුළු ආදායමට දායක විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ දඩ, ගාස්තු සහ අයකිරීම්, පොලී ආදායම සහ සමාජ ආරක්ෂණ දායකත්වයෙන් උපයන ලද ආදායමේ වැඩිවීමයි. ඒ අනුව, පොලී ආදායම 2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 34.5 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 43.4 ක් දක්වා සියයට 25.8 කින් ඉහළ ගොස් ඇති අතර ප්‍රධාන වශයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවාවන් සඳහා වන ඉල්ලුම වැඩි වීම හේතුවෙන් දඩ, ගාස්තු සහ අයකිරීම් වලින් ලැබෙන ආදායම 2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 102.8 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 112.6 ක් දක්වා සියයට 9.5 කින් වැඩි විය. සමාජ ආරක්ෂණ දායකත්වයන්ගෙන් ලැබෙන ආදායම ද 2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 27.7 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 36.6 දක්වා සියයට 32.2 කින් ඉහළ ගොස් ඇති අතර සියලුම රජයේ සේවකයින් සඳහා දායකත්ව අනුපාතය සියයට 8 දක්වා වැඩි කිරීම මේ සඳහා හේතු විය. කුලී ආදායම 2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 3.3 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 3.9 දක්වා සියයට 15.0 කින් ඉහළ ගොස් ඇත. රාජ්‍ය ව්‍යවසායන් වෙතින් ලැබෙන ලාභ සහ ලාභාංශ වලින් ලැබෙන බදු නොවන ආදායම 2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 26.8 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 14.6 දක්වා සියයට 45.3 කින් අඩු වී ඇත. 2025 වසරේ මුල් මාස අට තුළ බදු නොවන ආදායම උපයා ගැනීම වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 370 න් සියයට 61.1 ක ලඟාකර ගැනීමකි.

**2.10 වගුව : රාජ්‍ය ආදායම් විචලතා විශ්ලේෂණය**

| අයිතමය | රු. බිලි. 2024 ජන. - අගෝ. | 2025 වාර්ෂික ඇස්තමේන්තුව | 2025(අ) ජන. - අගෝ. | විචලනය සඳහා ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 624.7 | 1,167.0 | 702.4 | 2025 වසරේ පළමු මාස අට තුළ දී ආදායම් බදු ආදායම පෙර වසරේ සමාන කාලය හා සැසඳීමේදී රු. බිලියන 702.4 ක් දක්වා සියයට 12.4 කින් ඉහළ ගොස් ඇත. 2025 පළමු මාස අට තුළ දී ආදායම් බදු මඟින් ලද ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 60.2 ක් ලඟා කරගෙන ඇත. මෙම ආදායම් කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතු බලපා ඇත.<br>- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ඉහළයාම;<br>- ආර්ථික ක්‍රියාකාරකම් වල ක්‍රමිකව ඇති වූ පුනර්ජීවනය;<br>- 2025.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි පොලී මත රඳවාගැනීමේ බදු අනුපාතය සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ දැමීම; සහ<br>- බදු පරිපාලනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග සමඟින් 2024 වසර අවසානයේ දී ලියාපදිංචි වූ බදු ගොනු 1,093,134 ට සාපේක්ෂව 2025 වසරේ අගෝස්තු මස අවසන් වනවිට ලියාපදිංචි වූ බදු ගොනු සංඛ්‍යාව 1,270,851 දක්වා සියයට 16.3 කින් ඉහළයාම. |
| එකතුකළ අගය මත බදු | 842.5 | 1,615.0 | 1,084.2 | 2025 වසරේ පළමු මාස අට තුළ එකතු කළ අගය මත බදු ආදායම 2024 වසරේ සමාන කාලය තුළ දී ලබාගත් රු. බිලියන 842.5 ට සාපේක්ෂව රු. බිලියන 1,084.2 දක්වා සියයට 28.7 කින් සැලකියයුතු ලෙස වර්ධනය වී ඇති අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 67.1 ක ළඟාකරගැනීමකි. මෙම එකතු කළ අගය මත බදු ආදායමේ ඉහළ කාර්යසාධනය සඳහා පහත සඳහන් හේතු ප්‍රධාන වශයෙන් බලපා ඇත.<br>- මෝටර් රථවාහන මත පනවා තිබූ සීමාවන් ඉවත් කිරීම;<br>- සමස්ත ආනයන සියයට 10.5 කින් ඉහළයාම;<br>- දේශීය ආර්ථික ක්‍රියාකාරකම් පුළුල්වීම; සහ<br>- වැඩිදියුණු වූ එකතු කළ අගය මත බදු අනුකූලතාවය හේතුවෙන් 2024 වසර අවසානයේ 21,542 ක් වූ ලියාපදිංචි බදු ගොනු සංඛ්‍යාව 2025 වසරේ අගෝස්තු මස අවසන් වන විට 30,298 ක් දක්වා සියයට 40.6 කින් වැඩිවීම. |

**2.10 වගුව : රාජ්‍ය ආදායම් විචලතා විශ්ලේෂණය සම්බන්ධිතයි ....**

| අයිතමය | රු. බිලි. 2024 ජන. - අගෝ. | රු. බිලි. 2025 වාර්ෂික ඇස්තමේන්තුව | රු. බිලි. 2025(අ) ජන. - අගෝ. | විචලනය සඳහා ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| නිෂ්පාදන බද්ද | 385.7 | 841.0 | 607.9 | 2025 වසරේ පළමු මාස අට තුළ නිෂ්පාදන බදු මඟින් ලද ආදායම 2024 වසරේ සමාන කාලය හා සැසඳීමේදී රු. බිලියන 607.9 ක් දක්වා සියයට 57.6 කින් සැලකියයුතු ලෙස ඉහළගොස් ඇති අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 72.5 ක ළඟාකරගැනීමකි. මෙම කාර්සාධනය සඳහා මූලික වශයෙන් පහත හේතු බලපා ඇත.<br><br>- 2025 වසරේ පෙබරවාරි මස සිට බලපැවැත්වෙන පරිදි සියළුම වර්ගයේ මෝටර් රථවාහන ආනයන සඳහා පැවති ආනයන තහනම ඉවත් කිරීම හේතුවෙන් මෝටර් රථවාහන මඟින් ලද නිෂ්පාදන බදු ආදායම ඉහළයාම;<br><br>- 1989 අංක 13 දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ උද්ධමන ගැලපුම් දර්ශකගත කරණය මත පදනම්ව මෝටර් රථවාහන, සිගරට්, සීනි මත පදනම් වූ පාන වර්ග ආදී නිෂ්පාදන බද්දට යටතට අයත් සියළුම දෑ සඳහා වාර්ෂික නිෂ්පාදන බද්ද සියයට 5.9 කින් ඉහළ දැමීම;<br><br>- වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශකගත කරණය මත පදනම්ව මත්පැන් මත වූ සුරා බද්ද සියයට 5.9 කින් ඉහළ දැමීම; සහ<br>- සීනි අඩංගු පානවර්ග, ශීතකරණ, පාම් තෙල් මේද අම්ල ආදී නිෂ්පාදන බද්දට යටත් අනෙකුත් භාණ්ඩ මඟින් ලද ආදායම රු. බිලියන 8.1 දක්වා සියයට 72.9 කින් ඉහළයාම.<br><br>කෙසේවුවද, සියයට 13.3 කින් පහළගිය ඛණිජතෙල් මඟින් ලද ආදායම නිෂ්පාදන බදු ආදායමේ සමස්ත කාර්සාධනය සඳහා සෘණාත්මකව බලපෑම් එල්ලකර ඇත. |
| ආනයන බදු | 69.4 | 240.0 | 151.0 | ආනයන බදු ආදායම 2025 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 62.9 ක් ලඟා කරගෙන ඇති අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්:<br><br>- 2025 ජනවාරි මස 28 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෝටර් රථවාහන ආනයන මත සියයට 20 ක ආනයන බද්දක් පැනවීම;<br><br>- 2025 පෙබරවාරි 01 සිට බලපැවැත්වෙන පරිදි මෝටර් රථවාහන ආනයන මත සියයට 50 ක අධිභාරයක් පැනවීම; සහ<br><br>- 2025 වසරේ පළමු මාස අට තුළ ආනයන සියයට 10.5 කින් ඉහළයාම බලපා ඇත. |
| වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද | 113.9 | 185.0 | 115.9 | වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද මඟින් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 62.6 ක් ලඟාකරගනිමින් රු. බිලියන 115.9 ක් දක්වා සියයට 1.7 කින් ආන්තිකව ඉහළගොස් ඇත. මෙම ඉහළයාම සඳහා මූලික වශයෙන් පහත හේතු බලපා ඇත.<br><br>- 2025 වසරේ පළමු මාස අට තුළ ආනයන සියයට 10.5 කින් ඉහළයාම බලපා ඇත. |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 67.2 | 126.0 | 103.6 | 2025 වසරේ පළමු මාස අට තුළදී විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මඟින් ලද ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 82.3 ක් ලඟාකරගනිමින් රු. බිලියන 103.6 ක් දක්වා සියයට 54.2 කින් සැලකියයුතු ලෙස ඉහළ ගොස් ඇත. මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන්:<br><br>- අර්තාපල්, සහල්, ලූනු සහ බී ළූනු සඳහා වූ බදු අනුපාතයන් ඉහළ දැමීම; සහ<br><br>- තෙල් සහ මේදය, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන, කිරි ආශ්‍රිත නිෂ්පාදන ආදී ප්‍රධාන පරිභෝජන භාණ්ඩ ආනයන වටිනාකම සියයට 16.9 කින් ඉහළයාම හේතු වී ඇත. |

**2.10 වගුව : රාජ්‍ය ආදායම් විචලතා විශ්ලේෂණය සම්බන්ධිතයි ....**

| අයිතමය | රු. බිලි. | | | විචලනය සඳහා ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| | 2024 ජන. - අගෝ. | 2025 වාර්ෂික ඇස්තමේන්තුව | 2025(අ) ජන. - අගෝ. | |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 160.7 | 264.0 | 190.8 | 2025 වසරේ පළමු මාස අට තුළ සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 72.3 ක් ලඟාකරගෙන ඇති අතර, මේ කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත හේතු බලපා ඇත.<br><br>- 2025 වසරේ පළමු මාස අට තුළ සියයට 10.5 කින් ඉහළ ගිය ආනයන මගින් ඇති කළ බලපෑම; සහ<br>- දේශීය ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම |
| වෙනත් බදු | 84.4 | 152.0 | 112.6 | 2025 වසරේ පළමු මාස අට තුළ වෙනත් බදු මගින් ලද ආදායම 2024 වසරේ සමාන කාලය තුළ වාර්තා කල රු. බිලියන 84.4 ට සාපේක්ෂව රු. බිලියන 112.6 දක්වා සියයට 33.4 කින් ඉහලගොස් ඇත. වෙනත් බදු මගින් ලද ආදායම 2025 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 74.1 ක් ලඟාකරගෙන ඇත. මේ සඳහා මූලික වශයෙන්:<br><br>- ආනයන ඉහළ යාම හේතුවෙන් සෙස් බදු මගින් ලද ආදායම සියයට 8.8 කින් ඉහළ යාම; සහ<br><br>- මෝටර් රථවාහන ආනයන සඳහා පැවති සීමාවන් ඉවත් කිරීමත් සමඟින් 2025 වසරේ පළමු මාස අට තුළ මෝටර් රථවාහන මත වූ සුඛෝපභෝගී මෝටර් රථවාහන බද්ද 2024 වසරේ සමාන කාලය තුළ රු. බිලියන 1.8 සිට රු. බිලියන 22.3 දක්වා වැඩිවීම හේතු වී ඇත.<br><br>කෙසේ වුවද, ස්ථාවර දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව පහළ යාම හේතුවෙන් විදුලි සංදේශ බද්ද මගින් ලද ආදායම සියයට 5.9 කින් පහළ ගොස් ඇත. |
| බදු නොවන ආදායම | 209.3 | 370.0 | 226.2 | පොලී ආදායම, කුලී ආදායම, දඩ, අයකිරීම් හා ගාස්තු සහ සමාජ ආරක්ෂණ දායකත්ව ආදායම මගින් ලද ඉහළ ආදායම් කාර්යාධනයෙහි ප්‍රතිඵලයක් ලෙස 2025 වසරේ පළමු මාස අට තුළ බදු නොවන මූලාශ්‍ර මගින් ලද ආදායම රු. බිලියන 226.2 ක් දක්වා සියයට 8.1 කින් ඉහළ ගොස් ඇත. එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 61.1ක ලඟාකරගැනීමකි.<br><br>කෙසේ වුවද, 2025 වසරේ පළමු මාස අට තුළ රාජ්‍ය ව්‍යාපාර මගින් ලද ලාභ හා ලාභාංශ ආදායම් පහළ ගොස් ඇත. |
| **එකතුව** | **2,557.8** | **4,960.0** | **3,294.7** | |

*රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.*
*(අ) තාවකාලික*

## 2.1 සටහන : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : (2025 ජනවාරි - සැප්තැම්බර් )

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සංශෝධන** | |
| 2025.04.01 | 2025 අංක 2 දරන දේශීය ආදායම් බදු (සංශෝධන) පනත<br><br>(1) පුද්ගල ආදායම් බදු අනුපාත ව්‍යුහය<br><br>පුද්ගලයෙකු සඳහා ලබා දෙන පුද්ගල ආදායම් බදු සහනය, වසරකට රු. 1,800,000 / - ක් දක්වා ඉහළ නැංවීම සහ පුද්ගලයෙකු සඳහා බදු අය කළ හැකි ආදායම මත අදාළ වන බදු අනුපාත පහත පරිදි සංශෝධනය කිරීම. |

විශේෂ සටහන 2.1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග (2025 ජනවාරි - සැප්තැම්බර් ) (සම්බන්ධිතයි....)

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| | (table below; items (2)–(3)) |

| ආන්තික බදු අනුපාතය (%) | වාර්ෂික බදු අයවන ආදායම (රු. මිලි.) | |
|---|---|---|
| | පෙර පැවති බදු ස්ථර | වත්මන් බදු ස්ථර |
| 0 | 1.2 දක්වා | 1.8 දක්වා |
| 6 | 1.2 -1.7 | 1.8 - 2.8 |
| 12 | 1.7 - 2.2 | - |
| 18 | 2.2 - 2.7 | 2.8 - 3.3 |
| 24 | 2.7 - 3.2 | 3.3 - 3.8 |
| 30 | 3.2 - 3.7 | 3.8 - 4.3 |
| 36 | 3.7 ට වැඩි | 4.3 ට වැඩි |

(2) සංස්ථාපිත ආදායම් බදු අනුපාත සංශෝධනය

(i) ඔට්ටු සහ සූදු ක්‍රීඩාව මගින් ලැබෙන ඉපයීම් සහ ලාභ මත සහ අපනයනය කිරීම සඳහා හැර නිෂ්පාදනය කර විකුණනු ලබන හෝ ආනයනය කර විකුණනු ලබන ඕනෑම මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන සඳහා ලැබෙන ඉපයීම් සහ ලාභ මත ආදායම් බදු අනුපාතය සියයට 40 සිට සියයට 45 දක්වා වැඩි කිරීම.

(ii) ශ්‍රී ලංකාවෙන් පිටත දී ප්‍රයෝජනයට ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටතදී යම් තැනැත්තකු වෙත සපයනු ලබන සේවා සඳහා ගෙවීම්, විදේශ ව්‍යවහාර මුදලින් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී, එම සේවා සැපයීමෙන් ලැබෙන ඉපයීම් හා ලාභ මත සියයට 15ක අනුපාතයට ආදායම් බදු පැනවීම.

(iii) යම් විදේශීය මූලාශ්‍රයකින් ලැබෙන ඉපයීම් හා ලාභ විදේශීය ව්‍යවහාර මුදලින් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී එම විදේශීය මූලාශ්‍රයෙන් ලැබෙන ඉපයීම් සහ ලාභ මත සියයට 15ක අනුපාතයට ආදායම් බදු පැනවීම.

(3) අත්තිකාරම් ආදායම් බදු (රඳවා ගැනීමේ බදු) අනුපාතය
පොළී හෝ වට්ටම් මත අත්තිකාරම් ආදායම් බදු (රඳවා ගැනීමේ බදු) අනුපාතය සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කිරීම.

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **මුද්දර ගාස්තු - 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත** | |
| 2025.04.01 | 2025.03.27 දිනැති අංක 2429/39 දරන ගැසට් නිවේදනය<br>- යම් දේපලක බද්දට හෝ කුලියට දීමට අදාල යම් සාධන පත්‍රයක් මත පනවනු ලබන මුද්දර ගාස්තුව, කල්බදු හෝ කුලී ගිවිසුමේ (කුලී සින්නක්කර ගිවිසුම් හැර) සම්පූර්ණ කාලපරිච්ඡේදය අධි මිලද ඇතුළුව ගෙවිය යුතු එකතු කල්බද්දේ හෝ කුලියෙහි, සෑම රුපියල් 1,000/- ක් හෝ ඉන් කොටසක් සඳහා, රු. 10/- සිට රු. 20/- දක්වා වැඩි කිරීම. |
| **සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය - 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරි පනත** | |
| 2025.09.03 | සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පිහිටුවීමේ විෂය පථය,<br>(අ) සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් නියාමනය කිරීම හා පාලනය කිරීම;<br>(ආ) සූදු ක්‍රීඩාවලට අදාළ ආදායම් එකතු කිරීම සහතික කිරීම;<br>(ඇ) සූදු ක්‍රීඩා පවත්වාගෙන යාමේ දී ඒවායෙහි විනිවිද භාවය සහ යහ පාලනය පිළිබඳව සහතික කිරීම;<br>(ඈ )සූදු ක්‍රීඩා කර්මාන්තයේ අඛණ්ඩතාවය සම්බන්ධයෙන් මහජනයාගේ විශ්වාසය ප්‍රවර්ධනය කිරීම;<br>(ඉ ) සූදු ක්‍රීඩාව සාධාරණ හා විනිවිද පෙනෙන ආකාරයකින් සිදු කිරීම සහතික කිරීම. |

**විශේෂ සටහන 2.1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග (2025 ජනවාරි - සැප්තැම්බර් ) (සම්බන්ධිතයි....)**

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත** | |
| | 2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත |
| 2024.01.01 | 1) 2002 අංක 14 දරන වැට් බදු පනතෙන් බදු නිදහස් කිරීම් ඉවත් කිරීමේ අනපේක්ෂිත බලපෑම වලක්වා ගැනීම, පනතේ පැහැදිලි බව පවත්වා ගැනීම හා 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් හඳුන්වා දී ඇති එකතු කළ අගය මත බදු ප්‍රතිසංස්කරණ වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම. |
| 2025.04.11 | 2) භාණ්ඩ වැට් බද්දෙන් නිදහස් කර ඇති බව හෝ ආනයනකරු/ අපනයනකරු වැට් බදු ලියාපදිංචි සීමාවට පහළින් සිටින බව නොසලකා, වාණිජමය අරමුණින් ආනයන/ අපනයන සිදු කරන විට, ස්ථිර වැට් බදු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම. |
| 2025.04.11 | 3) වැට් බද්දෙන් නිදහස් කරන ලද සැපයුම් /මිලදී ගැනීම් සම්බන්ධයෙන් වැට් බදු වාර්තා ගොනු කිරීමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් උපදෙස් නිකුත් කිරීම. |
| 2025.04.11 | 4) දේශීයව නිපදවන දියර කිරි සහ යෝගට් සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම. |
| බ.පැ.2025.10.01 | 5) 2025 ඔක්තෝබර් මස 01 දින සිට නිර්වාසික තැනැත්තකු විසින් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා සිදුකරන සේවා සැපයීම සඳහා එකතු කළ අගය මත බදු පැනවීම. |
| බ.පැ.2025.10.01 | 6) සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමය 2025 ඔක්තෝබර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර, මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අවදානම මත පදනම් වූ ආපසු ගෙවීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම. |
| **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත** | |
| 2025.01.11 | 2025.01.10 දිනැති අංක 2418/43 දරන ගැසට් නිවේදනය<br>- වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශක මත පදනම්ව ඒකක අනුපාත සහිත නිෂ්පාදන බදු අයකළ හැකි සියලුම භාණ්ඩ වල බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම. |
| 2025.02.01 | 2025.01.31 දිනැති අංක 2421/42 දරන ගැසට් නිවේදනය<br>- විදුලි වාහන සඳහා වන නිෂ්පාදන බද්ද සියයට 100 කින් වැඩි කිරීම. |
| 2025.04.29 | 2025.04.28 දිනැති අංක 2434/04 දරන ගැසට් නිවේදනය<br>- බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විද්‍යුත් මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක සඳහා නිෂ්පාදන බද්ද පැනවීම. |
| **සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)** | |
| 2025.01.11 | සුරාබදු නිවේදන අංක 01/2025 (2025.01.10 දිනැති අංක 2418/42 දරන ගැසට් නිවේදනය)<br>- වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශක මත පදනම්ව මත්පැන් මත සුරා බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම. |
| **දුම්කොළ බද්ද - 1999 අංක 08 දරන දුම්කොළ බදු පනත** | |
| 2025.04.02 | 2025.04.01 දිනැති අංක 2430/16 දරන ගැසට් නිවේදනය<br>- බීඩි සඳහා අදාළ වන දුම්කොළ බද්ද ඒකකයට රු. 2/- සිට රු. 3/- දක්වා වැඩි කිරීම. |
| **සෙස් බද්ද - 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත** | |
| 2025.08.01 | 2025.07.02 දිනැති අංක 2443/49 දරන ගැසට් නිවේදනය<br>- ලැයිස්තුගත ඉහළ ප්‍රතිලාභයක් සහිත සාංගමික ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් අදාළ වන ගණුදෙනු සඳහා 0.006% ක සෙස් බද්දක් පැනවීම හා සාංගමික ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් අදාළ වන ගණුදෙනු වල මුළු වටිනාකම 0.01% න් වැඩි කිරීමෙන් ලැබෙන වටිනාකම, 3 න් බෙදීමෙන් ලැබෙන අගය මත වන සෙස් බද්ද සංශෝධනය කිරීම. |
| **රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත** | |
| 2025.01.28 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2025 (2025.01.27 දිනැති අංක 2421/05 දරන ගැසට් නිවේදනය)<br>- මෝටර් රථ ආනයනය සඳහා සියයට 20 හෝ සියයට 20 ක නිශ්චිත තීරු බදු අනුපාතයක් සමඟ (මිශ්‍ර තීරු බදු අනුපාතය) රේගු ආනයන බද්දක් පැනවීම. |
| 2025.04.29 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 02/2025 (2025.04.28 දිනැති අංක 2434/02 දරන ගැසට් නිවේදනය)<br>- බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විද්‍යුත් මෝටර් රථ සඳහා නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක නිර්මාණය කිරීම. |

විශේෂ සටහන 2.1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග (2025 ජනවාරි - සැප්තැම්බර් ) (සම්බන්ධිතයි....)

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **රේගු අධිභාරය - රේගු ආඥාපනත (235 වන අධිකාරය)** | |
| 2025.02.01 | 2025.01.31 දිනැති අංක 2421/43 දරන ගැසට් නිවේදනය<br>- මෝටර් රථ ආනයනය සඳහා ආනයන බදු මත අධිභාරයක් පැනවීම. |
| 2025.04.29 | 2025.04.28 දිනැති අංක 2434/03 දරන ගැසට් නිවේදනය<br>- බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විද්‍යුත් මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක සඳහා අධිභාරයෙන් සියයට 50ක් පැනවීම. |
| **විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත** | |
| 2025.01.01 | 2024.12.31 දිනැති අංක 2417/20 දරන ගැසට් නිවේදනය<br>- අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු ආනයනික අයිතම 63 ක් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය 2025 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කිරීම. |
| 2025.01.28 | 2025.01.27 දිනැති අංක 2421/03 දරන ගැසට් නිවේදනය<br>- 2025 මාර්තු මස 03 දින දක්වා රාමසාන් උත්සව සමය වෙනුවෙන් රට ඉඳි ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 199/-ක බදු සහනයක් සැලසීම. |
| 2025.08.26 | 2025.08.25 දිනැති අංක 2451/10 දරන ගැසට් නිවේදනය<br>- දේශීය අස්වනු නෙළීමේ කාලය සැලකිල්ලට ගනිමින් අර්තාපල් සහ බොම්බයි ළූණු ආනයනය කිරීම මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පිළිවෙළින් කිලෝ ග්‍රෑමයකට රු. 60/- සිට රු. 80/- ක් දක්වා සහ කිලෝ ග්‍රෑමයකට රු. 10/- සිට රු. 50/- ක් දක්වා වැඩි කිරීම. |
| **ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි - 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත** | |
| 2025.01.28 | 2025 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි<br>(2025.01.27 දිනැති අංක 2421/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- වාණිජමය හෝ භාණ්ඩ ප්‍රවාහන කාර්යයන් සඳහා යොදා ගන්නා වාහන ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම. |
| 2025.02.01 | 2025 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි<br>(2025.01.31 දිනැති අංක 2421/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- පුද්ගලික භාවිතය සඳහා යොදා ගන්නා මෝටර් වාහන (කාර්, වෑන්, සපෝර්ට් යුටිලිටි වාහන ආදිය) ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම සහ උපරිම වයස් සීමාවන් ඉක්මවන මෝටර් රථ සඳහා ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවය පැනවීම. |
| 2025.03.19 | 2025 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි<br>(2025.03.19 දිනැති අංක 2428/07 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- භාවිතා කළ මෝටර් රථ සඳහා අපනයන පරීක්ෂණ සහතික නිකුත් කිරීමට සියලුම රටවල් සඳහා බලයලත් පරීක්ෂකවරයෙකු ලෙස බියුරෝ වෙරිටාස් ආයතනය පත් කිරීම, සහ අපනයන රටෙහි බැංකුවේ මුද්‍රාව (2013 අප්‍රේල් 03 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 5 දරන රෙගුලාසිය ප්‍රකාරව අවශ්‍යවන) නොමැතිව ලැබුණු මෝටර් රථවල අපනයන පරීක්ෂණ සහතික මාර්ගගත සත්‍යාපනය හරහා නිකුත් කිරීමට බලපත්‍රලාභී බැංකුවලට බලය පැවරීම. |
| 2025.04.29 | 2025 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි<br>(2025.04.19 දිනැති අංක 2434/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- 2023.01.01 දිනැති අංක 2312/77 දරන ඇති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටවූ අයිතම ලැයිස්තුව සමාලෝචනය කර තෝරාගත් අයිතම එම ලැයිස්තුවෙන් ඉවත් කිරීම සහ ඕනෑම රටක ලියාපදිංචි නොකළ (නවතම) විද්‍යුත් යතුරුපැදි ආනයනය කිරීම, ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම. |
| 2025.05.05 | 2025 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි<br>(2025.05.05 දිනැති අංක 2435/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් විද්‍යුත් මෝටර් රථ සඳහා ප්‍රකාශයට පත් කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදුම්, මෝටර් වාහන ආනයනය සඳහා අදාල වන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සඳහා ඇතුලත් කිරීම. |
| 2025.05.19 | 2025 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි<br>(2025.05.19 දිනැති අංක 2437/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 2501.00 යටතේ වර්ගීකරණය කරන ලද අමු අයඩීනීකරණය නොකළ ලුණු සහ ආහාරයට ගත හැකි අයඩීනීකරණය කළ ලුණු (කුඩු කළ සහ කැට ලුණු) ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාව 2025 ජූනි 10 දක්වා ඉවත් කිරීම. * |

විශේෂ සටහන 2.1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග (2025 ජනවාරි - සැප්තැම්බර් ) (සම්බන්ධිතයි....)

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2025.08.15 | 2025 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි<br>(2025.08.15 දිනැති අංක 2449/60 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල (2024.05.17 දිනැති අංක 2384/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) වලංගු කාල සීමාව 2025.09.30 දින දක්වා දීර්ඝ කිරීම. * |
| **අපගමන බද්ද - 2003 අංක 25 දරන මුදල් පනත** | |
| 2025.01.31 | 2025.01.31 දිනැති අංක 2421/30 දරන ගැසට් නිවේදනය<br>- මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළින් ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා, බදු නිදහස් කිරීමේ කාලය ජාත්‍යන්තර ගුවන් සේවාවක් මෙහෙයුම් ආරම්භ කළ දින සිට වසර තුනක කාලයක් සම්පූර්ණ වන හෝ 2025.12.28 යන දෙකෙන් පළමුවෙන් එළඹෙන දිනය දක්වා දීර්ඝ කිරීම.<br>- කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ-රත්මලානෙන් සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළින් ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කර, ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා ඇ.ඩො. 30ක සහනදායී අනුපාතය දීර්ඝ කිරීම. |
| **ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද - 2004 අංක 11 දරන මුදල් පනත** | |
| 2025.04.01 | 2025.04.01 දිනැති අංක 2430/14 දරන ගැසට් නිවේදනය<br>- පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, විශේෂිත දුරකථන අංක මත පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, දේශීය ප්‍රවේශ ගාස්තු , විදුලි සංදේශ සංවර්ධන ගාස්තු සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු සඳහා ගෙවිය යුතු වත්මන් බදු අනුපාතය 2025 ජනවාරි 01 සිට 2027 දෙසැම්බර් 31 දක්වා වසර තුනක් සඳහා දීර්ඝ කිරීම. |
| **මෝටර්රථ සඳහා සුඛෝපභෝගී බද්ද - 2018 අංක 35 දරන මුදල් පනත** | |
| 2025.02.01 | 2024.12.31 දිනැති අංක 2421/41 දරන ගැසට් නිවේදනය<br>- විදුලි මෝටර් රථ හැර, සෑම ඉන්ධන කාණ්ඩයකම මෝටර්රථ සඳහා වන සුඛෝපභෝගී බදු සීමාව රු. මිලියන 1.5 කින් සංශෝධනය කිරීම. |
| 2025.04.29 | 2025.04.28 දිනැති අංක 2434/05 දරන ගැසට් නිවේදනය<br>- බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විද්‍යුත් මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක සඳහා වන සුඛෝපභෝගී බද්ද පැනවීම. |
| **කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව - 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත** | |
| 2025.09.20 | 2025 අංක 01 දරන කොළඹ වරාය නගරය රෙගුලාසි<br>(2025.09.20 දිනැති අංක 2454/62 දරන ගැසට් නිවේදනය)<br>- කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුල ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සැපයීම. |

*** – මෙම ගැසට් පත්‍රය මේ වනවිට බලාත්මක නොවේ.**

## 2.3 රාජ්‍ය වියදම

2025 වසරේ පළමු මාස අට තුළ රජයේ වියදම රු. බිලියන 3,712.5 ක් වූ අතර, ඉන් රු.බිලියන 3,381.3 ක් පුනරාවර්තන වියදම් සහ රු.බිලියන 331.2 ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීමේ වියදම් විය. රජයේ වියදම් සඳහා වාර්ෂිකව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු අතර, ඒ අනුව, 2025 වසරේ රජයේ වියදම් දැරීම සඳහා 2025 අංක 03 දරන විසර්ජන පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

**2.11 වගුව : රාජ්‍ය වියදම් කාර්යසාධනය**

*රු. මිලි.*

| අයිතමය | ජන. අගෝ | |
|---|---|---|
| | 2024 | 2025(අ) |
| පුනරාවර්තන වියදම් | 3,041,565 | 3,381,309 |
| වැටුප් | 659,502 | 760,687 |
| විශ්‍රාම වැටුප් | 254,006 | 282,905 |
| පොලී ගෙවීම් | 1,559,721 | 1,687,571 |
| වෙනත් | 568,336 | 650,146 |
| ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් | 435,320 | 331,183 |
| **මුළු වියදම** | **3,476,885** | **3,712,492** |

*මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

### පුද්ගල පඩිනඩි සහ විශ්‍රාම වැටුප්

2025 වසරේ මුල් මාස අට තුළ පළාත් සභා, ඇතුළු රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හා වේතන සඳහා වූ වියදම රු. බිලියන 760.7 ක් වූ අතර එය 2024 වසරේ එම කාල පරිච්ඡේදයට අදාළ වියදම වූ රු. බිලියන 695.5 ට සාපේක්ෂව සියයට 15.3 ක වැඩිවීමකි. මේ අතර 2025 වසරේ මුල් මාස අට තුළ විශ්‍රාම වැටුප් ගෙවීම් රු.බිලියන 282.9 වන අතර එය 2024 වසරේ එම කාල පරිච්ඡේදයට අදාළ වියදම වූ රු. බිලියන 254.0 සිට සියයට 11.4 කින් වැඩි වීමකි. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2025 අයවැය යෝජනා මගින් රාජ්‍ය සේවක මූලික වැටුප් වැඩිවීම සහ විශ්‍රාම වැටුප් සංශෝධනයයි.

### පොලී ගෙවීම්

දේශීය හා විදේශීය ණය සඳහා පොලී ගෙවීම්, 2024 වසරේ පළමු මාස අට තුළ රු.බිලියන 1559.7 ක්ව පැවති අතර එය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු.බිලියන 1,687.6 දක්වා සියයට 8.2 කින් වැඩි වී ඇත. දේශීය ණය සඳහා පොලී ගෙවීම්, 2024 වසරේ පළමු මාස අට තුළ රු.බිලියන 1,459.7 ක්ව පැවති අතර එය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු.බිලියන 1,466.5 දක්වා සියයට 0.5 කින් වැඩි වී ඇත. විදේශීය ණය සඳහා පොලී ගෙවීම්, 2024 වසරේ පළමු මාස අට තුළ රු.බිලියන 100.0 ක්ව පැවති අතර එය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු.බිලියන 221.1 දක්වා සියයට 121.1 කින් වැඩි වී ඇත.

### සුභසාධන වියදම්

රජය විසින් සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කරන අතර සමාජයේ අවදානමට ලක්විය හැකි සහ ආන්තිකකරණයට ලක් වූ කොටස්වලට විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහ සවිබල ගැන්වීමට කටයුතු කරන ලදී.

සමාජ සුභසාධනය, සමාජ ආරක්ෂණය, අධ්‍යාපනය, සෞඛ්‍ය හා පෝෂණය, නිෂ්පාදන හා ශ්‍රම වෙළඳපළ සඳහා සංවර්ධන සහායන් හා සහනාධාර ඇතුළු ප්‍රධාන සුභසාධන වියදම් සඳහා 2025 මුල් මාස අට තුළ රු. බිලියන 629.4 ක් වැය දරා ඇති අතර එය පසුගිය වර්ෂයේ එම කාලච්ඡේදයේ වියදම වන රු. බිලියන 534.4 ට සාපේක්ෂව සියයට 17.7 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. 2025 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලසීමාව තුළ

**2.12 වගුව : රජයේ සුරැකුම්පත් මත ගෙවන පොලී අනුපාතයන්හි සහ විනිමය අනුපාතයන්හි හැසිරීම (2024 - 2025)**

| කාලපරිච්ඡේදය | | භාණ්ඩාගාර බිල්පත් (%) | | | භාණ්ඩාගාර බැඳුම්කර (%) | | | | සාමාන්‍ය විනිමය අනුපාතය රු./ ඇ.ඩො. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | දින 91 | දින 182 | දින 364 | වසර 2 | වසර 3 | වසර 4 | වසර 5 | |
| 2024 | ජනවාරි | 11.97 | 12.20 | 12.00 | 13.83 | 13.08 | 14.21 | 13.65 | 321.17 |
| | පෙබරවාරි | 9.87 | 9.95 | 10.05 | - | 10.81 | - | 11.90 | 312.58 |
| | මාර්තු | 10.07 | 10.23 | 10.28 | - | 11.33 | - | 12.25 | 305.67 |
| | අප්‍රේල් | 9.61 | 9.89 | 9.99 | - | 11.44 | 11.72 | 12.37 | 299.42 |
| | මැයි | 8.62 | 9.04 | 9.18 | - | - | 11.01 | - | 299.69 |
| | ජූනි | 10.07 | 10.19 | 10.31 | - | 10.69 | 11.90 | 11.78 | 303.81 |
| | ජූලි | 9.14 | 9.34 | 9.95 | - | 12.07 | - | - | 303.76 |
| | අගෝස්තු | 9.49 | 9.84 | 10.01 | - | - | - | 12.98 | 300.69 |
| | සැප්තැම්බර් | 10.49 | 10.72 | 10.05 | - | 13.79 | - | 13.98 | 301.15 |
| | ඔක්තෝබර් | 9.35 | 9.68 | 9.95 | - | 11.79 | 11.84 | - | 293.79 |
| | නොවැම්බර් | 8.73 | 8.97 | 9.08 | 11.63 | 10.62 | - | 11.28 | 292.01 |
| | දෙසැම්බර් | 8.62 | 8.77 | 8.96 | - | - | 10.42 | 10.75 | 291.68 |
| 2025 | ජනවාරි | 7.93 | 8.09 | 8.47 | - | - | 10.42 | 10.73 | 296.18 |
| | පෙබරවාරි | 7.57 | 7.87 | 8.35 | - | - | 10.63 | - | 296.80 |
| | මාර්තු | 7.50 | 7.84 | 8.25 | - | - | - | 10.72 | 295.91 |
| | අප්‍රේල් | 7.65 | 7.97 | 8.30 | - | - | 10.30 | 10.64 | 298.53 |
| | මැයි | 7.55 | 7.77 | 7.98 | - | 8.85 | 10.22 | 9.47 | 299.41 |
| | ජූනි | 7.55 | 7.75 | 7.94 | - | - | 9.41 | - | 299.90 |
| | ජූලි | 7.62 | 7.91 | 8.03 | - | - | 9.46 | 9.77 | 301.12 |
| | අගෝස්තු | 7.58 | 7.89 | 8.03 | - | - | - | - | 301.49 |

*මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව*

සමාජ සුබසාධන සහ සමාජ ආරක්ෂණ වියදම් සඳහා රුපියල් බිලියන 557.3 ක් වැය කර ඇති අතර ඒ තුළ වැඩිහිටි දීමනාව, ආබාධිත පුද්ගලයින් සඳහා දීමනා, වකුගඩු රෝගීන්ට ගෙවනු ලබන දීමනාව ඇතුළුව "අස්වැසුම" වැඩසටහනට අදාළ රු. බිලියන 112.6 ක වියදම ඇතුළත් වේ. එය 2024 වර්ෂයේ එම කාලසීමාවේ වියදමට සාපේක්ෂව සියයට 27.2 ක වර්ධනයකි.

තවද, සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් සඳහා 2024 වර්ෂයේ මුල් මාස අට තුළ රු. බිලියන 16.4 ක් වන රජයේ සුබ සාධන වියදම 2025 වර්ෂයේ එම කාල සීමාව තුළ රු. බිලියන 25.4 දක්වා වැඩි වී ඇත. "පාසල් පෝෂණ ආහාර වැඩසටහන" සඳහා පාසල් දරුවන්ගේ ආවරණය සියලුම ප්‍රාථමික පාසල් දරුවන් සඳහා පුළුල් කිරීම සියයට 54 ක් වූ මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

**2.13 වගුව : සුභසාධන වැඩසටහන් සඳහා වියදම්**

*රු. මිලි.*

| වැඩසටහනේ නම | ජන. - අගෝ. | |
|---|---|---|
| | **2024** තථ්‍ය | **2025** තාවකාලික |
| **සමාජ සුභසාධනය** | **76,784** | **94,426** |
| රජයේ රෝහල් සඳහා වෛද්‍ය සැපයුම් (ආයුර්වේද රෝහල් ඇතුළුව) | 45,780 | 74,952 |
| පාසල් ළමුන් සඳහා සෞඛ්‍ය රක්ෂණය (සුරක්ෂා) | 1,166 | 1,376 |
| විශ්‍රාමිකයන් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය | 689 | 486 |
| පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා | 251 | 490 |
| රණවිරු මාපිය රැකවරණ දීමනාව | 1,451 | 916 |
| රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී | 1,131 | 958 |
| ආර්ථික වශයෙන් ලාභ නොලබන මාර්ග සඳහා ශ්‍රී ලංගමට ලබාදෙන සහනාධාර, සමාජීය වශයෙන් අනිවාර්ය බස් සේවා (සිසු සැරිය, ගැමි සැරිය සහ නිසි සැරිය) සහ සන්නද්ධ හමුදා නිදහස් ගමන් ප්‍රවේශපත්‍ර | 2,169 | 2,606 |
| 1990 "සුව සැරිය" නොමිලේ ගිලන්රථ සේවාව | 1,514 | 1,686 |
| ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා පොළී ගෙවීම් | 20,000 | 10,000 |
| ලෝක ආහාර වැඩසටහන | 632 | 332 |
| වෙනත් | 2001 | 622 |
| **සමාජ ආරක්ෂණය** | **401,200** | **462,944** |
| අඩු ආදායම්ලාභී පවුල් සඳහා ආධාර | 97,819 | 98,132 |
| අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර | 4,288 | 9,453 |
| වැඩිහිටි පුද්ගලයින් සඳහා මූල්‍ය ආධාර | 8,709 | 29,769 |
| වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර | 1,852 | 3,166 |
| පාසල් ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මූල්‍යාධාර | - | 2,833 |
| **විශ්‍රාම වැටුප්** | **254,006** | **282,631** |
| මියගිය හා තුවාල ලැබූ රණවිරුවන් සඳහා සේවා වන්දී | 31,088 | 33,312 |
| ගොවි විශ්‍රාම වැටුප | 3,284 | 3,523 |
| වෙනත් | 155 | 126 |
| **සෞඛ්‍ය හා පෝෂණ** | **16,496** | **25,442** |
| ත්‍රිපෝෂ වැඩසටහන | 1,551 | 1,750 |
| ගැබිණි මව්වරුන් සඳහා පෝෂණීය ආහාර පැකේජය (පෝෂණ මල්ල) | 4,161 | 4,196 |
| පාසල් පෝෂ්‍යදායි ආහාර වැඩසටහන | 9,466 | 17,894 |
| පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාරය | 673 | 1,342 |
| වෙනත් | 645 | 260 |
| **අධ්‍යාපනය** | **15,326** | **18,931** |
| පාසල් පෙළ පොත් | 3,421 | 1,567 |
| පාසල් නිල ඇඳුම් | 1,039 | 58 |
| දුෂ්කර හා අතිදුෂ්කර පාසල් වල ළමුන් සඳහා පාවහන් | 570 | 2490 |
| ශිෂ්‍යත්ව- 5 ශ්‍රේණියේ සිසුන් | 616 | 824 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර | 1,750 | 3,245 |
| රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වූ ශිෂ්‍යයින් සඳහා වූ ණය යෝජනා ක්‍රමය | 1,228 | 1,335 |
| පාසල් සහ උසස් අධ්‍යාපන වාර ප්‍රවේශපත්‍ර | 6,125 | 8,250 |
| වෙනත් | 577 | 1,162 |
| **සංවර්ධන සහනාධාර** | **24,628** | **27,695** |
| පොහොර සහ බෝග සහනාධාර | 24,280 | 22,625 |
| වෙනත් | 348 | 5070 |
| **එකතුව** | **534,434** | **629,439** |

### රාජ්‍ය ආයෝජනය

2025 වර්ෂයේ මුල් මාස 8 තුළ ඇතැම් විදෙස් ණය නිදහස් කිරීමේ ප්‍රමාදයන්, ප්‍රසම්පාදන ප්‍රමාදයන්, ඉඩම් නිදහස් කර ගැනීමේ සහ පාරිසරික අනුමැතීන් ලබා ගැනීමේ ප්‍රමාදයන් මෙන්ම ඇතැම් ව්‍යාපෘතිවල සංශෝධන සඳහා ණය ලබා දෙන ආයතනවල එකඟතාවය ලැබීමේ ප්‍රමාදයන් වැනි අවහිරතාවයන් සහිතව ක්‍රියාත්මක විය.

2025 වර්ෂයේ මුල් මාස 8 තුළ දී පහත ක්ෂේත්‍රවල ව්‍යාපෘති සඳහා රු.බිලියන 338.8 ක ආයෝජනයක් දරා ඇත.

i. ග්‍රාමීය මාර්ග, පාලම්, මහාමාර්ග සහ අධිවේගී මාර්ග නඩත්තුව පුනරුත්ථාපනය සහ සංවර්ධනය සඳහා රු. බිලියන 121.5

ii. නළ ජල සම්පාදන ක්‍රම, සංවර්ධනය සහ පුළුල් කිරීම, නිවාස යෝජනා ක්‍රම සංවර්ධනය සහ නාගරික ප්‍රදේශවල පහසුකම් ඉහළ නැංවීම සඳහා රු.බිලියන 18.73

iii. දුම්රිය ඇණිය, දුම්රිය මාර්ග සහ ප්‍රවාහන පද්ධතිය පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා රු.බිලියන 9.96

iv. නවීන තාක්ෂණය හඳුන්වා දීම තුළින් කෘෂිකාර්මික අගයදාමයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා රු.බිලියන 14.99

v. ප්‍රධාන වශයෙන් උතුරු මැද පළාත් ඇළ මාර්ග සංවර්ධනයට අදාළ යටිතල පහසුකම් ඉදිකිරීම ඇතුලු අනෙකුත් වාරිමාර්ග යටිතල පහසුකම් ඉදිකිරීම සහ නඩත්තුව ඇතුලු ක්‍රියාමාර්ග මගින් කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජල සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා රු.බිලියන 20.23

vi. පාසල්, උසස් අධ්‍යාපන ආයතන, වෘත්තීය පුහුණු ආයතන ඇතුලු අධ්‍යාපනික ආයතනවල යටිතල පහසුකම් නඩත්තු සහ වැඩිදියුණු කිරීම ගුරු පුහුණු වැඩසටහන් මගින් අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා රු. බිලියන 21.8

vii. රෝහල් නඩත්තුව, සංවර්ධනය සහ උපකරණ රෝහල්වලට ලබා දීම සඳහා රු.බිලියන 19.43

viii. විදුලිබලය ලබා දීමට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු. බිලියන 2.59; සහ

ix. ජලසම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය, නෙවිල් ප්‍රනාන්දු රෝහල සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ අත්හිටවූ ජලසම්පාදන ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම ඇතුලු රාජ්‍ය ව්‍යවසායන් සඳහා හිමිකම් දායකත්වය රු. බිලියන 42.72

## 2.4 භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය

2025 වසරේ මුල් මාස අට තුළ ආදායම සහ අනෙකුත් ලැබීම් මගින් මහා භාණ්ඩාගාරයට ලැබුණු මුදල් ගලා ඒම රු. බිලියන 3,187.5 ක් වූ අතර එය ඇස්තමේන්තුගත රු. බිලියන 2,989.4 ට සාපේක්ෂව ඇස්තමේන්තුගත මුදලින් සියයට 106.6 ක් විය. මෙය 2024 එම කාලපරිච්ඡේදයේ රු. බිලියන 2,496.8 ට සාපේක්ෂව සියයට 27.6 ක වැඩිවීමකි. මේ අතර, 2025 වසරේ මුල් මාස අට තුළ පුනරාවර්තන සහ රාජ්‍ය ආයෝජන යන දෙකටම මුදල් පිටතට ගලා යාම රු. බිලියන 3,620.2 ක් වූ අතර එය 2024 එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව රු. බිලියන 3,664.7 ක සුළු අඩුවීමක් නියෝජනය කරයි.

**2.14 වගුව : රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ක්‍රියාකාරිත්වය (2025 ජන. - අගෝ)**

රු. බිලි.

| අයිතමය | ජන. - අගෝ. 2024 | ජන. - අගෝ. 2025 | |
|---|---|---|---|
| | තත්‍ය | ඇස්තමේන්තු | තත්‍ය |
| ආරම්භක මුදල් ශේෂය | 599.5 | 805.1 | 805.1 |
| ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ථ මුදල් ගලා ඒම | 2,496.8 | 2,989.4 | 3,187.4 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල සමස්ථ මුදල් ගලා යෑම් | -3,065.0 | -3,890.7 | -3,292.4 |
| ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම් | -599.7 | -676.1 | -327.7 |
| ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය) | -1,167.8 | -1,577.5 | -432.7 |
| දළ ණය ගැනීම් | 2,306.5 | 2,569.6 | 2,295.6 |
| ණය ආපසු ගෙවීම් | -924.6 | -1,286.7 | -1,457.6 |
| ශුද්ධ ණය ගැනීම් | 1,382.0 | 1,282.8 | 838.0 |
| ගැලපීම් ගිණුමේ ශේෂය (TEB/ ශුද්ධ තැන්පතු යනාදිය) | -53.5 | - | -4.7 |
| අවසාන මුදල් ශේෂය | 760.1 | 510.4 | 1,205.8 |

*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

2025 අගෝස්තු 31 දින වන විට 2024 එම කාලය තුළ රු. බිලියන 1,167.8 හා සැසඳීමේ දී ශුද්ධ මුදල් හිඟය සියයට 62.9 කින් රු. බිලියන 432.7 කට සැළකිය යුතු ලෙස පහළ යන ලදී. මෙම වර්ධනයට හේතු වූයේ කාර්යක්ෂම ආදායම් එකතු කිරීම සහ ප්‍රාග්ධන වියදම්වල සැලකිය යුතු අඩුවීමක් වන අතර එය පුනරාවර්තන වියදම්වල මධ්‍යස්ථ වැඩිවීමක් තිබියදීත්, වඩා හොඳ මුදල් ප්‍රවාහයක් පිළිබිඹු කරයි. 2025 අගෝස්තු 31 වන දිනට අවසන් ධනාත්මක මුදල් ශේෂය, 2024 අගෝස්තු 31 වන දින වාර්තා වූ රු. බිලියන 760.1 සිට රු. බිලියන 1,205.8 දක්වා සැලකිය යුතු ලෙස වැඩි වූ අතර එය රටේ වර්ධනය වූ සමස්ත මුදල් තත්ත්වය පිළිබිඹු කරයි. එම මුදල් ගලා ඒම් වැඩිවීමට හේතු වී ඇත්තේ, ආදායම් එකතු කිරීම් වැඩිවීම සහ බදු අනුකූලතාව වැඩිදියුණු වීම ය. එසේම, විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය සහ වියදම් පාලනයන් හිතකර මුදල් ශේෂයට දායක විය. මෙම ඉහළ යාමේ ප්‍රවණතාවය ධනාත්මක මූල්‍ය දැක්මක් පෙන්නුම් කරන අතර සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට සහ ආර්ථික ස්ථාවරත්වය ශක්තිමත් කිරීමට ඇති හැකියාව වැඩි කරයි.

## 2.5 රාජ්‍ය ණය කළමනාකරණය

2025 මූල්‍ය වර්ෂය සඳහා රු. බිලියන 4,000 ක මුළු දළ ණය ගැනීමේ සීමාවක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. මෙයින් රු. බිලියන 2,723.5 ක් 2025 ජනවාරි 1 සිට අගෝස්තු 31 දක්වා කාලය සඳහා වෙන් කරන ලදී. ණය ගැනීම දේශීය හා විදේශීය වෙළෙඳපොළවලින් ලබා ගත් අතර එය පිළිවෙලින් රු. බිලියන 1,847.8 ක් සහ රු. බිලියන 281.8 කි. මෙම ණය ගැනීම්වල මූලික අරමුණු වූයේ, ණය සේවා බැඳීම් සපුරාලීම සහ විවිධ සංවර්ධන මුලපිරීම් සඳහා අරමුදල් සැපයීමයි.

වාර්තාවන දිනය වන විට, 2025 වසරේ මුල් මාස අට තුළ මුළු ණය ගැනීම්වලින් ආසන්න වශයෙන් සියයට 86.8 ක් දේශීය වශයෙන් සපයාගෙන ඇත. භාණ්ඩාගාර බැඳුම්කර දේශීය ණය සේවාකරණය සඳහා පමණක් භාවිතා කරන ලදී. මෙම කාලය තුළ අනුමත ණය ගැනීමේ සීමාවේ උපයෝජනය රු. බිලියන 2,129.6 ක් ලෙස වාර්තා වූ අතර, එය ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම හරහා සිදු විය.

තවද, දත්ත මගින් රු. බිලියන 240.2 ක ශුද්ධ සෘණ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමක් පෙන්නුම් කරයි. මෙයින් අදහස් වන්නේ පිටතට ගලායාම, නව නිකුත් කිරීම් ඉක්මවා ගිය බව වන අතර, එයින් ගම්‍ය වන්නේ මෙම කාලය තුළ භාණ්ඩාගාර බිල්පත් ආපසු ගෙවීම්වල හිඟ ප්‍රමාණය අඩු කිරීම සඳහා මුදල් ප්‍රවාහ මූල්‍යකරණය යොදා ගෙන ඇත.

**2.15 වගුව : දළ දේශීය ණය මූලාශ්‍ර**
**(2025 ජන. - අගෝ)**

රු. බිලි.

| මූලාශ්‍ර | ජනවාරි - ඔක්තෝබර් 2024 |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 1,847.8 |
| **එකතුව** | **1,847.8** |

*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

තවද වෙලඳපොලෙන් ලබා ගන්නා ලද රුපියල් බිලියන 4,495 ක භාණ්ඩාගාර බිල්පත් වලට සාපේක්ෂව රුපියල් බිලියන 4,735 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් මෙම කාලය තුලදී ආපසු ගෙවන ලදී. එය රුපියල් බිලියන 240 ක භාණ්ඩාගාර බිල්පත් වල ශුද්ධ සෘණ ණය ගැනීමක් මෙම කාලය තුල දී පෙන්නුම් කරනු ලැබේ.

## 2.6 විදේශ මූල්‍යනය

### සමාලෝචනය

ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය මේ වන විට බොහෝ ලෙස අවසන් වී ඇති අතර, එය ණය තිරසාරභාවය සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලියේ වැදගත් මාර්ගයක් වේ.මෙමගින්, ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සිව් වසරක වැඩසටහන් කාලය තුළ ආසන්න වශයෙන් ඇ.ඩො. බිලියන 9.5 ක පමණ ණය සේවාකරණ ගෙවීම් අඩු කිරීමක් ලැබෙනු ඇත. එමෙන්ම, ශ්‍රී ලංකාවේ බැඳුම්කරවල පොලී අනුපාතය සියයට 31 සිට සියයට 4.4 ක් දක්වා පහත හෙලමින් සාමාන්‍ය කල් පිරීමේ කාලය වසර පහකට වඩා වැඩි වන ලෙසින් දීර්ඝ කිරීමක් ද කර ඇත.

### විදේශ මූල්‍යන

2025 වසරේ ජනවාරි මස 1 සිට අගෝස්තු මස 31 දක්වා කාලපරිච්ඡේදය තුළ ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික හෝ විදේශ වාණිජ ණයහිමියන් සමඟ නව මූල්‍යන එකඟතා නොමැත.

### විදේශ මූල්‍යන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2025 වසරේ ජනවාරි මස 1 සිට අගෝස්තු මස 31 දක්වා කාලය තුළ ලද මුළු විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණ ඇ. ඩො. මිලියන 938.8 ක් විය.

මෙම ප්‍රතිලබ්ධිවලින් ඉහළම ප්‍රමාණය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබුණු අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 73 ක් වේ. අනතුරුව ඉහළම ප්‍රමාණය පිළිවෙලින් ලෝක බැංකුව (සියයට 11) සහ ආසියානු සංවර්ධන බැංකුව (සියයට 7) සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වේ. ප්‍රධාන ද්විපාර්ශවීය ණය හිමියන් සමඟ ණය ප්‍රතිව්‍යුහගතකරණ ගිවිසුම් අත්සන් තැබූ පසු ණය උපලබ්ධි කිරීම නැවත ආරම්භ කළ අතර මෙම කාළය තුළ ද්විපාර්ශවීය ණයහිමියන් වෙතින්

උපලබ්ධි කරන ලද ණය ප්‍රමාණය ඇ.ඩො. මිලියන 26.4 කි.

උපලබ්ධි අගයන්ගේ ආංශික වර්ගීකරණය සළකා බලන කළ උපලබ්ධින්ගෙන් සියයට 65 ක් වූ ඉහළම කොටස අයවැය මූල්‍යනය සඳහා වෙන්ව තිබූ අතර මානුශිය සහාය සඳහා සියයට 7ක් සහ ජල සම්පාදන සහ සනීපාරක්ෂක අංශය සඳහා සියයට 5 ක අගයක් වාර්තා කර තිබුණි.

**2.16 වගුව : 2025 වසරේ ජනවාරි මස 1 සිට අගෝස්තු මස 31 දක්වා විදේශ මූල්‍යන ප්‍රතිලබ්ධි ප්‍රමාණය**

| සංවර්ධන පාර්ශ්වකරු/ ණය නියෝජිත ආයතන | ප්‍රතිලබ්ධි ප්‍රමාණය * (ඇ. ඩො. මිලි.) |
|---|---|
| | ණය |
| **ද්විපාර්ශ්වික** | **26.4** |
| ජපානය | 14.3 |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල | 8.1 |
| නෙදර්ලන්තය | 2.6 |
| කොරියාව | 1.2 |
| **බහුපාර්ශ්වික** | **912.4** |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 681.6 |
| ලෝක බැංකුව | 107.5 |
| ආසියානු සංවර්ධන බැංකුව | 70.4 |
| ඔපෙක් අරමුදල | 33.9 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 17.9 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 1 |
| **එකතුව** | **938.8** |

*මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය*

*සටහන්: එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් ඇ.ඩො. බවට පරිවර්තනය කිරීමේදී, එක් එක් ප්‍රතිලබ්ධීන් සිදුවූ දිනයන්හි පැවති විනිමය අනුපාතිකය භාවිතා කර ඇත.*

*විශේෂ ගැනුම් හිමිකම් විනිමය ඇ.ඩො. බවට පරිවර්තනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතික භාවිතා කර ඇත.*

**තාවකාලික අගයන්*

**2.4 රූපසටහන : 2025 වසරේ ජනවාරි මස 1 සිට අගෝස්තු මස 31 දක්වා සිදුවූ ප්‍රතිලබ්ධි - සංවර්ධන පාර්ශ්වකරු/ ණය නියෝජිත ආයතනය අනුව (ඇ.ඩො. මිලි.)**




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

**2.5 රූපසටහන :2025 ජනවාරි 1 සිට අගෝස්තු 31 දක්වා සිදුවූ ප්‍රතිලබ්ධි ප්‍රධාන ආර්ථික අංශ අනුව (ඇ. ඩො. මිලි.)**




*මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය*
*** වෙනත් = අධ්‍යාපනික හා පුහුණු, වාරිමාර්ග, නිවාස හා නාගරික සංවර්ධනය, කෘෂිකර්මාන්තය, විද්‍යාව හා තාක්ෂණය, ඉඩම් සංවර්ධනය, ධීවර හා වැවිලි*

## විදේශ ණය ප්‍රමාණය සහ විදේශ ණය සේවාකරණය

2025 වසරේ අගෝස්තු මස අවසන් වන විට රජය ලබාගෙන තිබූ විදේශ ණය ප්‍රමාණය ඇ. ඩො. බිලියන 37.3 ක් විය[1]. රජයේ මුළු විදේශ ණයවලින් සියයට 36 ක් බහුපාර්ශ්වික ණය වන අතර, වාණිජ ණය සියයට 34 ක් ද ද්විපාර්ශ්වික ණය සියයට 30 ක් ද වේ. වාණිජ ණයවලින් ආසන්න වශයෙන් සියයට 81 ක් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ISB) වලින් සමන්විත වන අතර, ඉතිරිය විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් වලින් සමන්විත වේ.

බහුපාර්ශ්වික ණයහිමියන් අතරින්, ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව එක්ව මුළු බහුපාර්ශ්වික ණය ප්‍රමාණයෙන් සියයට 83 කට වැඩි ප්‍රමාණයක් නියෝජනය කරනු ලබයි . ද්විපාර්ශ්වික ණයවලින්, සියයට 61 ක් පැරිස් සමාජ නොවන ණයහිමියන් සතු වූ අතර ඉතිරි සියයට 39 පැරිස් සමාජ සාමාජික රටවලින් සමන්විත වේ.

2025 වසරේ ජනවාරි මස 1 සිට අගෝස්තු මස 31 දින දක්වා මුළු ණය සේවාකරණය[2] ඇ.ඩො. මිලියන 1,745.0 ක් වූ අතර, එයින් ඇ.ඩො. මිලියන 1,036.2 ක් ණය වාරික ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඇ.ඩො. මිලියන 708.8 ක ප්‍රමාණය පොලී ගෙවීම් සඳහා යොදවා ඇත.

2025 වසරේ අගෝස්තු මස අවසානය වන විට නොපියවූ විදේශ ණය හිඟ ගෙවීම් නොමැත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අර්ථ දක්වා ඇති පරිදි විදේශ ණය හිඟ ගෙවීම් යනු ගිවිසුම්ගත ගිවිසුම්වල නිශ්චිතව දක්වා ඇති පරිදි, අදාළ සහන කාලයකට යටත්ව, නියමිත කාලසීමාවේදී ගෙවා නොමැති අනේවාසික ණය-සේවා බැඳීම් (මූලික ගෙවීම් සහ පොලී ගෙවීම්) වේ. කෙසේ වෙතත්, මතභේදයට තුඩු දී ඇති හිඟ ණය සහ ණය සේවා බැඳීම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන අධීක්ෂණය සඳහා විදේශ ණය හිඟ ගෙවීම් ලෙස නොසැලකේ. එනම්, නැවත කාලසටහන්ගත කිරීමේ හෝ ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුමක් අපේක්ෂා කරන ණය සේවාව නොගෙවීමෙන් ඇතිවන හිඟ මුදල්, මෙම අර්ථ දැක්වීමෙන් බැහැර කර ඇත[3].

---

1. තාවකාලික අගයයන්, ණය සේවාකරණය, තාවකාලිකව නතර කිරීමේ ප්‍රතිපත්තිමය තීරණයෙන් පසු එකතු වූ නොගෙවූ ණය වාරික ද ඇතුලුව මධ්‍යම රජයේ හිඟ විදේශ ණය පමණක් නිරූපණය කර ඇත.
   - භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරයන්හි අනේවාසික ආයෝජන ඇතුලත් නොවේ.
   - ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි ගෙවීමට ඇති ණය ප්‍රමාණ එහි හිමිකාරීත්වයේ නේවාසික/අනේවාසික තත්ත්වය මත වර්ගීකරණය කර නොමැත.
2. ණය සේවාකරණ = ණය ආපසු ගෙවීම +පොලී ගෙවීම
3. මූලාශ්‍රය: 2025 ජූලි දිනැති IMF වාර්තාව අංක 25/162

# ආර්ථික උපනතීන් 03

## 3.1 සමාලෝචනය

2025 වසරේ පළමු භාගයේදී, දේශීය හා විදේශීය වශයෙන් මුහුණපෑමට සිදු වූ බාධකයන්ට ඔරොත්තු දෙමින් ආර්ථිකයේ සියලු අංශවල කැපී පෙනෙන ප්‍රතිඵල පිළිඹිබු කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය තවදුරටත් ශක්තිමත් විය. 2025 වසරේ පළමු භාගයේදී ආර්ථිකය සියයට 4.8 කින් වර්ධනය වූ අතර, කෘෂිකර්මාන්ත, කර්මාන්ත, සේවා සහ සහනාධාර අඩු කළ බදු ඇතුළුව ආර්ථිකයේ සියලුම අංශ පුළුල් පදනමකින් යථා තත්ත්වයට පත් විය. මාස එකොළහක් මුළුල්ලේ ඍණ කලාපයේ පැවති උද්ධමනය 2025 වසරේ සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවලදී පිළිවෙලින් සියයට 1.5 ක් සහ සියයට 2.1 ක් වාර්තා කරමින් ධනාත්මක කලාපයකට අවතීර්ණ විය. 2025 වසරේ සැප්තැම්බර් මස අවසාන වන විට දළ නිල සංචිත ඇ.ඩො. බිලියන 6.2 කරා ළඟා විය. වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධ අවිනිශ්චිතතාවයන් ඉහළ යාම සහ භූ දේශපාලනික බාධාවන් මධ්‍යයේ වුවද, විදේශ අංශය කම්පනයන්ට ඔරොත්තු දෙන ලදී. ප්‍රධාන වශයෙන් සංචාරක ඉපැයීම් සහ සේවක ප්‍රේෂණ වර්ධනය වීම හේතුවෙන් 2025 වසරේ පළමු මාස අට තුළ විදේශ අංශයේ ජංගම ගිණුමේ ශේෂය ඇ.ඩො. බිලියන 2 ක අතිරික්තයක් වාර්තා කරන ලදී. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය බොහෝදුරට අවසන් වීම හේතුවෙන් ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් වීම සඳහා ප්‍රවේශ සැළසී ඇත. වර්ධන විභවය වැඩිදියුණු කිරීම සඳහා ආර්ථිකයේ ව්‍යුහාත්මක දුර්වලතා විසඳාලීමට රජය කටයුතු කරමින් සිටී.

අත්‍යවශ්‍ය ගැලපුම් සමඟ ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වා ගන්නා අතරම පුළුල් වශයෙන් දූෂණ-විරෝධී ක්‍රියාමාර්ග හඳුන්වාදෙමින් සාර්ව ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු කිරීමට සහාය වන සියලුම අංශ හරහා විනිවිදභාවය සහ වගවීම වර්ධනය කිරීම සඳහා විශාල පරාසයක පැතිරුණු බෙහෙවින් අවශ්‍ය ප්‍රතිසංස්කරණ පියවර ගණනාවක් මෙහිලා ක්‍රියාත්මක කර ඇත. ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සහ ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා වන ප්‍රයත්නයන් කෙරෙහි ආයෝජකයින්ගේ විශ්වාසය පිළිබිඹු කරමින්, ෆිච් ශ්‍රේණිගත කිරීම් ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශ මුදල් නිකුත්කරන්නන්ගේ පැහැර හැරීම් ශ්‍රේණිගත කිරීම 'සීමාකරන ලද ණය පැහැර හැරීම්' මට්ටමේ සිට 'CCC+' මට්ටම දක්වාත්, මූඩීස් ආයෝජක සේවාව එහි දිගුකාලීන විදේශ මුදල් නිකුත්කරන්නන්ගේ ශ්‍රේණිගත කිරීම 'Ca' මට්ටමේ සිට 'Caa1' මට්ටම දක්වාත්, එස් ඇන්ඩ් පී ගෝලීය ශ්‍රේණිගත කිරීම් ශ්‍රී ලංකාවේ දිගුකාලීන සහ කෙටි කාලීන විදේශ මුදල් ශ්‍රේණිගත කිරීම් 'SD/SD' මට්ටමේ සිට 'CCC+/C' මට්ටම දක්වාත් ඉහළ නංවා ඇත.

**3.1 රූපසටහන : දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, රාජ්‍ය හා අවිධිමත් අංශයේ වැටුප් වැඩි කිරීම, පෞද්ගලික අංශය සඳහා විශාල වශයෙන් ණය ලබා දීම සහ 2025 වසරේ පෙබරවාරි මාසයේ සිට වාහන ආනයන සීමාවන් ඉවත් කිරීම දේශීය ඉල්ලුම ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් කිරීම සඳහා උපකාරී විය.

නිෂ්පාදන, පතල් හා ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල ශක්තිමත් කාර්යසාධනය හේතුවෙන් කර්මාන්ත අංශය ප්‍රසාරණය වීමත් මූල්‍ය සේවා හා රක්ෂණ කටයුතු ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කිරීම සහ සංචාරක අංශය යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් සේවා අංශය ප්‍රසාරණය වීමත් ආර්ථික ක්‍රියාකාරකම් ව්‍යාප්ත වීමට බලපා ඇත.

පිරිමි සහ කාන්තා යන දෙපාර්ශවයේම සේවා වියුක්ති අනුපාත පිළිවෙලින් සියයට 2.5 සහ සියයට 6.3 දක්වා පහත වැටීම හේතුවෙන් සේවා වියුක්ති අනුපාතය 2024 වසරේ පළමු කාර්තුවේදී වාර්තා වූ සියයට 4.5 ට සාපේක්ෂව 2025 වසරේ පළමු කාර්තුවේදී සියයට 3.8 දක්වා පහත වැටුණි. මේ අතර, පිරිමි සහ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාත පිළිවෙලින් සියයට 70.1 සහ සියයට 32.0 දක්වා ඉහළ යාම හේතුවෙන් 2024 වසරේ පළමු කාර්තුවේදී සියයට 47.1 ක් වූ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2025 වසරේ පළමු කාර්තුවේදී සියයට 49.7 ක් දක්වා ඉහළ ගොස් ඇත.

**3.2 රූපසටහන : දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය - 2025 පළමු භාගය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

මහ බැංකුව විසින් අනුගමනය කරන ලද ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාත යාන්ත්‍රණය වෙනුවට 2024 වසරේ නොවැම්බර් මස 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තනි ප්‍රතිපත්ති පොලී අනුපාත යාන්ත්‍රණයක් මඟින් එය ප්‍රතිස්ථාපනය වූ අතර, ආරම්භයේදී සියයට 8 ක් ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතය හඳුන්වා දෙමින් ඉදිරියේදී මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සම්බන්ධයෙන් පුරෝකතනය කිරීමට සහ මෙහෙයවීමට ප්‍රාථමික මුදල් ප්‍රතිපත්ති මෙවලමක් ලෙස එය ඉදිරිපත් කරන ලදී. 2025 වසරේ මැයි මස අවසාන වන විට එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතය සියයට 7.75 ක් දක්වා අඩු කරමින් 2025 වසර මුළුල්ලේ මහ බැංකුව විසින් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගෙන ඇත. පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වර්තමානයේ සිදුවන ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය සඳහා සහාය වන අතරම සියයට 5.0 ක් වූ මධ්‍ය කාලීන උද්ධමන ඉලක්කය ළඟා කර ගැනීම හා අනුරූපවනු ඇතැයි අපේක්ෂා කෙරෙන බැවින් ප්‍රතිපත්ති පොලී අනුපාතය එම මට්ටමේ පවත්වා ගෙන තිබේ.

වසරකට ආසන්න කාලයක් අවධමනයක් වාර්තා කිරීමෙන් අනතුරුව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද. 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2025 වසරේ සැප්තැම්බර් මාසයේදී සියයට 1.5 සිට 2025 වසරේ ඔක්තෝබර් මාසයේදී සියයට 2.1 දක්වා වැඩි විය. ආහාර උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) 2025 වසරේ සැප්තැම්බර් මාසයේදී සියයට 2.9 දක්වා වේගයෙන් වර්ධනය වූ අතර, ආහාර නොවන කාණ්ඩයන්ගේ උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) සියයට 0.7 ක ස්ථාවර මට්ටමේ පැවතුනි. සුදුසු මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති නොකඩවා ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඉදිරි මාස කිහිපය තුළ උද්ධමනය ක්‍රමයෙන් ඉහළ යා හැකි බවත්, මධ්‍ය කාලීනව එය සියයට 5 ක ඉලක්කය කරා ළඟා වන බවත් ඉදිරි පුරෝකථන මඟින් පිළිබිඹු වේ. මේ අතර, ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරනු ලබන මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) 2025 වසරේ සැප්තැම්බර් මාසයේදී සියයට 2.0 ක නොවෙනස්ව පැවතුනි.

වර්තමානයේ සිදුවන ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය සඳහා සහාය වෙමින් කොටස් වෙළඳපොළ කාර්යසාධනයේ සැළකියයුතු වර්ධනයක් වාර්තා විය. ආයෝජකයින්ගේ විශ්වාසය යළි ගොඩ නැගීම හා වෙළෙඳපොල ප්‍රවේශය වැඩිදියුණු කිරීම පිළිබිඹු කරමින් 2025 වසරේ ජූනි මස අවසාන වන විට (වාර්ෂික ලක්ෂ්‍යමය) සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) ඒකක 18,027 ක් දක්වා සියයට 48.4 කින් වර්ධනය වූ අතර, (වාර්ෂික ලක්ෂ්‍යමය) ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 දර්ශකය (2004=1,000) ඒකක 5,353 ක් දක්වා සියයට 49.2 කින් වර්ධනය විය.

2025 වසරේ පළමු මාස අට තුළ විදේශ අංශය සාධනීය කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී. විදේශීය ඉල්ලුම ශක්තිමත් ලෙස වර්ධනය වීම සහ ප්‍රධාන අපනයන කර්මාන්ත යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින් 2024 වසරේ පළමු මාස අට තුල ඇ.ඩො. බිලියන 8.5 ක් වූ වෙළඳ භාණ්ඩ අපනයන, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුල ඇ.ඩො. බිලියන 9.1 දක්වා සියයට 6.7 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් දේශීය ඉල්ලුම ඉහළ යාම සහ ආනයන සීමා ලිහිල් කිරීම හේතුවෙන් පෙර වසරේ පළමු මාස අට තුල ඇ.ඩො. බිලියන 12.1 ක් වූ වෙළඳ භාණ්ඩ ආනයන, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුල ඇ.ඩො. බිලියන 13.3 ක් දක්වා සියයට 10.5 කින් වර්ධනය විය. ඒ හා සමගාමීව, 2024 වසරේ පළමු මාස අට තුළ වෙළඳ හිඟය ඇ.ඩො. බිලියන 3.6 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුල ඇ.ඩො. බිලියන 4.3 දක්වා පුළුල් විය.

ප්‍රධාන සංක්‍රමණික ගමනාන්තවලින් ප්‍රබල වශයෙන් ලැබුණු ගලා ඒම් පිළිබිඹු කරමින්, 2024 වසරේ පළමු මාස අට තුල ඇ.ඩො. බිලියන 4.3 ක් වූ ශ්‍රමික ප්‍රේෂණ, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුල ඇ.ඩො. බිලියන 5.1 ක් දක්වා සියයට 19.3 ක සැළකියයුතු වර්ධනයක් වාර්තා කරන ලදී. සංචාරක පැමිණීම් ඉහළ යාම සහ එක් සංචාරකයකු විසින් දරනු ලබන වියදම ඉහළ යාම හේතුවෙන් පෙර වසරේ පළමු මාස අට තුල ඇ.ඩො. බිලියන 2.2 ක් වූ සංචාරක ඉපැයීම් 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී ඇ.ඩො. බිලියන 2.3 ක් දක්වා සියයට 5.7 කින් වැඩි විය. ඒ හා සමගාමීව, සේවා අංශයෙන් ලැබුණු ශුද්ධ ගලා ඒම් 2024 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ ඇ.ඩො. බිලියන 2.6 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුල ඇ.ඩො. බිලියන 2.7 දක්වා ප්‍රසාරණය විය.

ණය සේවාකරණය සම්බන්ධ වගකීම් මධ්‍යයේ වුව ද, 2025 වසරේ සැප්තැම්බර් මස අවසාන වන විට චීන මහජන බැංකුවේ විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළත්ව දළ නිල සංචිත ප්‍රමාණය ඇ.ඩො. බිලියන 6.2 ක් විය. 2025 වසරේ සැප්තැම්බර් මස අවසාන වන විට, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල වසර ආරම්භයේ සිට මේ දක්වා සියයට 3.3 කින් අවප්‍රමාණය වී තිබේ.

### 3.2 ආර්ථික වර්ධනය

කෘෂිකර්මාන්ත, කර්මාන්ත, සේවා සහ සහනාධාර අඩු කළ බදු යන ආර්ථිකයේ සියලුම අංශවල සිදුවූ ධනාත්මක වර්ධනය හේතුවෙන් 2024 වසරේ පළමු භාගයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය සියයට 4.8 කින් ප්‍රසාරණය විය. කෘෂිකාර්මික අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 1.8 ක වර්ධනයට

සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 0.6 කින් සුළු වශයෙන් වර්ධනය විය. කර්මාන්ත අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 10.5 ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 7.9 කින් මධ්‍යස්ථ වශයෙන් වර්ධනය විය. 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 2.3 ක වර්ධනයට සාපේක්ෂව, සේවා අංශය, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 3.3 කින් මධ්‍යස්ථ ලෙස ප්‍රසාරණය විය. භාණ්ඩ හා සේවා මත අයකෙරෙන සහනාධාර අඩු කළ බදු, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 6.4 ක වැඩිවීමට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 10.6 කින් වැඩි විය.

### කෘෂිකර්මාන්තය

ද.දේ.නි.යෙන් සියයට 8.8 ක් සඳහා දායකත්වය දක්වන කෘෂිකාර්මික අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 1.8 ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 0.6 කින් සුළු වශයෙන් වර්ධනය විය. ධාන්‍ය වගාව (වී හැර), සත්ත්ව නිෂ්පාදනය, පැළ බෝකිරීම, වන වගා සහ දැව කඳන් නිෂ්පාදනය, සහ කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව වැනි උප අංශයන්හි ධනාත්මක වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ නමුත්, තෙල් සහිත පලතුරු වගාව (පොල්, තැඹිලි, කටුපොල්), රබර් වගා කිරීම, සහ මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීවී වගාව වැනි උප අංශ මෙම කාලපරිච්ඡේදය තුළ දී සැලකිය යුතු ලෙස සංකෝචනය විය.

**3.1 වගුව : ස්ථාවර (2015) මිල ගණන් අනුව ද. දේ . නි. යෙහි ආංශික සංයුතිය**

*රු. මිලි.*

| | අංශය | 2022 | 2023 | 2024(අ) | පළමු භාගය | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2024(ආ) | 2025(අ) | 2024(ආ) | 2025(අ) |
| | **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **911,252** | **925,822** | **937,104** | **466,927** | **469,935** | **1.8** | **0.6** |
| 1 | ධාන්‍ය (වී හැර) | 16,507 | 16,920 | 18,758 | 9,573 | 10,100 | 17.1 | 5.5 |
| 2 | වී වගාව | 94,730 | 110,946 | 114,369 | 56,261 | 57,599 | 5.5 | 2.4 |
| 3 | එළවළු වගාව | 103,161 | 106,135 | 109,069 | 52,499 | 52,077 | -0.1 | -0.8 |
| 4 | උක් වගාව දුම්කොළ වගාව සහ වෙනත් බහු වාර්ෂික නොවන භෝග | 3,803 | 3,515 | 3,187 | 1,555 | 1,570 | (11.3) | 1 |
| 5 | පළතුරු වගාව | 73,310 | 78,076 | 81,548 | 40,368 | 41,163 | 4.0 | 2.0 |
| 6 | තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල් තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 111,196 | 104,725 | 92,703 | 51,171 | 44,931 | -1.5 | -12.2 |
| 7 | තේ වගාව | 62,867 | 61,912 | 62,953 | 30,635 | 32,428 | -6.4 | 5.9 |
| 8 | වෙනත් පානීය භෝග වගාවන් (කෝපි කොකෝවා ආදී) | 1,229 | 1,136 | 1,110 | 555 | 596 | -2.3 | 7.4 |
| 9 | කුළුබඩු , සුවඳ දෙන භෝග බෙහෙත් සහ ඖෂධීය පැලෑටි වර්ග | 101,653 | 99,729 | 101,653 | 49583 | 50,576 | 2.8 | 2 |
| 10 | රබර් වගාව | 23,871 | 22,024 | 22,503 | 11942 | 9,903 | -3.6 | -17.1 |
| 11 | වෙනත් බහු වාර්ෂික භෝග වගාව | 27,533 | 29,440 | 25,949 | 12942 | 12,862 | -12.4 | -0.6 |
| 12 | සත්ව නිෂ්පාදනයන් | 83,307 | 83,587 | 95,363 | 45455 | 52,860 | 9.2 | 16.3 |
| 13 | පැල බෝ කිරීම | 965 | 728 | 626 | 311 | 339 | -26.1 | 8.8 |
| 14 | කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 33,062 | 32,888 | 31,868 | 17659 | 18,256 | -2.5 | 3.4 |
| 15 | වන වගාව දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 50,931 | 47,221 | 46,209 | 22,378 | 23,892 | -0.8 | 6.8 |
| 16 | කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව | 95,447 | 100,099 | 104,947 | 51,374 | 54,042 | 4.2 | 5.2 |
| 17 | මිරිදිය ධීවර කර්මාන්තය හා මිරිදිය ජලජීවී වගාව | 27,682 | 26,739 | 24,290 | 12,665 | 6,740 | 11.9 | -46.8 |

රු. මිලි.

| | අංශය | 2022 | 2023 | 2024(අ) | පළමු භාගය | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2024(ආ) | 2025(අ) | 2024(ආ) | 2025(අ) |
| | **කර්මාන්ත** | **3,308,573** | **3,002,968** | **3,333,008** | **1,654,609** | **1,785,503** | **10.5** | **7.9** |
| 18 | පතල් හා කැණීම් කර්මාන්තය | 198,613 | 154,303 | 184,166 | 88,929 | 101,795 | 14.2 | 14.5 |
| 19 | ආහාර බීම සහ දුම් කොළ නිෂ්පාදනය | 869,371 | 899,739 | 954,409 | 471,506 | 490,008 | 8.8 | 3.9 |
| 20 | රෙදිපිළි, නිමිඇඳුම් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය | 511,860 | 450,438 | 500,210 | 249,361 | 284,023 | 6.5 | 13.9 |
| 21 | ගෘහ භාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 29,758 | 23,807 | 24,975 | 11,646 | 11,766 | 12.1 | 1.0 |
| 22 | කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | 52,069 | 47,259 | 48,734 | 26,922 | 30,789 | -0.2 | 14.4 |
| 23 | අඟුරු සහ ඛනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 6,474 | 21,895 | 19,690 | 11,349 | 12,485 | 5.8 | 10.0 |
| 24 | රසායනික ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 82,349 | 82,949 | 90,994 | 50,241 | 48,742 | 21.5 | -3.0 |
| 25 | රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 67,505 | 56,157 | 60,972 | 31,093 | 32,445 | 8.2 | 4.3 |
| 26 | ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන | 85,182 | 84,670 | 86,813 | 45,546 | 54,727 | 4.3 | 20.2 |
| 27 | ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 58,780 | 60,303 | 70,963 | 31,080 | 34,076 | 39.2 | 9.6 |
| 28 | යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 59,181 | 50,229 | 53,372 | 22,068 | 23,503 | 3.2 | 6.5 |
| 29 | ගෘහ භාණ්ඩ නිෂ්පාදන | 60,837 | 56,089 | 61,740 | 36,648 | 40,118 | 6.6 | 9.5 |
| 30 | කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවිකිරීම් | 79,088 | 66,747 | 72,427 | 42,375 | 39,275 | 9.7 | -7.3 |
| 31 | විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 178,059 | 174,017 | 185,978 | 95,721 | 99,926 | 13.2 | 4.4 |
| 32 | ජලය එක් රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | 14,059 | 11,590 | 11,906 | 6,504 | 6,818 | 5.2 | 4.8 |
| 33 | මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය | 28,070 | 27,955 | 28,319 | 13,135 | 14,114 | 3.8 | 7.5 |
| 34 | ඉදිකිරීම් කර්මාන්තය | 927,319 | 734,821 | 877,339 | 420,486 | 460,892 | 13.7 | 9.6 |
| | **සේවාවන්** | **7,217,485** | **7,206,496** | **7,381,059** | **3,560,132** | **3,677,533** | **2.3** | **3.3** |
| 35 | තොග හා සිල්ලර වෙළඳාම | 1,675,528 | 1,677,941 | 1,700,232 | 853,201 | 865,889 | 1.1 | 1.5 |
| 36 | මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 1,364,677 | 1,422,786 | 1,464,296 | 713,291 | 736,020 | 3.3 | 3.2 |
| 37 | තැපැල් හා කුරියර් සේවාවන් | 19,780 | 20,349 | 21,627 | 10,621 | 11,496 | 8.1 | 8.2 |
| 38 | නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 166,030 | 209,172 | 274,921 | 128,642 | 144,995 | 34.4 | 12.7 |
| 39 | ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 37,350 | 36,551 | 37,767 | 19,331 | 19,601 | 3.7 | 1.4 |
| 40 | විදුලි සංදේශ සේවාවන් | 140,524 | 137,403 | 143,109 | 70,575 | 72,675 | 4.0 | 3.0 |
| 41 | පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 238,455 | 187,341 | 198,512 | 97,678 | 109,916 | 2.3 | 12.5 |
| 42 | මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා | 529,744 | 475,201 | 482,557 | 233,540 | 264,876 | -0.2 | 13.4 |

*රු. මිලි.*

| | අංශය | 2022 | 2023 | 2024(අ) | පළමු භාගය | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2024(ආ) | 2025(අ) | 2024(ආ) | 2025(අ) |
| 43 | රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල් | 78,187 | 103,519 | 89,030 | 45,378 | 51,623 | -8.7 | 13.8 |
| 44 | නිවාස අයිතිය හා දේපල වෙළඳාම | 554,456 | 521,463 | 543,265 | 275,632 | 284,487 | 4.4 | 3.2 |
| 45 | වෘත්තියමය සේවාවන් | 248,467 | 254,360 | 263,382 | 117,330 | 120,480 | 3.9 | 2.7 |
| 46 | රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යාවශ්‍ය සමාජ ආරක්ෂාව | 629,031 | 618,542 | 600,314 | 281,558 | 274,577 | -3.7 | -2.5 |
| 47 | අධ්‍යාපනය | 302,435 | 307,712 | 314,755 | 161,451 | 162,759 | 2.4 | 0.8 |
| 48 | සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 237,677 | 236,087 | 234,358 | 100,252 | 102,569 | -1.8 | 2.3 |
| 49 | වෙනත් පෞද්ගලික සේවාවන් | 995,147 | 998,069 | 1,012,933 | 451,649 | 455,567 | 1.1 | 0.9 |
| | **සමස්ත එකතුකළ අගය (GVA) මූලික මිළ ගණන් අනුව** | **11,437,311** | **11,135,286** | **11,651,170** | **5,681,668** | **5,932,971** | **4.5** | **4.4** |
| | **(+) භාණ්ඩ හා සේවා මත අයකරන බදු (-) සහනාධාර** | **723,576** | **742,270** | **821,299** | **386,605** | **427,676** | **6.4** | **10.6** |
| | **දළ දේශීය නිෂ්පාදිතය (GDP), වෙළඳපොළ මිල** | **12,160,886** | **11,877,556** | **12,472,469** | **6,068,273** | **6,360,647** | **4.6** | **4.8** |

*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

*(ආ) සංශෝධිත*

**3.3 රූපසටහන : කෘෂිකාර්මික අංශයේ සංයුතිය - 2025 පළමු භාගය**




***මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව***

### වී වගාව

වී වගාව යන උප අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 5.5 ක ප්‍රසාරණයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 2.4 කින් සුළු වශයෙන් ප්‍රසාරණය විය. 2025 වසරේ මාර්තු මස අවසානය වන විට වාර්තා වී ඇති වපුරන ලද බිම් ප්‍රමාණය මත පදනම්ව ගත් විට, 2024/2025 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.62 ක් වූ අතර එය 2023/2024 මහ කන්නයේ අස්වැන්නට සාපේක්ෂව සියයට 3.8 ක පහත වැටීමකි. ගංවතුර හේතුවෙන් වී වගාවන්ට හානි සිදුවීම, රෝග හා පළිබෝධ ආක්‍රමණ, සහ කහ වීම, මෙලෙස නිෂ්පාදනය අඩුවීම සඳහා හේතු වශයෙන් දැක්විය හැක. කෙසේ නමුත්, 2025 වසරේ ජූලි මස අවසානය වන විට වාර්තා වී ඇති වපුරන ලද බිම් ප්‍රමාණය මත පදනම්ව ගත් විට, 2025 යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.2 ක් වූ අතර, එය 2024 යල කන්නයේ අස්වැන්නට සාපේක්ෂව සියයට 11.7 ක ඉහළ යාමකි. යල කන්නය තුළ ප්‍රමාණවත් ජල සැපයුමක් පැවතීම හේතුවෙන් වපුරන ලද බිම් ප්‍රමාණය පුළුල් වීම, මෙලෙස නිෂ්පාදනය ඉහළ යාම සඳහා හේතු විය.

### තේ, රබර් සහ පොල්

තේ වගා කිරීම යන උප අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 6.4 ක සංකෝචනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 5.9 කින් ප්‍රසාරණය විය. 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 128.0 ක තේ නිෂ්පාදනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 134.9 ක් දක්වා සියයට 5.5 කින් ඉහළ යන ලදී. මෙලෙස තේ නිෂ්පාදනය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ හිතකර කාලගුණික තත්ත්වයන් ය. රබර් වගා කිරීම යන උප අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 3.6 ක සුළු සංකෝචනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 17.1 කින් සැලකිය යුතු ලෙස සංකෝචනය විය. 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 37.0 ක රබර් නිෂ්පාදනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 32.4 ක් දක්වා සියයට 12.4 කින් මධ්‍යස්ථ ලෙස පහත වැටුණි. තවද, තෙල් සහිත පලතුරු වගාව (පොල්, තැඹිලි, කටුපොල්) යන උප අංශය ද, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 1.5 ක සංකෝචනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 12.2 කින් සංකෝචනය විය. ඒ අනුව, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ ගෙඩි මිලියන 1,549 ක පොල් නිෂ්පාදනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 1,351 ක් දක්වා සියයට 12.8 කින් පහත වැටුණි.

### ධාන්‍ය වර්ග, එළවළු, පළතුරු, කුළුබඩු සහ ඖෂධ භෝග

ධාන්‍ය වගාව (වී හැර) යන උප අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 17.1 ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 5.5 කින් සුළු වශයෙන් වර්ධනය විය. එළවළු වගාව යන උප අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 0.1 ක ඉතා සුළු සංකෝචනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 0.8 කින් සංකෝචනය වූ අතර, පළතුරු වගාව යන උප අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 4.0 ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 2.0 කින් වර්ධනය විය. කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධ භෝග වගාව යන උප අංශය ද, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 2.8 ක ප්‍රසාරණයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 2.0 කින් ප්‍රසාරණය විය.

### ධීවර හා පශු සම්පත්

කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව යන උප අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 4.2 ක ප්‍රසාරණයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 5.2 කින් ප්‍රසාරණය විය. කෙසේ නමුත්, මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීවී වගාව යන උප අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 11.9 ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 46.8 කින් සැලකිය යුතු ලෙස සංකෝචනය විය. මිරිදිය ධීවර කටයුතුවල සිදුවූ සැලකිය යුතු සංකෝචනය හේතුවෙන්, සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය (කරදිය සහ මිරිදිය), 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 204 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී කිලෝග්‍රෑම් මිලියන 186 ක් දක්වා පහත වැටුණි. සත්ත්ව නිෂ්පාදනය යන උප අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 9.2 ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 16.3 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය විය.

### කර්මාන්ත හා නිෂ්පාදන

ද.දේ.නි.යෙන් සියයට 26.0 ක් සඳහා දායකත්වය දක්වන කර්මාන්ත අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 10.5 ක ධනාත්මක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ සමාන

කාලපරිච්ඡේදය තුළ දී සියයට 7.9 කින් ධනාත්මක ලෙස වර්ධනය විය. ඉදිකිරීම් කර්මාන්තය, පතල් හා කැණීම් කර්මාන්තය, රෙදිපිළි, නිමිඇඳුම් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය, ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදනය, සහ විදුලිය, ගෑස්, වායු හා වායු සමීකරණ සැපයීම යන උප අංශ පිළිවෙළින් සියයට 9.6, සියයට 14.5, සියයට 13.9, සියයට 20.2 හා සියයට 4.4 ක් ලෙස ධනාත්මක වර්ධනයන් වාර්තා කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

මීට අමතරව ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය (සියයට 3.9), ගෘහ භාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන (සියයට 1.0), කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රව්‍ය තැටි නැවත නිෂ්පාදනය (සියයට 14.4), අඟුරු සහ පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදන (සියයට 10.0), රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනය (සියයට 4.3), මූලික ලෝහ සහ ව්‍යුහාත්මක ලෝහ නිෂ්පාදන (සියයට 9.6), යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය (සියයට 6.5), ගෘහ භාණ්ඩ නිෂ්පාදනය (සියයට 9.5), ජලය එක්රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදාහැරීම (සියයට 4.8), සහ මලාපවහන සහ කැලි කසල බැහැර කිරීම (සියයට 7.5) යන උප අංශ ද 2024 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ප්‍රසාරණය වී ඇත.

කෙසේ නමුත්, රසායනික ද්‍රව්‍ය සහ මූලික ඖෂධ නිෂ්පාදනය යන උප අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 21.5 ක සැලකිය යුතු වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 3.0 කින් සංකෝචනය විය. තවද, අනෙකුත් නිමැවුම් කර්මාන්ත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ අලුත්වැඩියා කිරීම සහ ස්ථාපනය කිරීම යන උප අංශය ද, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 9.7 ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 7.3 කින් සංකෝචනය විය.

සමස්ත බලශක්ති උත්පාදනය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ ගිගාවොට් පැය 8,284 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ගිගාවොට් පැය 8,675 ක් දක්වා සියයට 4.7 කින් වැඩි විය. කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම්වල ප්‍රසාරණය හේතුවෙන්, කර්මාන්ත අංශයට අලෙවි කළ විදුලි ඒකක ගණන, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ ගිගාවොට් පැය 2,263 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ගිගාවොට් පැය 2,315 ක් දක්වා සියයට 2.3 කින් වැඩි විය.

ජල විදුලිය හරහා විදුලිය උද්පාදනය 2024 පළමු භාගයේ දී පැවති ගිගාවොට් පැය 2,503 ට සාපේක්ෂව, 2025 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ගිගාවොට් පැය 2,975 ක් දක්වා සියයට 18.9 කින් මධ්‍යස්ථව ඉහළ ගොස් ඇත. සුළං බලයෙන් විදුලිය නිපදවීම ද 2024 පළමු භාගයේ දී පැවති ගිගාවොට් පැය 154 ට සාපේක්ෂව, 2025 වසරේ සමාන කාල පරිච්ඡේද තුළ දී ගිගාවොට් පැය 166 ක් දක්වා සියයට 8.0 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, 2025 පළමු භාගයේ දී ඉන්ධන තෙල්වලින් විදුලිය ජනනය සියයට 28.8 කින් සැළකිය යුතු ලෙස පහළ වැටුනු අතර, ගල් අඟුරු මත පදනම් වූ නිෂ්පාදන සියයට 8.9 කින් මධ්‍යස්ථව පහත වැටුනි. පෞද්ගලික අංශයේ විදුලි උත්පාදනය 2024 පළමු භාගයේ දී පැවති ගිගාවොට් පැය 1,814 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ගිගාවොට් පැය 2,233 ක් දක්වා සියයට 23.1 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ.

**3.4 රූපසටහන : කර්මාන්ත අංශයේ සංයුතිය - 2025 පළමු භාගය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**3.5 රූපසටහන : නිෂ්පාදන අංශයේ සංයුතිය - 2025 පළමු භාගය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

### සේවා අංශය

ද.දේ.නි.යෙන් සියයට 55.2 ක් සඳහා දායකත්වය දක්වන සේවා අංශය, 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 2.3 ක සුළු වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 3.3 කින් සුළු වශයෙන් වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් (සියයට 12.7), තොරතුරු තාක්ෂණ වැඩසහන් සම්පාදනය පිළිබඳ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් (සියයට 12.5), සහ මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා (සියයට 13.4) යන උප අංශවල සිදුවූ කැපී පෙනෙන ප්‍රසාරණයයි.

මීට අමතරව, 2025 වසරේ පළමු භාගය තුළ දී, තොග හා සිල්ලර වෙළෙඳාම (සියයට 1.5), මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම (සියයට 3.2), තැපැල් හා කුරියර් සේවාවන් (සියයට 8.2), ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු (සියයට 1.4), විදුලි සංදේශ සේවාවන් (සියයට 3.0), රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල් (සියයට 13.8), නිවාස අයිතිය හා දේපල වෙළෙඳාම (සියයට 3.2), වෘත්තීයමය සේවාවන් (සියයට 2.7), අධ්‍යාපනය (සියයට 0.8), සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් (සියයට 2.3), සහ වෙනත් පෞද්ගලික සේවාවන් (සියයට 0.9) යන උප අංශ ද ප්‍රසාරණය විය. කෙසේ නමුත්, රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂාව යන උප අංශය, 2025 වසරේ පළමු භාගය තුළ දී සියයට 2.5 කින් සංකෝචනය විය.

**3.6 රූපසටහන : සේවා අංශයේ සංයුතිය - 2025 පළමු භාගය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## 3.2 වගුව : සේවා අංශයේ තෝරාගත් දර්ශකයන්

| දර්ශකය | 2021 | 2022 | 2023 | 2024 (අ) | 2024 (අ) | 2025 (අ) |
|---|---|---|---|---|---|---|
| **වරාය සේවා** | | | | | **ජන. - අගෝ.** | **ජන. - අගෝ.** |
| පැමිණි නැව් සංඛ්‍යාව | 4,180 | 4,073 | 4,809 | 4,562 | 2,987 | 3,335 |
| මෙහෙයවන ලද මුළු භාණ්ඩ (මෙ.ටො. 000) | 109,356 | 100,376 | 103,794 | 120,203 | 80,713 | 82,370 |
| මෙහෙයවන ලද මුළු බහළුම් (TEU 000) | 7,249 | 6,862 | 6,950 | 7,792 | 5,141 | 5,435 |
| ප්‍රති නැව්ගත කිරීම (TEU 000) (ආ) | 6,050 | 5,832 | 5,754 | 6,623 | 4,386 | 4,577 |
| **විදුලි සංදේශ අංශය** | | | | | **ජුනි අවසානයට** | **ජුනි අවසානයට** |
| ස්ථාවර දුරකථන (සංඛ්‍යාව '000) | 2,852 | 2,651 | 2,308 | 2,122 | 2,155 | 2,142 |
| ජංගම දුරකථන (සංඛ්‍යාව '000) | 29,959 | 28,838 | 28,986 | 28,820 | 29,005 | 29,027 |
| රැහැන් රහිත දුරකථන (සංඛ්‍යාව '000) | 1,587 | 1,388 | 1,163 | 1,046 | 1,063 | 1,074 |
| අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් (සංඛ්‍යාව '000) | 22,106 | 21,668 | 22,864 | 23,149 | 23,349 | 23,686 |
| **සෞඛ්‍ය අංශය** | | | | | | |
| පෞද්ගලික රෝහල් | 243 | 250 | ලැ.නො | ලැ.නො | ලැ.නො | ලැ.නො. |
| රජයේ රෝහල් | 618 | 617 | ලැ.නො | ලැ.නො | ලැ.නො | ලැ.නො. |
| ඇඳන් සංඛ්‍යාව (රජයේ) | 78,228 | 78,228 | ලැ.නො | ලැ.නො | ලැ.නො | ලැ.නො. |
| වෛද්‍යවරුන් සංඛ්‍යාව (රජයේ) | 20,209 | 21,045 | ලැ.නො | ලැ.නො | ලැ.නො | ලැ.නො. |
| හෙදියන් සංඛ්‍යාව | 39,091 | 40,775 | ලැ.නො | ලැ.නො | ලැ.නො | ලැ.නො. |
| **මූල්‍ය අංශය** | | | | | **ජුනි අවසානයට** | **ජුනි අවසානයට** |
| බැංකු ශාඛා හා අනෙකුත් සේවා මධ්‍යස්ථානය | 7,369 | 7,378 | 7,522 | 7,613 | 7,602 | 7,489 |
| ණය කාඩ්පත් (ක්‍රියාකාරී) | 2,054,985 | 2,054,896 | 1,987,857 | 1,990,271 | 1,926,931 | 2,093,738 |
| | | | | | **අගෝ. අවසානයට** | **අගෝ. අවසානයට** |
| ලියාපදිංචි මූල්‍ය සමාගම් (ඉ) | 39 | 37 | 33 | 32 | 33 | 32 |
| ලියාපදිංචි කල්බදු සමාගම් | 3 | 1 | 1 | 1 | **1** | **1** |
| **සංචාරක අංශය** | | | | | **ජන. - අගෝ.** | **ජන. - අගෝ.** |
| පැමිණි සංචාරක සංඛ්‍යාව | 194,495 | 719,978 | 1,487,303 | 2,053,465 | 1,362,668 | 1,566,523 |
| සංචාරක ඉපැයීම් (ඇ.ඩො. මිලියන) | 507 | 1,136 | 2,068 | 3,169 | 2,167 | 2,290 |
| හෝටල් කාමර නැවතුම් අනුපාතය | 18.6 | 30.4 | 39.0 | ලැ.නො | ලැ.නො | ලැ.නො. |
| **ප්‍රවාහන සේවා (අලුතින් ලියාපදංචි කිරීම)** | | | | | **ජන. - අගෝ.** | **ජන. - අගෝ.** |
| බස් රථ | 281 | 404 | 685 | 146 | 111 | 853 |
| මෝටර් කාර් | 3,495 | 1,489 | 1,816 | 1,644 | 964 | 26,894 |
| භාණ්ඩ ප්‍රවහනය රථ (ඇ) | 2,593 | 940 | 523 | 1,284 | 790 | 1,700 |
| යතුරුපැදි | 8,011 | 9,060 | 20,200 | 65,289 | 35,336 | 127,745 |
| ත්‍රිරෝද රථ | 2,093 | 36 | 60 | 94 | 50 | 5,967 |
| ට්‍රැක්ටර් සහ ට්‍රේලර්ස් (ඈ) | 12,616 | 5,285 | 4,020 | 5,070 | 3,190 | 5,176 |
| වෙනත් (ඊ) | | | 586 | 883 | 642 | 3,246 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව, මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය*

*(අ) තාවකාලික*

*(ආ) නැවත (ඇසිරීම්) ඇතුලත් වේ.*

*(ඇ) විශේෂ කාර්ය වාහන,මෝටර් ලොරි සහ ලොරි අනෙකුත් ඇතුළත් වේ.*

*(ඈ) ගොඩබිම් වාහන සහ ලොරි ට්‍රේලර්ස් ඇතුළත් වේ.*

*(ඉ) ETI මූල්‍ය සමාගම ඇතුළත් නොවේ.*

*(ඊ) ද්විත්ව කාර්ය වාහන, ක්වඩ්‍රිසයිකල් සහ මෝටර් නිවාස ඇතුළත් වේ*

## ප්‍රවාහන හා වරාය සේවා

ප්‍රවාහන අංශය, 2025 වසරේ පළමු භාගය තුළ දී සියයට 3.2 කින් ප්‍රසාරණය විය. 2024 වසරේ පළමු භාගය තුළ දී 26,345 ක් වූ නව වාහන ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ලියාපදිංචි කිරීම් 96,056 ක් දක්වා සියයට 264.6 කින් අතිවිශාල ලෙස වර්ධනය විය.

2025 වසරේ පළමු භාගය තුළ දී ත්‍රීරෝද රථ ලියාපදිංචිය සියයට 7,460.5 කින් ද, මෝටර් රථ ලියාපදිංචිය සියයට 2,110.1 කින් ද, බස් රථ ලියාපදිංචිය සියයට 381.6 කින් ද, ද්විත්ව කාර්යය රථ ලියාපදිංචිය සියයට 301.4 කින් ද, යතුරුපැදි ලියාපදිංචිය සියයට 226.1 කින් ද, භාණ්ඩ ප්‍රවාහන රථ ලියාපදිංචිය සියයට 96.8 කින් ද, ගොඩබිම් වාහන ලියාපදිංචිය සියයට 56.7 කින් ද ඉහළ ගොස් තිබේ.

2024 වසරේ පළමු භාගය තුළ දී මෙහෙයවන ලද මුළු බහාලුම් සංඛ්‍යාව වන අඩි 20 බහාලුම් ඒකක (TEUs) මිලියන 3.8 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී එම සංඛ්‍යාව අඩි 20 බහාලුම් ඒකක මිලියන 3.9 ක් දක්වා සියයට 2.1 කින් වැඩි විය. 2025 වසරේ පළමු භාගය තුළ දී මෙහෙයවන ලද දේශීය බහාලුම් සංඛ්‍යාව සියයට 16.2 කින් සහ නැවත ගබඩා කිරීම සඳහා මෙහෙයවන ලද බහාලුම් සංඛ්‍යාව සියයට 4.6 කින් ඉහළ ගොස් ඇති අතර, ප්‍රතිනැව්ගත කිරීම් සඳහා මෙහෙයවන ලද බහාලුම් සංඛ්‍යාව සියයට 0.4 කින් පහත වැටී ඇත.

සමස්ත නැව් බඩු මෙහෙයුම් සංඛ්‍යාව 2024 වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් මිලියන 59.5 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී මෙට්‍රික් ටොන් මිලියන 60.8 ක් දක්වා සියයට 2.1 කින් ඉහළ ගොස් ඇත. ගොඩබාන ලද නැව් බඩු ප්‍රමාණය, 2024 වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් මිලියන 32.7 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී මෙට්‍රික් ටොන් මිලියන 33.7 ක් දක්වා සියයට 3.0 කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම පටවන ලද භාණ්ඩ ප්‍රමාණය ද, 2024 වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් මිලියන 26.7 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී මෙට්‍රික් ටොන් මිලියන 27.0 ක් දක්වා සියයට 1.0 කින් ඉහළ ගොස් ඇත.

## විදුලි සංදේශ

විදුලි සංදේශ යන උප අංශය 2025 වසරේ පළමු භාගය තුළ දී සියයට 3.0 ක වර්ධනයක් වාර්තා කරන ලදී. සෙලියුලර් දුරකථන ඇතුළු දුරකථන ඝනත්වය, 2024 වසරේ ජූනි මස අවසානයේ දී වාර්තා වූ පුද්ගලයන් 100 කට 143.2 ට සාපේක්ෂව 2025 වසරේ ජූනි මස අවසානයේ දී පුද්ගලයන් 100 කට 141.8 ක් දක්වා සියයට 1.0 කින් ආන්තික ලෙස අඩු වී ඇත. ජංගම අන්තර්ජාල සම්බන්ධතා ඇතුළු අන්තර්ජාල ග්‍රාහකයන් සංඛ්‍යාව, 2024 වසරේ ජූනි මස අවසානයේ දී වාර්තා වූ මිලියන 23.3 ට සාපේක්ෂව 2025 වසරේ ජූනි මස අවසානයේ දී මිලියන 23.7 ක් දක්වා සියයට 1.4 කින් වැඩි විය. 2024 වසරේ ජූනි මස අවසානයේ දී වාර්තා වූ අගයන්ට සාපේක්ෂව 2025 වසරේ ජූනි මස අවසානයේ දී, ස්ථාවර දුරකථන සංඛ්‍යාව සියයට 0.6 කින් ආන්තික ලෙස අඩු වී ඇති අතර, සෙලියුලර් දුරකථන සංඛ්‍යාව සියයට 0.1 කින් ආන්තික ලෙස වැඩි වී ඇත.

## සේවා වියුක්තිය

සේවා වියුක්ති අනුපාතය, 2024 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 4.5 ට සාපේක්ෂව 2025 වසරේ පළමු කාර්තුවේ දී සියයට 3.8 ක් දක්වා අඩු විය. 2025 වසරේ පළමු කාර්තුවේ දී කාන්තාවන් සහ පිරිමින් අතර සේවා වියුක්ති අනුපාතය පිළිවෙලින් සියයට 6.3 ක් සහ සියයට 2.5 ක් ලෙස වාර්තා විය. මේ අතර, 2025 වසරේ පළමු කාර්තුවේ දී තරුණ වයස් කාණ්ඩයේ (වයස අවුරුදු 15-24) සේවා වියුක්ති අනුපාතය සියයට 19.7 ක් වූ අතර, එය සියලුම වයස් කාණ්ඩ අතුරින් වාර්තා වූ ඉහළම සේවා වියුක්ති අනුපාතය සනිටුහන් කරයි. සියලුම වයස් කාණ්ඩවල කාන්තාවන් අතර සේවා වියුක්තිය පිරිමින්ට වඩා වැඩිය.

මේ අතර, ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය 2024 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 47.1 ට සාපේක්ෂව 2025 වසරේ පළමු කාර්තුවේ දී සියයට 49.7 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය. 2025 වසරේ පළමු කාර්තුවේ දී කාන්තාවන් සහ පිරිමින් අතර ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය පිළිවෙලින් සියයට 32.0 ක් සහ සියයට 70.1 ක් විය.

**3.3 වගුව : සංචාරක අංශයේ කාර්යසාධනය**

| මාසය | සංචාරකයින්ගේ පැමිණීම | | | | | සංචාරක ඉපයීම් (ඇ.ඩො. මිලියන) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2021 | 2022 | 2023 | 2024(ආ) | 2025(අ) | 2021 | 2022 | 2023 | 2024(ආ) | 2025(අ) |
| ජනවාරි | 1,682 | 82,327 | 102,545 | 208,253 | 252,761 | 4.4 | 151.7 | 153.5 | 341.8 | 400.7 |
| පෙබරවාරි | 3,366 | 96,507 | 107,639 | 218,350 | 240,217 | 8.8 | 169.4 | 161.6 | 345.7 | 367.6 |
| මාර්තු | 4,581 | 106,500 | 125,495 | 209,181 | 229,298 | 11.9 | 161.2 | 188.8 | 338.4 | 354.0 |
| අප්‍රේල් | 4,168 | 62,980 | 105,498 | 148,867 | 174,608 | 10.9 | 108.7 | 148.2 | 225.7 | 256.7 |
| මැයි | 1,497 | 30,207 | 83,309 | 112,128 | 132,919 | 3.9 | 43.5 | 100.0 | 154.0 | 164.1 |
| ජූනි | 1,614 | 32,856 | 100,388 | 113,470 | 138,241 | 4.2 | 45.0 | 122.9 | 151.1 | 169.5 |
| ජූලි | 2,429 | 47,293 | 143,039 | 187,810 | 200,244 | 6.3 | 85.0 | 219.0 | 328.3 | 318.5 |
| අගෝස්තු | 5,040 | 37,760 | 136,405 | 164,609 | 198,235 | 13.1 | 67.9 | 210.5 | 282.1 | 258.9 |
| සැප්තැම්බර් | 13,547 | 29,802 | 111,938 | 122,140 | | 35.3 | 40.5 | 152.2 | 181.0 | |
| ඔක්තෝබර් | 22,771 | 42,026 | 109,199 | 135,907 | | 59.3 | 54.9 | 136.7 | 185.6 | |
| නොවැම්බර් | 44,294 | 59,759 | 151,496 | 184,158 | | 115.4 | 81.0 | 205.3 | 272.9 | |
| දෙසැම්බර් | 89,506 | 91,961 | 210,352 | 248,592 | | 233.3 | 127.4 | 269.3 | 362.1 | |
| **එකතුව** | **194,495** | **719,978** | **1,487,303** | **2,053,465** | **1,566,523** | **506.8** | **1,136.3** | **2,068.0** | **3,168.6** | **2,290.0** |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය*

*(අ) තාවකාලික*

*(ආ) සංශෝධිත*

**3.7 රූපසටහන : ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය සහ සේවා වියුක්තිය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## 3.3 මුදල් අංශයේ වර්ධනයන්

2025 වසරේ ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 2024 වසරේ නොවැම්බර් මාසයේ සිට පැවති අගයේම, එනම් සියයට 8.00 ක් ලෙසම පවත්වා ගෙන යැමට තීරණය කරන ලදී. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, 2025 වසරේ මැයි මාසයේ දී පදනම් අංක 25 කින් අඩු කර සියයට 7.75 දක්වා පහත හෙළමින් මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කරන ලදී. ඒ අනුව, අනුපාතික පදනම් අංක ± 50 ක ආන්තිකයක් සහිතව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ සම්බන්ධ කර ඇති නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතය පිළිවෙලින් සියයට 7.25 සහ සියයට 8.25 දක්වා අඩු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, කෙටිකාලීන අනුපාත, බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර පොලී අනුපාතිකය වැනි ණය පොලී අනුපාත සහ අනෙකුත් ප්‍රධාන වෙළෙඳපොළ තැන්පතු සහ ණය පොලී අනුපාත ඇතුළුව බොහෝ වෙළෙඳපොළ පොලී අනුපාත පහත වැටුණි. 2025 වසරේ ජනවාරි මස සිට ජූලි මස දක්වා කාලසීමාව තුළ දී, ප්‍රාථමික වෙන්දේසිවල සියලුම කල්පිරීම්වලට අදාළ භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික, පදනම් අංක 90-100 අතර අගයකින් පහළ ගිය අතර, ප්‍රාථමික සහ ද්විතියීක වෙළෙඳපොළ යන දෙකෙහිම දිගුකාලීන කල්පිරීම්වලට අදාළ ඵලදා අනුපාතික පහත වැටුණි. කෙසේ නමුත්, 2025 වසරේ ජූනි මස මැද භාගයේ සිට ඵලදා අනුපාතිකයන්හි සුළු ඉහළ යාමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණි. 2025 වසර තුළ මේ දක්වා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය සියයට 2.00 ක් ලෙස නොවෙනස්ව පැවතුන අතර, එම නිසා ද්‍රවශීලතාවයට සෘජු බලපෑමක් ඇති නොවූ බැවින්, මුදල් තත්ත්වයන් සඳහා ප්‍රධාන වශයෙන් බලපෑම් ඇති කරන ලද්දේ ප්‍රතිපත්ති අනුපාත වෙනස්වීම් සහ වෙළෙඳපොළ මූලික ක්‍රියාමාර්ගයි.

**3.4 වගුව : ද.දේ.නි. වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%)**

| අංශය | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) | පළමු භාගය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2024(අ) | 2025(ආ) |
| **කෘෂිකර්මාන්තය** | **-0.9** | **1.0** | **-4.1** | **1.6** | **1.2** | **1.8** | **0.6** |
| තේ වගාව | -6.5 | 9.8 | -15.7 | -1.5 | 1.7 | -6.4 | 5.9 |
| වී වගාව | 7.7 | -11.8 | -11.8 | 17.1 | 3.1 | 5.5 | 2.4 |
| රබර් වගාව | 0.2 | 9.9 | -9.8 | -7.7 | 2.2 | -3.6 | -17.1 |
| ධාන්‍ය වගාව | 59.8 | 2.8 | -24.8 | 2.5 | 10.9 | 17.1 | 5.5 |
| එළවළු වගාව | 8.9 | -1.7 | -5.5 | 2.9 | 2.8 | -0.1 | -0.8 |
| සත්ව නිෂ්පාදන | -3.7 | 8.2 | -11.4 | 0.3 | 14.1 | 9.2 | 16.3 |
| වන වගාව, දැව හා වනාන්තර | -1.3 | 4.1 | 14.8 | -7.3 | -2.1 | -0.8 | 6.8 |
| ආශ්‍රිත නිෂ්පාදන | -17.0 | 1.5 | -10.5 | 3.0 | 1.9 | 5.6 | 5.1 |
| **කර්මාන්ත** | **-5.3** | **5.7** | **-16.0** | **-9.2** | **11.0** | **10.5** | **7.9** |
| පතල් හා කැණීම් | -10.9 | 1.4 | -31.0 | -22.3 | 19.4 | 14.2 | 14.5 |
| නිෂ්පාදන ක්‍රියාකාරකම් | -2.6 | -46.2 | -12.2 | -3.2 | 7.6 | 8.8 | 7.0 |
| අනෙකුත්කර්මාන්ත | -1.3 | 2.2 | -4.3 | -3.0 | 5.9 | 11.6 | 4.8 |
| ඉදිකිරීම් | -9.4 | 4.4 | -20.9 | -20.8 | 19.4 | 13.7 | 9.6 |
| **සේවා** | **-1.9** | **3.4** | **-2.6** | **-0.2** | **2.4** | **2.3** | **3.3** |
| තොග හා සිල්ලර වෙළඳාම | 0.9 | 1.5 | 0.0 | 0.1 | 1.3 | 1.1 | 1.5 |
| ප්‍රවාහනය හා ගබඩා කිරීම | -6.1 | 0.9 | 3.0 | 4.3 | 2.9 | 3.3 | 3.2 |
| නවාතැන් හා ආහාර සැපයීමේ ක්‍රියාකාරකම් | -40.8 | 1.7 | 27.0 | 26.0 | 31.4 | 34.4 | 12.7 |
| තොරතුරු හා සන්නිවේදන | 15.0 | 11.0 | 6.5 | -2.2 | 4.2 | 4.0 | 3.0 |
| මූල්‍ය හා රක්ෂණ ක්‍රියාකාරකම් | 9.2 | 7.0 | -11.1 | -10.3 | -1.2 | -1.7 | 13.5 |
| නිශ්චල දේපල ක්‍රියාකාරකම් | -1.0 | 4.4 | -12.1 | -6.0 | 4.2 | 4.4 | 3.2 |
| වෘත්තීමය සේවා | -3.3 | 4.9 | -17.7 | 2.4 | 3.5 | 3.9 | 2.7 |
| අධ්‍යාපන, සෞඛ්‍ය හා සාමාජයීය ක්‍රියාකාරකම් | 2.5 | 3.7 | -2.0 | 0.7 | 1.0 | 0.8 | 1.4 |
| රාජ්‍ය පරිපාලන හා ආරක්ෂාව | 1.7 | 0.9 | 1.2 | -1.7 | -2.9 | -3.7 | -2.5 |
| අනෙකුත් සේවා (ස්වයං සේවා හැර) | -6.6 | 0.9 | 0.3 | 0.3 | 1.5 | 1.1 | 0.9 |
| **ද.දේ.නි.** | **-4.6** | **4.2** | **-7.3** | **-2.3** | **5.0** | **4.6** | **4.8** |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*
*(ආ) සංශෝධිත*

මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම සහ ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු වීමත් සමඟ, පුළුල් මුදල් සැපයුම (M2b) 2025 වසරේ ජනවාරි මස අවසානයේ දී වාර්තා වූ රු. බිලියන 14,439.1 ක සිට 2025 වසරේ ජුනි මස අවසානය වන විට රු. බිලියන 15,175.8 ක් දක්වා ඉහළ ගිය අතර, පෞද්ගලික අංශයේ ණය සැලකිය යුතු ලෙස ඉහළ යාම සහ ශුද්ධ විදේශීය වත්කම් ප්‍රසාරණය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. පෞද්ගලික අංශය වෙත ලැබුණු ණය ප්‍රවාහය, 2025 වසරේ ජනවාරි මස අවසානයේ දී වාර්තා වූ රු. බිලියන 8,149.8 ක සිට 2025 වසරේ ජුනි මස අවසානය වන විට රු. බිලියන 8,854.6 ක් දක්වා ඉහළ ගියේය. විදේශ අංශයේ කාර්යසාධනය වැඩිදියුණුවීම පිළිබිඹු කරමින්, ශුද්ධ විදේශීය වත්කම්, 2025 වසරේ ජනවාරි මස අවසානයේ දී වාර්තා වූ රු. බිලියන 747.4 ක සිට 2025 වසරේ ජුනි මස අවසානය වන විට රු. බිලියන 889.6 ක් දක්වා ඉහළ ගියේය.

**3.8 රූපසටහන : පොළී අනුපාතය, මුදල් සමස්තයන් මුදල් සැපයුම සහ පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය**




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

## උද්ධමනය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද. 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2025 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට -4.0 සිට 2025 වසරේ ඔක්තෝබර් මාසයේ දී සියයට 2.1 දක්වා ඉහළ යන ලදී. 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී (සියයට -0.5) සෘණ කලාපයට ඇතුළුවීමෙන් පසුව, 2025 වසරේ පෙබරවාරි මාසයේ දී උද්ධමනය එහි වාර්තා වූ අවම අගය වන සියයට -4.2 ට ළඟා වූ අතර, 2025 වසරේ අගෝස්තු මාසයේ දී සියයට 1.2 ක උද්ධමන අනුපාතයක් වාර්තා කරමින් නැවත ධන කලාපයට ඇතුළු විය. විශේෂයෙන්ම විදුලි ගාස්තු, ඉන්ධන සහ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් ගෑස් මිල කිහිපවතාවක්ම පහත දැමීම, දේශීය සැපයුම් දාමයන් වැඩිදියුණු කිරීම, සහ ගෝලීය සැපයුම් දාමයන් යථා තත්ත්වයට පත්වීම වැනි සැපයුම් අංශයේ සාධක මෙම අවධමනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ නමුත්, ප්‍රධාන වශයෙන්ම සංඛ්‍යානමය පදනමේ බලපෑම හේතුවෙන්, 2025 වසරේ මාර්තු මාසයේ සිට මෙම අවධමන ප්‍රවණතාවය ලිහිල් වීම ආරම්භ විය. මීට අමතරව, 2025 වසරේ ජූනි මාසයේ දී විදුලි ගාස්තු ඉහළ නැංවීම ද අවධමන ප්‍රවණතාවය ලිහිල් වීම සඳහා දායකත්වය සැපයූ අතර, එමඟින්, මෙම අවධමන කාලපරිච්ඡේදය සැපයුම් අංශයේ සාධක මත පදනම් වූ බව ඉස්මතු කෙරේ.

මේ අතර, නිතර මිල උච්ඡාවචනය වන අයිතම වන ආහාර, බලශක්තිය සහ ප්‍රවාහනය වැනි කාණ්ඩ බැහැර කිරීම මඟින් ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරනු ලබන මූලික උද්ධමනය සැලකූ විට, කො.පා.මි.ද. (2021=100) යෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මූලික උද්ධමනය, 2025 වසරේ පළමු මාස නමය පුරාම ධන අගයන් වාර්තා කරන ලදී. එය 2025 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 1.2 සිට 2025 වසරේ ඔක්තෝබර් මාසයේ දී සියයට 2.2 දක්වා වැඩි විය. මූලික උද්ධමනය මෙලෙස සාපේක්ෂව ස්ථාවරව පැවතීම මඟින් අවධමනය ඉල්ලුම මත පදනම් නොවූ බව පෙන්වාදෙන අතර, මූලික උද්ධමනයේ දක්නට ලැබෙන ප්‍රවණතාවය මඟින් බලශක්ති මිල සංශෝධනවල දෙවන අදියර බලපෑම් පිළිබිඹු වේ.

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී (සියයට -0.2) සෘණ කලාපයට ඇතුළුවීමෙන් පසුව, 2025 වසරේ ජනවාරි මාසයේ දී එහි වාර්තා වූ අවම අගය වන සියයට -4.0 වාර්තා කරන ලදී. 2025 වසරේ මැයි මාසයේ දී සියයට 0.6 ක අගයක් වාර්තා කරමින් එය නැවත ධන කලාපයට ඇතුළු වූ අතර, 2025 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 2.1 දක්වා ක්‍රමයෙන් ඉහළ යන ලදී. ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනයේ වූ මෙම දිශානති වෙනස්වීම කො.පා.මි.ද.යෙහි දිශානති වෙනස්වීමට පෙර සිදුවීම, පාරිභෝගික භාණ්ඩ පැසෙහි සංයුතියේ ඇති වෙනස්කම් පිළිබිඹු කරයි. කො.පා.මි.ද.යෙහි භාණ්ඩ පැස තුළ ආහාර නොවන අයිතම වැඩි කොටසක් ඇති අතර, ජා.පා.මි.ද.යෙහි භාණ්ඩ පැස තුළ ආහාර මත සාපේක්ෂව වැඩි බරක් පැටවේ. එලෙසම, ජා.පා.මි.ද. (2021=100) යෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මූලික උද්ධමනය, 2025 වසරේ ජනවාරි මාසයේ දී සියයට -0.2 ක අගයක් වාර්තා කරමින් සෘණ කලාපයට ඇතුළු වූ අතර, 2025 වසරේ මැයි මාසයේ දී සියයට 0.3 ක් වාර්තා කරමින් නැවත ධන කලාපයට ඇතුළු වී, ඉන්පසු 2025 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 1.9 දක්වා ක්‍රමයෙන් වැඩි විය.

මාස කිහිපයක් පුරා ශ්‍රී ලංකාව අත්දුටු අවධමනය මඟින්, පෙර ඇති වූ උද්ධමන කම්පනවලින් යථා තත්ත්වයට පත්වෙමින් සිටි පවුල් ඒකක සහ ව්‍යාපාර සඳහා යම් තාවකාලික සහනයක් ලැබුණු අතර, කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට

උද්ධමනය නැවත ධන කලාපයට පැමිණීම මඟින්, වියදම් කිරීම් සහ ආයෝජන ප්‍රමාද කිරීම සඳහා හේතුවිය හැකි අවධමනය පිළිබඳ අපේක්ෂාවන් තවදුරටත් ඇති වීමේ අවදානම අඩු කරයි. 2025 වසරේ අගෝස්තු මාසයේ දී සිදු වූ මෙම දිශානති වෙනස්වීම මඟින් ආර්ථිකය මේ වන විට සැපයුම් අංශයේ කම්පන අන්තර්ග්‍රහණය කරගෙන ඇති බව පිළිබිඹු වේ. බලශක්ති සහ ප්‍රවාහන මිල ගණන් ස්ථායී වීම සහ පවත්නා සහනශීලී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හේතුවෙන් ඉල්ලුම් තත්ත්වයන් ක්‍රමයෙන් වැඩිදියුණු වීමත් සමඟ, 2025 වසරේ ඉදිරි කාලය පුරාවට උද්ධමනය ධන කලාපයේම පවතිනු ඇතැයි ද, ක්‍රමයෙන් සියයට 5 ක ඉලක්කයට ළඟා වනු ඇතැයි ද, ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

**3.9 රූපසටහන : මතුපිට මූලික සහ ආහාර උද්ධමනයේ විචලතා**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*
*( 2023 ජනවාරි පදනම් වර්ෂය 2013=100 සහ 2023 පෙබරවාරි සිට පදනම් වර්ෂය 2021=100)*

**3.5 වගුව : පාරිභෝගික මිල උද්ධමනය (පාදක වර්ෂය 2021=100)**

| මාසය | 2024 (පදනම් වර්ෂය 2021=100) | | | | 2025 (පදනම් වර්ෂය 2021=100) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මතුපිට උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය | | මූලික උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය | | මතුපිට උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය | | මූලික උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය | |
| | කො.පා. මි.ද. | ජා.පා. මි.ද. | කො.පා. මි.ද. | ජා.පා.මි.ද. | කො.පා. මි.ද. | ජා.පා. මි.ද. | කො.පා. මි.ද. | ජා.පා. මි.ද. |
| ජනවාරි | 6.4 | 6.5 | 2.2 | 2.2 | -4.0 | -4.0 | 1.2 | -0.2 |
| පෙබරවාරි | 5.9 | 5.1 | 2.8 | 2.7 | -4.2 | -3.9 | 0.7 | -0.6 |
| මාර්තු | 0.9 | 2.5 | 3.1 | 3.4 | -2.6 | -1.9 | 0.7 | -0.6 |
| අප්‍රේල් | 1.5 | 2.7 | 3.4 | 3.0 | -2.0 | -0.8 | 0.8 | -0.1 |
| මැයි | 0.9 | 1.6 | 3.5 | 3.1 | -0.7 | 0.6 | 1.2 | 0.3 |
| ජුනි | 1.7 | 2.4 | 4.4 | 3.9 | -0.6 | 0.3 | 1.5 | 0.6 |
| ජූලි | 2.4 | 2.5 | 4.4 | 3.0 | -0.3 | 0.7 | 1.6 | 0.9 |
| අගෝස්තු | 0.5 | 1.1 | 3.6 | 2.3 | 1.2 | 1.5 | 2.0 | 1.5 |
| සැප්තැම්බර් | -0.5 | -0.2 | 3.3 | 1.9 | - | - | - | - |
| ඔක්තෝබර් | -0.8 | -0.7 | 3.0 | 1.7 | - | - | - | - |
| නොවැම්බර් | -2.1 | -1.7 | 2.7 | 1.5 | - | - | - | - |
| දෙසැම්බර් | -1.7 | -2.0 | 2.7 | 1.3 | - | - | - | - |

*මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

### 3.4 කොටස් වෙළෙඳපොළ

2025 වසරේ පළමු මාස අට තුළ දී ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. සියලුම ලැයිස්තුගත සමාගම්වල කොටස් මිල ගණන් වල වෙනස්වීම පිළිබිඹු කරන සමස්ත කොටස් මිල දර්ශකය (1985=100), 2024 වසරේ අගෝස්තු මස අවසානයේ දී වාර්තා කළ ඒකක 10,869 ට සාපේක්ෂව 2025 වසරේ අගෝස්තු මස අවසානයේ දී ඒකක 20,997 ක් දක්වා සියයට 93.2 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇති ප්‍රමුඛතම පොදු සමාගම් 20 ක ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරන ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 (2004=1,000) දර්ශකය ද, 2024 වසරේ අගෝස්තු මස අග දී වාර්තා වූ ඒකක 3,059 සිට 2025 වසරේ අගෝස්තු මස අවසානයේ දී ඒකක 6,077 ක් දක්වා සියයට 98.7 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.

ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම සහ ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීම අරමුණු කරගත් රජය විසින් හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ, ශක්තිමත් ආයතනික ක්‍රියාකාරිත්වය, ධනාත්මක ආර්ථික දැක්ම සහ ලිහිල් මුදල් තත්ත්වයන් හේතුවෙන් දේශීය ආයෝජකයින්ගේ සහභාගීත්වය වැඩිවීම මෙම ඉහළ යාමේ ප්‍රවණතාවයට ප්‍රධාන වශයෙන් හේතු විය.

කොළඹ කොටස් වෙළඳපොලේ සියලුම ලැයිස්තුගත සමාගම්වල මුළු වටිනාකම නියෝජනය කරන වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2024 වසරේ අගෝස්තු මස අග දී වාර්තා වූ රු.බිලියන 4,321 ට සාපේක්ෂව 2025 වසරේ අගෝස්තු මස අග දී රු.බිලියන 7,425 ක් දක්වා සියයට 71.8 කින් වර්ධනය විය. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයේ මෙම වර්ධනය, ලැයිස්තුගත සමාගම්වල වටිනාකම ඉහළ යාම සහ ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොළ කෙරෙහි ආයෝජකයින්ගේ ඇති ආකර්ෂණය ඉහළ යාම පිළිබිඹු කරයි. තවද, කොළඹ කොටස් වෙළෙඳපොළ දෛනික පිරිවැටුම, 2024 වසරේ අගෝස්තු මස අවසානයේ දී වාර්තා වූ රු.මිලියන 1,524 ට සාපේක්ෂව, 2025 වසරේ අගෝස්තු මස අවසානයේ දී රු.මිලියන 4,841 ක් දක්වා සියයට 217.7 කින් කැපීපෙනෙන ලෙස වර්ධනය විය. මෙමඟින් කොටස් වෙළෙඳපොළෙහි වෙළෙඳ ක්‍රියාකාරකම්වල සුවිශේෂී ඉහළ යාමක්, වෙළෙඳපොළ ද්‍රවශීලතාවයේ සැලකිය යුතු ප්‍රසාරණයක් සහ ආයෝජකයින්ගේ විශ්වාසය හා සහභාගීත්වයේ වැඩිදියුණු වීමක් පිළිබිඹු වේ.

**3.6 වගුව : ප්‍රාග්ධන වෙළඳපොළ වෙනස්වීම්**

| දර්ශකය | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | අගෝස්තු අවසානයට 2024 | අගෝස්තු අවසානයට 2025(අ) |
|---|---|---|---|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) | 6,129 | 6,774 | 12,226 | 8,490 | 10,654 | 15,945 | 10,869 | 20,997 |
| එස් ඇන්ඩ් පී එස් එල් 20 දර්ශකය | 2,937 | 2,638 | 4,233 | 2,636 | 3,068 | 4,862 | 3,059 | 6,077 |
| වෙළඳපොළ ප්‍රාග්ධණීකරණය (රු.බිලි.) | 2,851 | 2,961 | 5,489 | 3,847 | 4,249 | 5,696 | 4,321 | 7,425 |
| ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව | 289 | 283 | 296 | 290 | 290 | 284 | 286 | 286 |
| වාර්ෂික සාමාන්‍ය පිරිවැටුම (රු.බිලි.) | 171 | 397 | 1173 | 687 | 410 | 538 | 242 | 755 |
| විදේශ විකුණුම් (රු.මිලි.) | 68,272 | 104,165 | 86,689 | 36,863 | 37,088 | 52,441 | 41,736 | 58,816 |
| විදේශ ගැනුම් (රු.මිලි.) | 56,537 | 52,889 | 39,410 | 67,488 | 41,451 | 42,524 | 35,926 | 36,527 |
| ශුද්ධ ගැනුම් (රු.මිලි.) | -11,735 | -51,276 | -47,279 | 30,625 | 4,363 | -9,918 | -5,809 | -22,289 |

*මූලාශ්‍ර : කොළඹ කොටස් වෙළඳපොළ හා ශ්‍රී ලංකා මහ බැංකුව*

*(අ) තාවකාලික*

### 3.5 විදේශ අංශයේ වර්ධනයන්

ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2025 වසරේ පළමු මාස අට තුළ අපනයනවලින් ලද ඉපැයීම් වැඩිවීම සහ සේවක ප්‍රේෂණවලින් ලද ඉහළ ලැබීම් හා සංචාරක අංශයෙන් ලද ඉහළ ඉපැයීම් හේතුවෙන් ධනාත්මක කාර්යසාධනයක් පෙන්නුම් කළේය. අපනයන ආදායම ඇ. ඩො. මිලියන 9,076.6 ක් දක්වා සියයට 6.7 කින් වැඩි වීමේ සහ ආනයන වියදම ඇ. ඩො. මිලියන 13,340.9 ක් දක්වා සියයට 10.5 කින් වැඩි වීමේ ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ හිඟය 2024 වසරේ පළමු මාස අට තුළ වූ ඇ. ඩො. මිලියන 3,566.2 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 4,264.2 දක්වා පුළුල් විය. සංචාරක පැමිණීම් වැඩිවීම හේතුවෙන් සංචාරක ඉපැයීම් 2024 වසරේ පළමු මාස අට වූ තුළ වූ ඇ. ඩො. මිලියන 2,167.0 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 2,290.0 ක් දක්වා සියයට 5.7 කින් වැඩි විය. මේ අතර, සේවක ප්‍රේෂණ 2024 වසරේ පළමු මාස අට තුළ වූ ඇ. ඩො. මිලියන 4,288.2 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 5,116.0 ක් දක්වා සියයට 19.3 කින් වැඩි විය.

සමස්ත ගෙවුම් ශේෂය 2024 වසරේ පළමු භාගයේ දී වූ ඇ.ඩො. මිලියන 1,761.1 ක අතිරික්තයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 522.5 ක අතිරික්තයක් වාර්තා කරන ලදී. කොළඹ කොටස් වෙළෙඳපොළෙහි 2024 වසරේ පළමු මාස අට තුළ වූ ඇ.ඩො. මිලියන 43.6 ක ශුද්ධ ලැබීම්වලට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 69.1 ක ශුද්ධ ගලා යාමක් වාර්තා කළේය. රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි 2024 වසරේ පළමු මාස අට තුළ වූ ඇ.ඩො. මිලියන 251.4 ක ශුද්ධ ගලායාමට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 140.2 ක ශුද්ධ ලැබීමක් වාර්තා විය. චීන මහජන බැංකුවේ විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළුව 2025 වසරේ අගෝස්තු මස අවසන් වන විට දළ නිල සංචිත ඇ. ඩො. බිලියන 6.2 ක් විය. මේ අතර, 2025 වසරේ අගෝස්තු මස අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 3.3 කින් අතිප්‍රමාණය විය.

### අපනයන

ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමත් සමඟ ප්‍රධාන වශයෙන් කාර්මික හා කෘෂිකාර්මික අපනයනවලින් ලද ඉපැයීම් ඉහළ යාම හේතුවෙන් අපනයන ඉපැයීම් 2024 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 8,506.3 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 9,076.6 දක්වා සියයට 6.7 කින් ඉහළ ගියේ ය. කාර්මික අපනයන ඉපැයීම් මුළු අපනයන ආදායමට සියයට 77.3 ක දායකත්වයක් ලබා දී ඇති අතර කෘෂිකාර්මික හා ඛනිජ අපනයන සමස්ත අපනයන ආදායමෙන් පිළිවෙළින් සියයට 22.4 ක් සහ සියයට 0.2 ක් විය.

ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟලුම් සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන අපනයන ආදායම වැඩිවීම හේතුවෙන් කාර්මික අපනයන ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ දී ලද ඇ.ඩො. මිලියන 6,665.8 ක සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 7,015.4 ක් දක්වා සියයට 5.2 කින් වැඩි විය. රෙදිපිළි සහ ඇඟලුම් අපනයන ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ දී ලද ඇ.ඩො. මිලියන 3,364.8 ක සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 3,595.3 දක්වා සියයට 6.9 කින් වැඩි විය. 2025 වසරේ පළමු මාස අට තුළ ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන අපනයන ආදායම ඇ. ඩො. මිලියන 577.3 ක් දක්වා සියයට 35.0 කින් ඉහළ ගිය අතර, ඛනිජ තෙල් නිෂ්පාදන අපනයන ආදායම ඇ. ඩො. මිලියන 654.7 ක් දක්වා සියයට 7.8 කින් ද, රබර් නිෂ්පාදන අපනයන ආදායම ඇ. ඩො. මිලියන 618.6 ක් දක්වා සියයට 6.7 කින් ද අඩු විය.

**3.10 රූපසටහන : වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස් වීම**




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

**3.11** රූපසටහන **: අපනයන සංයුතිය**




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

තේ, පොල්, කුළුබඩු, සුළු කෘෂිකාර්මික නිෂ්පාදන, එළවළු, රබර් සහ සකස් නොකළ දුම්කොළ වලින් ලද ආදායම ඉහළ යාමත් සමඟ කෘෂිකාර්මික අපනයන ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 1,804.0 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 2,030.2 දක්වා සියයට 12.5 කින් ඉහළ ගියේ ය. තේ අපනයන ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ වූ ඇ. ඩො. මිලියන 942.3 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 1,026.0 දක්වා සියයට 8.9 කින් වැඩි විය. මීට අමතරව, 2025 වසරේ පළමු මාස අට තුළ පොල් අපනයන ආදායම ඇ. ඩො. මිලියන 367.5 ක් දක්වා සියයට 35.0 කින් ද, කුළුබඩු අපනයන ආදායම ඇ. ඩො. මිලියන 282.6 ක් දක්වා සියයට 4.8 කින් ද, සුළු කෘෂිකාර්මික නිෂ්පාදන අපනයන ආදායම ඇ. ඩො. මිලියන 132.8 ක් දක්වා සියයට 26.5 කින් ද වැඩි වී ඇති අතර, මුහුදු ආහාර අපනයන ආදායම ඇ. ඩො. මිලියන 161.9 ක් දක්වා සියයට 1.6 කින් අඩු විය. මේ අතර, ඛනිජ අපනයන ආදායම 2024 වසරේ පළමු මාස අට තුළ වූ ඇ. ඩො. මිලියන 18.8 ක සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 14.3 ක් දක්වා සියයට 23.8 කින් අඩු වී තිබේ.

### ආනයන

ආර්ථික ක්‍රියාකාරකම්හි පුනර්ජීවනය, භාණ්ඩ ආනයනය කිරීමේ සීමාවන් ඉවත් කිරීම සහ ගෝලීය වෙළෙඳපොළවල භාණ්ඩ මිල ඉහළ යාමේ

බලපෑමත් සමඟ පාරිභෝගික සහ ආයෝජන භාණ්ඩ සඳහා ආනයන වියදම් ඉහළ යාම හේතුවෙන්, ආනයන වියදම 2024 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ.ඩො. මිලියන 12,072.5 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 13,340.9 දක්වා සියයට 10.5 කින් වැඩි විය. පාරිභෝගික, අතරමැදි සහ ආයෝජන භාණ්ඩ මත ආනයන වියදම් මුළු ආනයන වියදමෙන් පිළිවෙළින් සියයට 24.7 ක්, සියයට 55.7 ක් සහ සියයට 19.5 ක් විය.

පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2024 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ.ඩො. මිලියන 2,176.3 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 3,294.7 දක්වා සියයට 51.4 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, ආහාර පාන සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩයන්හි ආනයන වියදම් වැඩි වීම මෙයට හේතු විය. ප්‍රධාන වශයෙන් කිරි ආශ්‍රිත නිෂ්පාදන සහ තෙල් හා මේද වර්ග නිෂ්පාදන වලින් වාර්තා වූ ආනයන වියදම් වැඩි වීමත් සමඟ ආහාර පාන ආනයන වියදම 2024 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ.ඩො. මිලියන 1,214.1 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,419.6 දක්වා සියයට 16.9 කින් වැඩි විය. ප්‍රධාන වශයෙන් පෞද්ගලික රථවාහන, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, රෙදිපිළි හා උපාංග, විදුලි සංදේශ උපකරණ සහ ගෘහ හා දැව භාණ්ඩ සඳහා වන ආනයන වියදම් වැඩිවීම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඇ. ඩො. මිලියන 962.2 සිට ඇ. ඩො. මිලියන 1,875.0 දක්වා සියයට 94.9 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

ප්‍රධාන වශයෙන් ඉන්ධන සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග සඳහා වූ වියදම පහත වැටීම හේතුවෙන්, අතරමැදි භාණ්ඩ සඳහා වන ආනයන වියදම 2024 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ.ඩො. මිලියන 7,750.0 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 7,437.4 දක්වා සියයට 4.0 කින් අඩු විය. පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන වියදම ඇ. ඩො. මිලියන 1,846.2 ක් දක්වා සියයට 14.4 කින් ද, බොරතෙල් ඇ. ඩො. මිලියන 539.3 ක් දක්වා සියයට 5.4 කින් ද, ගල් අඟුරු ඇ. ඩො. මිලියන 135.2 ක් දක්වා සියයට 20.7 කින් ද අඩු වීමෙන් ඉන්ධන ආනයන වියදම 2025 වසරේ පළමු මාස අට තුළ ඇ. ඩො. මිලියන 2,520.6 දක්වා සියයට 13.0 කින් අඩු විය. රෙදිපිළි සහ රෙදිපිළි උපාංග ආනයන වියදම 2024 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ.ඩො. මිලියන 1,839.3 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,793.5 දක්වා සියයට 2.5 කින් අඩු විය. ආයෝජන භාණ්ඩ සඳහා වන ආනයන වියදම 2024 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ.ඩො. මිලියන 2,140.3 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,597.2 දක්වා සියයට 21.3 කින් වැඩි විය. ආර්ථිකයේ පුනර්ජීවනයත් සමඟ ආයෝජන කටයුතු වර්ධනය වීම හේතුවෙන් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සඳහා වන ආනයන වියදම ඇ. ඩො. මිලියන 1,658.4 ක් දක්වා සියයට 15.3 කින් ද, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඇ. ඩො. මිලියන 649.6 ක් දක්වා සියයට 7.9 කින් ද, ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඇ. ඩො. මිලියන 286.7 ක් දක්වා සියයට 192.4 කින් ද ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

### සංචාරක ඉපැයීම් සහ සේවක ප්‍රේෂණ

සංචාරක ඉපැයීම් 2024 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ.ඩො. මිලියන 2,167.0 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,290.0 දක්වා සියයට 5.7 කින් වර්ධනය විය. තෝරාගත් රටවල් සඳහා වීසා ගාස්තු නිදහස් කිරීම්, ඉලක්කගත ජාත්‍යන්තර අලෙවිකරණ ප්‍රවර්ධන වැඩසටහන් සහ ගුවන් ගමන් සම්බන්ධතා වර්ධනය කිරීම වැනි රජයේ මූලික ක්‍රියාමාර්ග හේතුවෙන් සංචාරක අංශය ශක්තිමත් ලෙස සහ විවිධාංගීකරණයකින් යුක්තව සිදු වූ පුනරුදය මෙම වර්ධනයට සහාය විය. ඒ අනුව, සංචාරක පැමිණීම් 2024 වසරේ පළමු මාස අට තුළ දී වූ පුද්ගලයින් 1,362,668 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පුද්ගලයින් 1,566,523 ක් දක්වා සියයට 15.0 කින් වර්ධනය විය. ඉන්දියාව, එක්සත් රාජධානිය, රුසියාව, ජර්මනිය, චීනය, ප්‍රංශය සහ ඕස්ට්‍රේලියාව යන රටවලින් වැඩිම සංචාරක පැමිණීම් වාර්තා විය. මේ අතර, විධිමත් සේවක ප්‍රේෂණ මාර්ග ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය පියවරයන් හේතුවෙන් විධිමත් මාර්ග හරහා සේවක ප්‍රේෂණ ලැබීමෙන් සේවක ප්‍රේෂණ 2024 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ.ඩො. මිලියන 4,288.2 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 5,116.0 දක්වා සියයට 19.3 කින් වර්ධනය විය.

**3.12** රූපසටහන : ආනයන සංයුතිය




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

**3.7 වගුව : විදේශීය වෙළඳාම**

*ඇ. ඩො. මිලි.*

| අයිතමය | 2022 | 2023 | 2024(අ) | ජන. - අගෝ. 2024(ආ) | ජන. - අගෝ. 2025(අ) |
|---|---|---|---|---|---|
| **අපනයන** | **13,106** | **11,911** | **12,772** | **8,506** | **9,077** |
| **කෘෂිකාර්මික අපනයන** | **2,568** | **2,567** | **2,775** | **1,539** | **2,030** |
| තේ | 1,259 | 1,310 | 1,436 | 818 | 1,026 |
| අනෙකුත් කෘෂිකාර්මික අපනයන | 1,309 | 1,257 | 1,339 | 722 | 1,004 |
| **කාර්මික අපනයන** | **10,465** | **9,278** | **9,947** | **5,805** | **7,015** |
| රෙදිපිළි හා ඇඟළුම් | 5,952 | 4,879 | 5,061 | 2,920 | 3,595 |
| ආහාරපාන සහ දුම්කොළ | 520 | 539 | 652 | 376 | 577 |
| රබර් නිෂ්පාදන | 977 | 902 | 976 | 588 | 619 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 581 | 598 | 486 | 293 | 313 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 568 | 539 | 1,064 | 616 | 655 |
| අනෙකුත් කාර්මික අපනයන | 1,868 | 1,820 | 1,710 | 1,012 | 1,256 |
| **ඛනිජමය අපනයන** | **50** | **39** | **25** | **16** | **14** |
| **වර්ගීකරණය නොකළ අපනයන** | **23** | **28** | **26** | **16** | **17** |
| **ආනයන** | **18,291** | **16,811** | **18,841** | **12,073** | **13,341** |
| **පාරිභෝගික භාණ්ඩ** | **2,813** | **3,044** | **3,466** | **2,176** | **3,295** |
| ආහාර සහ පාන | 1,608 | 1,693 | 1,914 | 1,214 | 1,420 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 1,205 | 1,351 | 1,551 | 962 | 1,875 |
| **අතරමැදි භාණ්ඩ** | **12,439** | **11,007** | **11,915** | **7,750** | **7,437** |
| ඛනිජතෙල් | 4,897 | 4,703 | 4,354 | 2,897 | 2,521 |
| රෙදිපිළි හා ඇඟළුම් | 3,065 | 2,371 | 2,847 | 1,839 | 1,794 |
| තිරිඟු සහ බඩ ඉරිඟු | 303 | 338 | 383 | 205 | 205 |
| අනෙකුත් | 4,174 | 3,595 | 4,331 | 2,810 | 2,918 |
| **ආයෝජන භාණ්ඩ** | **3,030** | **2,745** | **3,448** | **2,140** | **2,597** |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 1,969 | 1,868 | 2,363 | 1,439 | 1,658 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 926 | 775 | 927 | 602 | 650 |
| ප්‍රවාහන උපකරණ | 132 | 99 | 57 | 98 | 287 |
| අනෙකුත් | 3 | 3 | 3 | 2 | 3 |
| **වර්ගීකරණය නොකළ ආනයන** | **9** | **28** | **13** | **6** | **12** |
| **වෙළඳ හිඟය** | **-5,185** | **-4,900** | **-6,069** | **-3,566** | **-4,264** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

*(අ) තාවකාලික*

*(ආ) සංශෝධිත*

## 3.6 ගෝලීය ආර්ථිකයේ ඉදිරි දැක්ම

කොවිඩ්-19 වසංගතය, යුක්රේන-රුසියන් ගැටුම, ප්‍රතිපත්ති අවිනිශ්චිතා සහ ජීවන වියදම් අර්බුදය හේතුවෙන් ඇතිවූ ව්‍යසනයන්ට පසුව ගෝලීය ආර්ථිකය ස්ථායී වෙමින් පැවතුනත්, අභියෝග තවදුරටත් පැවතීමෙන් ඉදිරිය අභියෝගාත්මක වනු ඇත. වෙළෙඳ ආතතිය, කාලගුණික වෙනස්වීම් සහ ප්‍රතිපත්තිමය අවිනිශ්චිතා ඉහළ යාමත් සමඟ බොහෝ රටවල ආර්ථිකයන් හැකිලීමට හේතු විය. කෙසේවෙතත්, පුද්ගලික අංශය ඉක්මනින් ප්‍රතිචාර දැක්වීම සහ ගෝලීය විවෘත වෙළෙඳාම නිසා, මෙම අහිතකර බලපෑම අවම වී ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ප්‍රකාශිත ඔක්තෝබර් මස ගෝලීය ආර්ථික ඉදිරි දැක්මට අනුව ගෝලීය මූර්ත ද.දේ.නි. 2025 සහ 2026 වර්ෂවල දී පිළිවෙලින් 3.2, 3.1 දක්වා ස්ථායී වනු ඇති අපේක්ෂා කරනු ලබයි. ගෝලීය උද්ධමනය රටවල් අතර සැලකිය යුතු වෙනස්කමක් දක්වමින් 2025 වසරේ දී සියයට 4.2 ක් සහ 2026 වසරේ දී සියයට 3.7 ක් ද ලෙස ඇස්තමේන්තු කර ඇත.

වෙළෙඳ ප්‍රතිපත්ති අවිනිශ්චිතා ඉහළ යාම මධ්‍යයේ වෙළෙඳපොළ විචල්‍යතා සහ අවදානම් පිළිබඳ

ආකල්පයන් අඩු වීමෙන්, ගෝලීය මූල්‍ය තත්වය පෙර වසරට සාපේක්ෂව 2025 වසරේ දී සාමාන්‍යයෙන් ඉහළ ගොස් ඇත. තවද කෘතිම බුද්ධි කොටස් මිල ඉහළ යාමෙන් බොහෝ ප්‍රාග්ධන වෙළෙඳපොළවල් ලාභ ලැබීය. එක්සත් ජනපදය විසින් බදු ප්‍රකාශ කළ පසුව, නැගී එන වෙළඳපොළවල් සහ සංවර්ධිත ආර්ථිකයන් හි මූල්‍ය තත්ත්වයන් දැඩි වී ඇති අතර, ඒ සමඟම කොටස්, බැඳුම්කර සහ අනෙකුත් මූල්‍ය වත්කම් වෙතින් මුදල් ගලායෑම් සිදුවී ඇත. රජයේ ණය ප්‍රමාණයන් (sovereign spread) වැඩිවුවත්, එය කළමනාකරණය කළ හැකි මට්ටමක පැවතුන අතර, බොහෝ රටවල මුදල් ඒකක ඇමරිකානු එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව අධිප්‍රමාණය විය. ගෝලීය අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ උද්ධමනය, ප්‍රාග්ධන ප්‍රවාහ අවදානම සහ ඉහළ ණය බර සමතුලිත කිරීම සඳහා නැගී එන වෙළෙඳපොළවල් සහ සංවර්ධිත ආර්ථිකයන්හි මූල්‍ය ප්‍රතිපත්තිය සුපරික්ෂාකාරිව පවත්වාගෙන යන ලදී.

### ගෝලීය වෙළෙඳාම සහ භාණ්ඩ වෙළෙඳපොළ

එක්සත් ජනපදය විශාල පරාසයක රටවලට බදු පැනවීම් නිසා, දියුණු, නැගී එන වෙළඳපොළවල් සහ සංවර්ධිත ආර්ථිකයන් හා අඩු ආදායම් ලබන ආර්ථිකයන් වෙත දැඩි වෙළෙඳ කම්පනයන් ඇති විය. මෙම තීරුබදු, රුසියානු - යුක්‍රේන යුද්ධය ද සමඟින් ගෝලීය සැපයුම් දාමයට බාධාකාරී තත්වයන් එල්ල කර ඇති අතර වෙළෙඳ ප්‍රවාහයන්ට දැඩි පීඩනයක් එල්ල කර ඇත.

2025 ආරම්භයේ දී ආර්ථික වර්ධනය මන්දගාමී වීම, වෙළඳ සම්බාධක සහ ප්‍රතිපත්ති අවිනිශ්චිතාවය හේතුවෙන් භාණ්ඩ මිල අගයන් පහළ යන ලදී. ඉන්ධන මිල 2025 සහ 2026 වසරවල දී පිළිවෙළින් සියයට 7.9 කින් සහ සියයට 3.7 කින් පහළ යාම අපේක්ෂිත අතර 2025 මාර්තු සිට අගෝස්තු දක්වා ලෝහ මිල රන් ඇතුළුව සියයට 12.8 කින් ඉහළ ගොස් ඇත.

### කලාපීය සංවර්ධනය

මූලික වශයෙන් වෙළෙඳ සම්බාධක සමඟ ප්‍රතිපත්ති අවිනිශ්චිතතා, මූල්‍ය වෙළෙඳපොළ අවිනිශ්චිතතා සහ ආයෝජකයන්ගේ විශ්වාසය අවම වීම, දියුණු ආර්ථිකයන් හි 2025 වසර සඳහා වූ අපේක්ෂිත ආර්ථික වර්ධනය 1.6 දක්වා පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. වර්ධනව වූ ආනයන ඉල්ලුම, දුර්වල වූ පරිභෝජනය සහ දුර්වල වෙමින් පවතින ශ්‍රමික වෙළෙඳපොළ හේතුවෙන් එක්සත් ජනපද ආර්ථිකය 2025 වසරේ දී සියයට 2.0 කට සීග්‍රයෙන් අඩු වනු ඇතැයි අපේක්ෂා කරයි. ප්‍රධාන වශයෙන් බදු, ප්‍රතිපත්ති අවිනිශ්චිතතා, දුර්වල විදේශීය වෙළඳාම හා ආයෝජන ඉල්ලුමේ අඩු වීම, යුරෝපීය කලාපයේ වර්ධනය 2025 වසරේ දී සියයට 1.2 ක් සහ 2026 වසරේ දී සියයට 1.1 ක් ලෙස අපේක්ෂා කෙරේ. නැගී එන වෙළඳපොළවල් සහ සංවර්ධිත ආර්ථිකයන් හි වර්ධනය 2025 වසරේ දී සියයට 4.2 ක් ද, 2026 වසරේ දී සියයට 4.0 ක් ද වනු ඇතැයි අපේක්ෂිතය. පුළුල් ලෙස ව්‍යාප්ත වූ ආර්ථික වර්ධනය, නැගී එන වෙළඳපොළවල් සහ සංවර්ධිත ආර්ථිකයන්හි සියයට 60 කට පමණ බලපා ඇති අතර, මෙය වෙළෙඳ හා මූල්‍ය අවිනිශ්චිතතා, අධික ණය ප්‍රමාණයන්, අභ්‍යන්තර හා විදේශ කම්පනයන් අවශෝෂණය කර ගැනීමට ඇති සීමිත හැකියාව පිළිඹිබු කරයි. කෙසේවුවද, බදු පැනවීම මගින් ඇතිවන අහිතකර බලපෑම් පවතින නමුත්, 2025 වසරේ දී රාජ්‍ය මූල්‍ය ප්‍රසාරණය වීම හේතුවෙන් ඉහළ ගිය අන්තර්ජාතික වෙළෙඳාමේ ලාභ සහ නොවෙනස්ව පැවති දේශීය පරිභෝජනය නිසා ආර්ථික වර්ධනය අපේක්ෂිත ප්‍රමාණයට වඩා ඉහළ ගොස් ඇත. අඩු ආදායම් ලබන රටවල් සඳහා ආර්ථික වර්ධනය 2025 දී සියයට 4.4 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කරන අතර 2026-2027 දී එය සියයට 5.0 දක්වා ඉහළ යාමක් අපේක්ෂා කරන නමුත් දීර්ඝ කාලීනව පවතින වෙළෙඳ ගැටුම්, අධික ණය ප්‍රමාණයන් සහ ප්‍රතිපත්ති අවිනිශ්චිතතා නිසා මෙම වර්ධනය වඩාත් අවිනිශ්චිතය.

### ගෝලීය ආර්ථික අවදානම්

ඉහළ වෙළඳ ප්‍රතිපත්ති අවිනිශ්චිතතාවය, ගෝලීය වෙළෙඳාම සහ ආයෝජන ආර්ථික වර්ධනයට විශාල තර්ජනයක්ව පැවතිමත් සමඟම ඉදිරි ආර්ථික දැක්ම තුළ තවදුරටත් ආර්ථිකය අපේක්ෂිත මට්ටමට වඩා පහළ යාමට ඇති අවදානම ප්‍රබලව පවතී. වෙළෙඳ කම්පන, මූල්‍ය වෙළෙඳපොළෙහි ද්‍රවශීලත්වය අඩු වීම, සහ අවදානමට ලක්විය හැකි වෙළඳපොළවල් සහ සංවර්ධිත ආර්ථිකයන්හි ප්‍රාග්ධන ගලායාම් නිසා විශේෂයෙන්ම අපනයන කේන්ද්‍රගත අංශයන් හි ඉල්ලුම, ආයෝජන සහ රැකියා අවස්ථා අඩුවීම සිදුවිය හැක. භූගෝලීය ගැටුම් සහ දරුණු කාලගුණික තත්වයන් ආර්ථිකය අපේක්ෂිත මට්ටමට වඩා පහළ යාමට හේතු වනු ඇත. එමෙන්ම, වෙළඳ සාකච්ඡා මගින් බදු අනුපාත අඩු කිරීම, තාක්ෂණය මූලික කරගත් ආයෝජන වැඩිවීම, සහ අමතර රාජ්‍ය මූල්‍ය සහාය ලබා ගැනීමෙන්, ගෝලීය වර්ධනය ශක්තිමත් විය හැකි නමුත් මෙවැනි පියවර වලින් උද්ධමනය සහ රාජ්‍ය මූල්‍ය අවදානම් වර්ධනය විය හැක.

**3.8 වගුව : තෝරාගත් රටවල ප්‍රධාන ආර්ථික දර්ශක - 2025 (පුරෝකතනය)**

| රට | ද. දේ. නි. වර්ධනය (වාර්ෂික %) | උද්ධමනය % | සේවා වියුක්තිය % | මූල්‍ය හිඟය (ද. දේ. නි.% ලෙස) | දළ ණය (ද. දේ.නි. % ලෙස) |
|---|---|---|---|---|---|
| ආජන්ටිනාව | 4.5 | 41.3 | 7.5 | 0.4 | 78.8 |
| ඕස්ට්‍රේලියාව | 1.8 | 2.6 | 4.2 | -2.7 | 51.0 |
| බ්‍රසීලය | 2.4 | 5.2 | 7.1 | -8.4 | 91.4 |
| කැනඩාව | 1.2 | 2.0 | 6.9 | -2.2 | 113.9 |
| චිලී | 2.5 | 4.3 | 8.6 | -2.1 | 42.7 |
| චීනය | 4.8 | 0.0 | 5.1 | -8.6 | 96.3 |
| ප්‍රංශය | 0.7 | 1.1 | 7.6 | -5.4 | 116.5 |
| ජර්මනිය | 0.2 | 2.1 | 3.7 | -2.5 | 64.4 |
| ග්‍රීසිය | 2.0 | 3.1 | 9.0 | 0.0 | 146.7 |
| ඉන්දියාව | 6.6 | 2.8 | 4.9 | -7.1 | 81.4 |
| ඉන්දුනීසියාව | 4.9 | 1.8 | 5.0 | -2.8 | 40.8 |
| ඉතාලිය | 0.5 | 1.7 | 6.7 | -3.3 | 136.8 |
| ජපානය | 1.1 | 3.3 | 2.6 | -1.3 | 229.6 |
| කොරියාව | 0.9 | 2.0 | 3.0 | -1.5 | 53.4 |
| මැලේසියාව | 4.5 | 1.6 | 3.0 | -3.6 | 70.4 |
| මෙක්සිකෝව | 1.0 | 3.9 | 2.9 | -4.3 | 58.9 |
| රුසියාව | 0.6 | 9.0 | 2.4 | -2.7 | 23.1 |
| සිංගප්පූරුව | 2.2 | 0.9 | 2.1 | 3.1 | 175.6 |
| දකුණු අප්‍රිකාව | 1.1 | 3.4 | 32.7 | -6.0 | 77.3 |
| ස්පාඤ්ඤය | 2.9 | 2.4 | 10.8 | -2.7 | 100.4 |
| තායිලන්තය | 2.0 | 0.2 | 1.0 | -2.6 | 64.9 |
| එක්සත් රාජධානිය | 1.3 | 3.4 | 4.7 | -4.3 | 103.4 |
| ඇමරිකා එක්සත් ජනපදය | 2.0 | 2.7 | 4.2 | -7.4 | 125.0 |
| වියට්නාමය | 6.5 | 3.4 | 2.3 | -3.3 | 32.0 |

*මූලාශ්‍රය : ලෝක ආර්ථික දර්ශකය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2025 ඔක්තෝබර්, Fiscal Monitor, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2025 ඔක්තෝබර් , මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව*

**ගෝලීය ඉදිරි දැක්ම ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති බලපෑම**

වර්තමානයේ ගෝලීය අවදානම් තත්වයන් පැවතිය ද ශ්‍රී ලංකාවට දළ දේශීය නිෂ්පාදිතයේ සියයට 5.0 ක පමණ වර්ධනයක් ළඟා කර ගැනීමට හැකි විය. මීට පෙර සියයට 44.0 ක් සහ සියයට 30.0 ක් ලෙස පැවති ඇමෙරිකානු එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකා අපනයන මත පනවනු ලැබූ බදු සියයට 20 දක්වා අඩු කරන ලදී. නමුත් එසේ අඩු කරන ලද බදු අනුපාතය ඉහළ අගයක පැවතීම නිසා ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රධාන වෙළෙඳපළක් වන ඇඟළුම් වැනි ක්ෂේත්‍ර වලට බලපෑමක් ඇති කරනු ඇත. මෙය අපනයන ආදායම අඩු වීමට, රැකියා අහිමි වීමට සහ ද.දේ.නි.යේ වර්ධනය පහළ යාමට හේතු වනු ඇත.

ශ්‍රී ලංකාව ස්වෛරී ණය ශ්‍රේණිගතකිරීම් වල ණය ගෙවීමට නොහැකි තත්වයේ (RD) සිට CCC + දක්වා ඉහළ යාමත් සමඟ ශ්‍රී ලංකාවට ගෝලීය වෙළෙඳපොළට පිවිසිය හැකි වූ අතර මෙය විදේශ ණය ගැනීම පහසු කිරීම, ආයෝජක විශ්වාසය වැඩි කිරීම, ආර්ථික ස්ථායිතාවය නැවත ඇති වීමට හේතු වනු ඇත. ශ්‍රී ලංකාව 2025 වසරේ ජූලි දක්වා අවධමනයක් වාර්තා කලද, වෙළෙඳ ප්‍රතිපත්ති අවිනිශ්චිතතා, මූල්‍ය වෙළෙඳපොල විචලතා, භූගෝලීය ගැටුම් වැනි අභියෝග වලට මුහුණ දෙමින් සිටින නිසා ඉදිරියේ දී ඉහළ උද්ධමනයක් ඇති විය හැක.

# රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය

# 04

## 4.1 සමාලෝචනය

ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 විසින් 2025 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 307.1 ක සමස්ත ලාභයක් වාර්තා කර ඇති අතර, එයින් රාජ්‍ය ව්‍යවසායයන් අටක් රු. බිලියන 294.3 ක ලාභයක් රාජ්‍ය ව්‍යවසාය අංශයට දායක කර ඇත. 2025 වසරේ පළමු මාස අට තුළ බැංකු අංශයේ කාර්යසාධනය සැලකිය යුතු ලෙස වැඩි දියුණු වී ඇති අතර, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව විශාලතම රාජ්‍ය බැංකු තුන වන ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ලාභය රු. බිලියන 69.8 කින් රු. බිලියන 147.1 ක් දක්වා ඉහළ යාම මගින් ඒ බව පෙන්නුම් කෙරේ.

යෝජිත රාජ්‍ය වාණිජ ව්‍යාපාර කළමනාකරණ පනත, රජයට අයත් වාණිජමය නොවන ආයතන සමාලෝචනය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවේ නිර්දේශයන්ට අනුව රජයට අයත් වාණිජමය නොවන ආයතන කිහිපයක් ඈවර කිරීම, ප්‍රතිව්‍යුහගත කිරීම හෝ ඒකාබද්ධ කිරීම සහ ක්‍රියාකාරී මට්ටමේ නොමැති රාජ්‍ය ව්‍යවසායයන් 33 ක් ඈවර කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතුළුව රාජ්‍ය ව්‍යවසාය අංශය දැනට ප්‍රතිසංස්කරණ කිහිපයකට භාජනය වෙමින් පවතී. ඒ අතර, යෝජිත රාජ්‍ය වාණිජ ව්‍යාපාර කළමනාකරණ පනත මගින් සියලුම රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් වෘත්තීයමය වශයෙන්, ස්වාධීනව, ඵලදායී ලෙස සහ වාණිජ මූලධර්මවලට අනුකූලව කළමනාකරණය කිරීමට අපේක්ෂා කරන අතරම, ඉහළම ප්‍රමිතීන්ට යටත්ව, පාලනය, වගවීම සහ පරීක්ෂාවට යටත් වේ. තවද, 2025 වසරේ අයවැය යෝජනාවකට අනුව, නාගරික සහ තදාසන්න මගීන්ගේ සංචලන අවශ්‍යතා සඳහා මෙට්‍රෝ බස් සේවාවක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, "ලංකා මෙට්‍රෝ ට්‍රාන්සිට් (පුද්ගලික) සමාගම" නමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් පරිපාලිත සමාගමක් සංස්ථාපනය කරන ලදී.

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද රාජ්‍ය බැංකු ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියට අනුව පත් කරන වෘත්තිකයන්ගෙන් සමන්විත කමිටුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ සුදුසු බව සහ නිසි බව සඳහා අනුමැතියට යටත්ව, ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා සියලුම රාජ්‍ය බැංකු සඳහා ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කර ඇත. මේ අතර, 2025 වසරේ අගෝස්තු මාසයේදී, 2025 අංක 14 දරණ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත බලාත්මක කිරීමත් සමඟ, ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම් හතරක් සංස්ථාපනය කරන ලදී. මෙම ප්‍රතිසංස්කරණ මගින් විදුලිබල ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් 2024 වසරේ පළමු මාස අට තුළ අයබදු සහ ලාභාංශ එකතු කිරීම රු. බිලියන 26.7 ක් වූ අතර, එය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 14.6 ක් දක්වා අඩු වී ඇත.

## 4.2 රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය

### ලංකා බැංකුව

2024 වසර අවසානය වන විට රු. බිලියන 4,985 ක් වූ ලංකා බැංකුවේ වත්කම් පදනම 2025 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 5,433 ක් දක්වා සියයට 9 කින් ඉහළ ගොස් ඇත. 2024 වසර අවසානය වන විට රු. බිලියන 4,208 ක් වූ ලංකා බැංකුවේ තැන්පතු පදනම 2025 වසරේ අගෝස්තු අවසානය වන විට රු. බිලියන 4,535 ක් දක්වා සියයට 7.7 කින් ඉහළ ගොස් ඇත. 2024 වසර අවසානය වන විට රු. බිලියන 2,178 ක් වූ ණය සහ අත්තිකාරම් 2025 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 2,311 ක් දක්වා සියයට 6.1 කින් ආන්තික වශයෙන් ඉහළ ගොස් ඇත. 2024 වසර අවසානය හා සැසඳීමේදී සියයට 7.20 ක් වූ අදියර III ණය අනුපාතය, 2025 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 7.58 ක් දක්වා සුළු වශයෙන් පිරිහීමට ලක් වී ඇත. 2025 වසරේ මුල් මාස අට තුළ ලංකා බැංකුව රු. බිලියන 78.7 ක බදු පෙර ලාභයක් වාර්තා කළ අතර, එය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රු. බිලියන 31.3 හා සසඳන විට සැලකිය යුතු වැඩිවීමකි. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ශුද්ධ පොලී ආදායමේ ඉහළ යාමයි.

### මහජන බැංකුව

2024 වසර අවසානය වන විට රු. බිලියන 3,298 ක් වූ මහජන බැංකුවේ වත්කම් පදනම 2025 අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 3,598 ක් දක්වා සියයට 9 කින් ඉහළ ගොස් ඇත. 2024 වසර අවසානයේ රු. බිලියන 2,855 ක් වූ බැංකුවේ තැන්පතු පදනම, 2025 අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 3,173 ක් දක්වා සියයට 11.1 කින් වැඩි වී ඇත. 2024 වසර අවසානයේ රු. බිලියන 1,522 ක් වූ ණය හා අත්තිකාරම්, 2025 අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 1,610 ක් දක්වා ආන්තික වශයෙන් වර්ධනය වී ඇත. 2024 වසර අවසානය වන විට සියයට 10.3 ක් වූ බැංකුවේ අදියර III ණය අනුපාතය, 2025 අගෝස්තු මස අවසානය වන විට සියයට 9.3 ක් දක්වා වැඩි දියුණු වී ඇත. 2024 වසරේ පළමු මාස අට තුළ වාර්තා කරන ලද රු. බිලියන 24.2 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ මහජන බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 37.8 ක් දක්වා

සියයට 56.2 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කර ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ශුද්ධ පොලී ආදායම ඉහළ යාමයි.

### ජාතික ඉතිරිකිරීමේ බැංකුව

2024 වසර අවසානය වන විට රු. බිලියන 1,752 ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් පදනම 2025 අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 1,821 ක් දක්වා ආන්තික වර්ධනයක් වාර්තා කර ඇත. 2024 වසර අවසානයේ රු. බිලියන 1,556 ක් වූ බැංකුවේ තැන්පතු පදනම, 2025 අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 1,586 ක් දක්වා සියයට 1.9 කින් වර්ධනය වී ඇත. 2024 වසර අවසානය වන විට පැවති රු. බිලියන 532 ක් වූ ණය සහ අත්තිකාරම් ශේෂය 2025 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 519 ක් දක්වා සියයට 2.4 කින් පහළ ගොස් ඇත. 2024 වසර අවසානය වන විට සියයට 5.18 ක් වූ අදියර III ණය අනුපාතයට සාපේක්ෂව 2025 අගෝස්තු මස අවසානය වන විට එය සියයට 2.82 ක් දක්වා වැඩි දියුණු වී ඇත. 2024 වසරේ පළමු මාස අට තුළ වාර්තා කළ රු. බිලියන 21.7 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 30.5 ක් දක්වා වර්ධනයක් වාර්තා කර ඇති අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ශුද්ධ පොලී ආදායමේ සැලකිය යුතු වැඩිවීමයි.

### සී/ ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

සී/ ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2024 වසරේ පළමු මාස අට තුළ ලැබූ රු. බිලියන 3 ක සමස්ත ආදායමට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 5 ක සමස්ත ආදායමක් වාර්තා කළ අතර, 2024 වසරේ රු. බිලියන 0.4 ක් වූ ලාභාංශ ආදායම රු. බිලියන 2.7 ක් දක්වා වැඩිවීම එයට ප්‍රධාන වශයෙන් හේතු විය. සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2025 වසරේ පළමු මාස අට තුළ බදු පෙර ලාභය ලෙස රු. බිලියන 4.4 ක් වාර්තා කර ඇති අතර, එය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 1.8 ට සාපේක්ෂව සැලකිය යුතු වැඩිවීමකි. ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් පිළිබිඹු කරමින් 2025 වසරේ අගෝස්තු අවසානය වන විට මුළු වත්කම් 2024 වසර අවසානයේ වූ රු. බිලියන 115.2 ට සාපේක්ෂව රු. බිලියන 125.1 ක් දක්වා ඉහළ ගොස් ඇත.

සී/ ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රක්ෂණ ව්‍යාපාරය තුළ ක්‍රියාත්මක වන පරිපාලිත සමාගම් දෙක විසින් 2025 වසරේ පළමු මාස අට තුළ ශක්තිමත් මෙහෙයුම් කාර්යසාධනයක් වාර්තා කර ඇත. සී/ ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගම 2024 වසරේ පළමු මාස අට තුළ ලබා ගත් රු. බිලියන 18.3 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 21.3 ක බදු පෙර ලාභයක් වාර්තා කරමින් ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ ස්ථාවර වර්ධනය පෙන්නුම් කර ඇත. ඒ අතර, සාමාන්‍ය රක්ෂණ මෙහෙයුම්වල අඛණ්ඩ ශක්තිය පිළිබිඹු කරමින්, සී/ ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගම විසින් 2025 වසරේ පළමු මාස අට තුළ 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ලැබූ රු. බිලියන 2.3 ට සාපේක්ෂව රු. බිලියන 2.8 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.

### ලංකා විදුලිබල මණ්ඩලය

2025 වසරේ පළමු මාස අට තුළ විදුලි බලය සඳහා වූ ඉල්ලුම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී ගිගාවොට් පැය 10,119 සිට ගිගාවොට් පැය 10,647 ක් දක්වා සියයට 5 කින් ඉහළ ගිය ද, 2024 වසරේ පළමු මාස අට හා සැසඳීමේදී 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ විදුලි අලෙවියෙන් උපයාගත් ආදායම රු. බිලියන 402.1 සිට රු. බිලියන 271.5 ක් දක්වා සියයට 32 කින් සැළකිය යුතු ලෙස පහළ ගොස් ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ 2025 වසරේ පළමු මාස අට තුළ විදුලි ඒකකයක විකුණුම් මිල 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී කි.වො. පැයට රු. 39.74 සිට කි.වො. පැයට රු. 25.50 ක් දක්වා සාමාන්‍ය අවසන් පාරිභෝගික විදුලි ගාස්තුව අඩුවීමයි.

කෙසේ වෙතත්, පැවති හිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් තාප විදුලි උත්පාදනය මත යැපීම අඩුවීම නිසා 2024 වසරේ පළමු මාස අට හා සැසඳීමේදී 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී සෘජු උත්පාදන පිරිවැය රු. බිලියන 208 සිට රු. බිලියන 194.2 ක් දක්වා සියයට 7 කින් පහළ ගොස් ඇත. සෘජු උත්පාදන පිරිවැය පහළ ගිය ද, 2025 වසරේදී සාමාන්‍ය අවසන් පාරිභෝගික විදුලි ගාස්තුව අඩු කිරීම හේතුවෙන් 2024 වසරේ පළමු මාස අට තුළ වාර්තා කළ රු. බිලියන 116.5 ක් වූ දළ ලාභයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ලංවිමයෙහි රු. බිලියන 2.7 ක දළ අලාභයක් වාර්තා කර ඇත. ඒ අනුව, 2024 වසරේ පළමු මාස අට තුළ ලංවිමෙහි පරිපාලිත සමාගමක් වන ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ් හි කොටස් බැහැර කිරීමෙන් ලද රු. බිලියන 26 ක ලාභය ද ඇතුළත්ව වාර්තා කළ රු. බිලියන 133.7 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 4.9 ක ශුද්ධ අලාභයක් වාර්තා කර ඇත.

2024 වසරේ පළමු මාස අට තුළ උත්පාදන සංයුතිය ජල: තාප (ගල් අඟුරු): සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය, සුළං සහ වහළමත සවිකල සූර්ය බලශක්තිය: සහ තාප (ඉන්ධන) 31:35:20:14 ට සාපේක්ෂව 2025 වසරේ සමාන

කාලපරිච්ඡේදය සඳහා 35: 30: 24: 11 ලෙස වෙනස් වී ඇත. ජල විදුලිය සහ විශේෂයෙන්ම වහළමත සවිකල සූර්ය බලශක්තිය ඇතුළුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය ඉහළ යාම, වැඩි පිරිවැය සහිත ගල් අඟුරු සහ ඉන්ධන මත පදනම් වූ උත්පාදන ප්‍රභවයන් මත යැපීම අඩු කිරීමට හේතු වී ඇත. ඒ අනුව, විකුණුම් ස්ථානයේ ඒකකයක පිරිවැය 2024 වසරේ පළමු මාස අට තුළ පැවති කි.වො.පැයට රු. 30.76 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය සඳහා කි.වො. පැයට රු. 27.08 ක් දක්වා පහළ ගොස් ඇත.

2025 වසරේ අගෝස්තු මස අවසානය වන විට ලංවිමයෙහි ගෙවිය යුතු වෙළෙඳ ශේෂය රු. බිලියන 36.7 ක් වූ අතර, එයින් සියයට 48 ක් වූ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් වෙත ඇති ගෙවීම් 2024 වසරේ අවසානයේ පැවති රු. බිලියන 14.1 ට සාපේක්ෂව රු. බිලියන 17.7 ක් විය.

2025 වසර සඳහා ලංවිම විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත පාරිභෝගික විදුලි ගාස්තු සංශෝධන යෝජනා තුනක් ඉදිරිපත් කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ජනවාරි මාසයේදී සාමාන්‍ය අවසන් පාරිභෝගික විදුලි ගාස්තුවේ සියයට 20 ක අඩුවීමක් ද, ජූනි මාසයේදී සියයට 15 ක වැඩිවීමක් ද ඔක්තෝබර් මාසයේදී සාමාන්‍ය අවසන් පාරිභෝගික විදුලි ගාස්තුව නොවෙනස්ව පවත්වා ගැනීමක් ද සිදු විය.

මේ අතර, 2024 අංක 36 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතට යෝජනා කරන ලද සංශෝධන අනුව, 2025 අංක 14 දරණ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත, 2025 අගෝස්තු 18 වන දින සම්මත කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ ජාතික පද්ධති ක්‍රියාකරු සඳහා පූර්ණ රාජ්‍ය හිමිකාරීත්වය සහිත සමාගම් හතරක් සංස්ථාපනය කරන ලදී.

**4.1 වගුව**: විදුලි උත්පාදනය සහ ධාරිතාවයේ සංයුතිය

| | **2024 ජන.-අගෝ. විදුලි උත්පාදනය** | | | **2025 ජන.-අගෝ.(තාවකාලික) විදුලි උත්පාදනය** | | |
|---|---|---|---|---|---|---|
| | **ස්ථාපිත ධාරිතාවය මෙ.වො.** | **සමස්ත උත්පාදනය ප්‍රතිශතයක් ලෙස** | **ශුද්ධ උත්පාදනය ගි.වො.පැ.** | **ස්ථාපිත ධාරිතාවය මෙ.වො.** | **සමස්ත උත්පාදනය ප්‍රතිශතයක් ලෙස** | **ශුද්ධ උත්පාදනය ගි.වො.පැ.** |
| ජල විදුලිය | 1,413 | 31 | 3,447 | 1,533 | 35 | 4,169 |
| තාප විදුලිය - ලංවිම- ඉන්ධන | 801 | 10 | 1,129 | 801 | 7 | 849 |
| තාප විදුලිය - ස්වාධීන තාප විදුලි උත්පාදකයන් - ඉන්ධන | 482 | 4 | 509 | 482 | 4 | 491 |
| සුළං - ලංවිම | 104 | 2 | 264 | 104 | 2 | 258 |
| තාප විදුලිය - ගල් අඟුරු | 900 | 35 | 3,875 | 900 | 30 | 3,466 |
| සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය සහ සුළං | 784 | 13 | 1,423 | 841 | 13 | 1,546 |
| පියසි මත ඉදිකරන සූර්ය පැනල | 937 | 5 | 523 | 1,684 | 9 | 1,027 |
| **එකතුව** | **5,421** | **100** | **11,169** | **6,345** | **100** | **11,805** |

*මූලාශ්‍රය: ලංකා විදුලිබල මණ්ඩලය*

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2024 වසරේ පළමු මාස අට සඳහා ආදායම වූ රු. බිලියන 701 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ආදායම රු. බිලියන 595 ක් දක්වා සියයට 15.1 කින් අඩු වී ඇත. විකුණුම් පිරිවැය පහත වැටුණ ද ආදායම අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2024 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 62.4 ක් වූ දළ ලාභය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 43.4 ක් දක්වා සියයට 30 කින් අඩු වී ඇත.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ශුද්ධ ලාභය ද 2024 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 27.4 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 22.1 ක් දක්වා සියයට 19 කින් අඩු වී ඇත. විකුණුම් ආදායම අඩු වීම, වෙනත් මෙහෙයුම් ආදායම් රු. බිලියන 1.1 සිට රු. බිලියන 0.4 ක් දක්වා සියයට 60 කින් සැලකිය යුතු ලෙස අඩු වීම සහ 2024 වසරේ පළමු මාස අට තුළදී රු. බිලියන 3.3 ක් වූ උපලබ්ධි විනිමය අනුපාත විචලනය රු. බිලියන 0.09 ක් දක්වා තියුණු ලෙස පහළ යාම මෙම ලාභදායිත්වය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

ජාතික ඉරාන තෙල් සමාගමට ගෙවිය යුතු මුදල 2024 වසර අවසානයේ පැවති ඇ.ඩො. මිලියන 160.9 සිට 2025 වසරේ සැප්තැම්බර් මාසය අවසන් වන විට ඇ.ඩො. මිලියන 105.9 ක් දක්වා අඩු වී ඇත. එසේම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංකා බැංකුව වෙත ගෙවිය යුතු ආනයන බිල්පත්වල වටිනාකම 2025 වසරේ අගෝස්තු මස අවසන් වන විට ඇ.ඩො. මිලියන 80 ක් විය.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි සමස්ත හිඟ වෙළෙඳ ණය ප්‍රමාණය 2024 වසර අවසන් වන විට පැවති රු. බිලියන 9.9 ට සාපේක්ෂව 2025 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට රු. බිලියන 13.7 ක් දක්වා සියයට 38 කින් වැඩි වී ඇත. 2025 වසරේ අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි අලෙවිකරුවන්ට ලබා දෙන ණය පහසුකම් පුළුල් කිරීම සහ අධිකරණ තීරණයකට අනුව 2024 හා 2025 වසර සඳහා මාසික උපයෝගිතා ගාස්තු හඳුනා ගැනීමට සිදුවීමත් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. තවද, වෙස්ට් කෝස්ට් බලාගාරයට ලබා දුන් අතිරේක ණය පහසුකම් ද වෙළෙඳ ණය ප්‍රමාණය වැඩි වීමට දායක වී ඇත.

### ශ්‍රී/ස ශ්‍රීලංකන් ගුවන් සමාගම

2025 අප්‍රේල් සිට අගෝස්තු දක්වා වූ කාලය තුළ, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ මගී ආදායම සියයට 7 කින් රු. බිලියන 95.4 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, පැටවුම් සාධකය සියයට 76.4 සිට සියයට 82.6 දක්වා වර්ධනය වීම සහ මගී පරිමාව සියයට 22 කින් ඉහළ යාමත් සමඟ මගී ඉල්ලුම ශක්තිමත්ව යථා තත්ත්වයට පත්වීම මේ සඳහා හේතු වී ඇත. කෙසේ වෙතත්, ගුවන් භාණ්ඩ ප්‍රවාහන ආදායම රු. බිලියන 1.8 කින් අඩු වීම සහ අනෙකුත් ආදායම් රු. බිලියන 2.5 කින් පහත වැටීම සමස්ත ගුවන් සේවා ආදායමෙහි වර්ධනය පහළ යාමට හේතු විය. 2025 වසරේ අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලය තුළ ගුවන් සමාගමේ මෙහෙයුම් වියදම් සියයට 3 කින් ඉහළ ගොස් ඇති අතර, ඉහළ ගුවන් යානා නඩත්තු පිරිවැය, එයට ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, ගුවන් ඉන්ධන පිරිවැය අඩු වීම මෙම පිරිවැය ඉහළ යාමෙන් කොටසක් පියවීම සඳහා හේතු වී ඇත. ගුවන් ප්‍රවාහන ක්‍රියාකාරකම්වලින් රු. බිලියන 4.1 ක අලාභයක් වාර්තා වුවද, ගුවන්තොටුපළ සේවා, ගුවන් බිම් හැසිරවීම සහ ගුවන් පුහුණු කටයුතු ඇතුළත් අනෙකුත් ආදායම් ගිණුම් ගත කිරීමෙන් පසු එය රු. බිලියන 4.9 ක ලාභයක් බවට පත් වී ඇත. කෙසේ වුවද, 2024 අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලය තුළ ශ්‍රීලංකන් සේවා සමූහය විසින් වාර්තා කළ රු. බිලියන 4.2 ක අලාභයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සමූහයේ අලාභය රු. බිලියන 12.6 ක් වූ අතර, ශ්‍රීලංකන් කේටරින් සමාගමේ ශුද්ධ ආදායම රු. බිලියන 2.6 ක් දක්වා ඉහළ ගිය ද, රු. බිලියන 8.5 ක විදේශ විනිමය පාඩුව සහ අධික මූල්‍ය වියදම් මෙම අලාභය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

ගුවන් යානා භාවිත හිමිකම් වත්කම් සහ ලැබිය යුතු දෑ හි වර්ධනය හේතුවෙන්, 2025 මාර්තු මාසය අවසානය වන විට පැවති රු. බිලියන 182 ක් වූ සමාගමේ මුළු වත්කම් අගය 2025 අගෝස්තු මාසය අවසන් වන විට, රු. බිලියන 198.6 ක් දක්වා ඉහළ ගොස් ඇත. සමාගමේ ශේෂ පත්‍රය දිගින් දිගටම දුර්වල වෙමින් 2025 අගෝස්තු අවසානය වන විට සමුච්චිත අලාභය රු. බිලියන 631.5 ක් විය.

ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් ලබාගෙන ඇති දේශීය ණය ගැටළුවට විසඳුමක් ලබාදෙමින් ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර, එමඟින් තෝරාගත් රජයේ සහ රාජ්‍ය බැංකු ණය පරිවර්තනය හෝ ගෙවීම් කල්දැමීම සඳහා අවස්ථාව සලසා ඇත. මෙම පියවර මඟින් ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ද්‍රවශීලතා ගැටළුවට සහනයක් ලබා දීම සහ මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කිරීම අපේක්ෂා කරන අතර, සමාගමේ තිරසාර පැවැත්ම උදෙසා දිගුකාලීන ප්‍රතිව්‍යුහගත ක්‍රමෝපායන් අනුගමනය කිරීම ද අඛණ්ඩව සිදුවනු ඇත.

### ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2024 වසරේ අගෝස්තු මස අවසානය වන විට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කළ නල ජල සැපයුම හා ආරක්ෂිත පානීය

ජල සැපයුම පිළිවෙළින් සියයට 62.4 ක් සහ සියයට 98.1 ක් වූ අතර, එයට සාපේක්ෂව 2025 වසරේ අගෝස්තු මස අවසානය වන විට නල ජල සැපයුම හා ආරක්ෂිත පානීය ජල සැපයුම පිළිවෙලින් සියයට 63.7 ක් සහ සියයට 99.1 ක් දක්වා ඉහළ නැංවීමට සමත් වී ඇත.

2024 වසරේ පළමු මාස අට තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වාර්තා කළ රු. බිලියන 57.2 ක ආදායමට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 56.1 ක ආදායමක් වාර්තා කර ඇත. මේ අතර, 2025 ජනවාරි මාසයේ විදුලි ගාස්තු අඩු කිරීම හා සම්බන්ධිත පොම්ප කිරීමේ පිරිවැය අඩුවීම හේතුවෙන් 2025 වසරේ පළමු මාස අට තුළ විකුණුම් පිරිවැය රු. බිලියන 20.4 ක් දක්වා සියයට 10 කින් අඩු වී ඇත. එබැවින්, 2024 වසරේ පළමු මාස අට තුළ මණ්ඩලය විසින් වාර්තා කළ රු. බිලියන 35.8 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 35.7 ක දළ ලාභයක් වාර්තා කර ඇත. ඒ අනුව, දේශීය පොලී අනුපාතවල කැපී පෙනෙන පහත වැටීම හේතුවෙන්, 2024 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 17.6 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව මණ්ඩලය රු. බිලියන 25.2 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත.

2025 වසරේ පළමු මාස අට තුළ ජල නිෂ්පාදනය සහ ජල අලෙවිය යන දෙකම පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 2 කින් පමණ ඉහළ ගොස් ඇති අතර, එය පිළිවෙලින් ඝන මීටර් මිලියන 568 ක් සහ ඝන මීටර් මිලියන 429 ක් විය. තව ද, ආදායම් නොලබන ජලය 2024 වසරේ පළමු මාස අට තුළ සියයට 24.69 ක් වූ අතර, එය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 24.52 ක් දක්වා සුළු වශයෙන් වර්ධනය වී ඇත.

### ශ්‍රී ලංකා වරාය අධිකාරිය

2025 වසරේ පළමු මාස අට සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යසාධනය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව ශක්තිමත් මෙහෙයුම් වර්ධනයක් සහ ලාභදායීතාවයේ වර්ධනයක් පිළිබිඹු කරයි. හසුරවන ලද භාණ්ඩ බහාලුම් ඉහළ යාම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි වීම හේතුවෙන් අධිකාරියේ ආදායම රු. බිලියන 55.3 ක් දක්වා සියයට 12.4 කින් වර්ධනය වී ඇති අතර, සෘජු පිරිවැය සියයට 4.6 කින් පහත වැටීම නිසා දළ ලාභය සියයට 28 කින් වර්ධනය වී ඇත. 2025 වසරේ පළමු මාස අට තුළ වරාය සම්බන්ධ සේවාවලින් ලැබුණු ආදායමෙහි වර්ධනයක් පෙන්නුම් කරමින් අනෙකුත් මෙහෙයුම් ආදායම සියයට 44 කින් ඉහළ ගොස් ඇත. පරිපාලන වියදම්හි සියයට 6 ක මධ්‍යස්ථ වර්ධනයක් හමුවේ වුවද, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව මෙහෙයුම් ලාභය සියයට 41 කින් රු. බිලියන 37.3 ක් දක්වා ඉහළ ගොස් ඇත. හිතකර විදේශ විනිමය වෙනස්කම් හේතුවෙන් කාර්යසාධනය තවදුරටත් ශක්තිමත් වෙමින්, 2024 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 26.4 ක් වූ බදු පෙර ලාභය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 48 කින් රු. බිලියන 39.2 ක් දක්වා ඉහළ ගොස් ඇත.

මූල්‍ය තත්ත්වය අතින්, වරාය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සිදුකරන ප්‍රාග්ධන ආයෝජන හේතුවෙන් 2025 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට වරාය අධිකාරියේ මුළු වත්කම් රු. බිලියන 789.8 ක් දක්වා සියයට 6.6 කින් වර්ධනය වී ඇත. නැගෙනහිර බහාලුම් පර්යන්තයේ මෙහෙයුම් කටයුතු සඳහා නව පරිපාලිත සමාගමක් ස්ථාපිත කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර, මෙම ක්‍රියාවලිය නිමා වූ පසු වරාය අධිකාරියේ ආයෝජනවලින් සැලකිය යුතු කොටසක් මෙම ආයතනය වෙත මාරු වනු ඇත. රඳවාගත් ලාභ ඉහළ යාම හේතුවෙන් ස්කන්ධ ප්‍රාග්ධනය සියයට 7.8 කින් වර්ධනය වී ඇත. රු. බිලියන 10 ක් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙස රජය විසින් වරාය අධිකාරියෙන් ඉල්ලා ඇති අතර, එයින් රු. බිලියන 2 ක් දැනටමත් ඒකාබද්ධ අරමුදලට ලබා දී ඇත. සමස්තයක් වශයෙන්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ශක්තිමත් ලාභදායීතාවයක්, වර්ධනය වන ස්කන්ධ ප්‍රාග්ධනයක් සහ ශක්තිමත් ශේෂ පත්‍රයක් සහිතව මූල්‍යමය වශයෙන් ස්ථාවර තත්ත්වයක් පවත්වා ගෙන යනු ලබයි.

### ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

2025 වසරේ පළමු මාස අට තුළ ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම සමස්ත ආදායම රු. බිලියන 35.8 ක් ලෙස වාර්තා කරමින් 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ පැවති රු. බිලියන 28.5 ට සාපේක්ෂව සියයට 25 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. ගුවන් යානාවට නැගීමේ ගාස්තු දෙගුණයකට ආසන්නව ඉහළ යාම හේතුවෙන් ගඟන නාවික නොවන ආදායම් සියයට 31 කින් වැඩි වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

මේ අතර, 2024 වසරේ පළමු මාස අට තුළ දී පැවති රු. බිලියන 15.3 ට සාපේක්ෂව ප්‍රධාන වශයෙන් ක්ෂය පිරිවැය සියයට 31 කින් අඩුවීම හේතුවෙන් 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සමස්ත මෙහෙයුම් වියදම රු. බිලියන 14.8 ක් දක්වා ආන්තික වශයෙන් අඩු වී ඇත. කෙසේ වෙතත්, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී මූල්‍ය වියදම් රු. බිලියන 1.2 ක් දක්වා සියයට 45 කින් වැඩි වී ඇති අතර, 2024 වසරේ පළමු මාස අට තුළ වාර්තා කළ රු. මිලියන 876 ක් වූ විදේශ විනිමය ලාභයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපර්ච්ඡේදය තුළ සමාගම රු. බිලියන 2.5 ක විශාල විනිමය

අලාභයක් වාර්තා කර ඇත. එසේ වුවත්, සියයට 17 ක වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරමින් බදු පෙර ලාභය රු. බිලියන 21.9 ක් දක්වා වර්ධනය වී ඇත. රු. බිලියන 5.9 ක් වූ ඉහළ බදු ප්‍රතිපාදනයක් ගිණුම් ගත කිරීමෙන් පසු 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 14.9 ක් වූ ශුද්ධ ලාභය රු. බිලියන 16.1 ක් දක්වා වර්ධනය වී ඇත.

2025 වසරේ අගෝස්තු අවසානය වන විට ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමෙහි මුළු වත්කම් ප්‍රමාණය රු. බිලියන 249 ක් වූ අතර, දේපල, පිරියත හා උපකරණවල සැලකිය යුතු ආයෝජනයන් සහ රු. බිලියන 113 කට වැඩි ශක්තිමත් කෙටි කාලීන ආයෝජන මගින් සමාගම ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් පෙන්නුම් කරයි. ප්‍රධාන වශයෙන් රඳවාගත් ලාභ සහ ප්‍රත්‍යාගණන සංචිත හේතුවෙන් රු. බිලියන 106.5 ක ශක්තිමත් ස්කන්ධ ප්‍රාග්ධනයක් වාර්තා කිරීමට සමාගම සමත් වී ඇත. කෙසේ වෙතත්, ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘති හරහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සිදු කළ ආයෝජන හේතුවෙන් 2025 වසරේ අගෝස්තු මස අවසානය වන විට සමාගමේ සමස්ත ණය රු. බිලියන 102 ක සැලකිය යුතු අගයක පැවතුනි.

**4.2 වගුව: ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි බදු පෙර ලාභය**

*රු.මිලි.*

| | රාජ්‍ය ව්‍යවසාය | 2023 තත්‍ය | 2024 (තාවකාලික) | 2025 ජන - අගෝ (තාවකාලික) |
|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 40,342 | 106,904 | 78,714 |
| 2 | මහජන බැංකුව | 15,345 | 41,584 | 37,829 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 4,287 | 26,431 | 30,582 |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | -1,165 | 158 | 364 |
| 5 | නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව | 2,650 | 412 | 315** |
| 6 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 1,183 | 3,210 | 2,855 |
| 7 | සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය | 64,959 | 63,177 | 38,660*** |
| 8 | සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 10,704 | 3,546 | 4,432 |
| 9 | ජාතික රක්ෂණ භාර අරමුදල | 13,329 | 16,793 | 13,837 |
| 10 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 1,056 | 852 | 472 |
| 11 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | -3,885 | -3,182 | 574 |
| 12 | ලංකා විදුලිබල මණ්ඩලය | 57,633 | 144,394 | -4,917 |
| 13 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 120,346 | 33,265 | 22,130 |
| 14 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 40,359 | 46,734 | 39,174 |
| 15 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 5,235 | 23,945 | 25,238 |
| 16 | සීමා සහිත ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | 33,639 | 28,671 | 21,955 |
| 17 | සීමා සහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම | 3,871 | -7,595 | -15,205* |
| 18 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 2,189 | 547 | 1,873 |
| 19 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව(අ) | -2,709 | -1,041 | -152 |
| 20 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 748 | 608 | 200 |
| 21 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | -2,246 | -1,411 | -279 |
| 22 | සීමා සහිත මිල්කෝ (පුද්ගලික) සමාගම | -470 | -43 | 956 |
| 23 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය(අ) | -136 | 281 | 4 |
| 24 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | -93 | -69 | -72 |
| 25 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය(අ) | -156 | -223 | -68 |

*රු.මිලි.*

| | රාජ්‍ය ව්‍යවසාය | 2023<br>තත්‍ය | 2024<br>(තාවකාලික) | 2025<br>ජන - අගෝ<br>(තාවකාලික) |
|---|---|---|---|---|
| 26 | සීමා සහිත කුරුණෑගල වැවිලි සමාගම | 534 | 415 | 552 |
| 27 | සීමා සහිත හලාවත වැවිලි සමාගම | 303 | 219 | 505 |
| 28 | සීමා සහිත කළුබෝවිටියන තේ කර්මාන්තශාලාව | 69 | -11 | 66* |
| 29 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | -5 | 14 | -2 |
| 30 | සීමා සහිත ලංකා ඛනිජ වැලි සමාගම | 4,051 | -77 | 94 |
| 31 | සීමා සහිත ලංකා පොස්පේට් සමාගම | 363 | 465 | 230 |
| 32 | සීමා සහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | 28 | 24 | 18* |
| 33 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 3,516 | 4,197 | 4,270 |
| 34 | ජාතික ලොතරැයි මණ්ඩලය | 845 | 1,693 | 1,417 |
| 35 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 2,173 | 3,083 | 2,007 |
| 36 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | 218 | 183 | 208 |
| 37 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 1,268 | 2,474 | 992 |
| 38 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 304 | 552 | 771 |
| 39 | සීමා සහිත ස්වාධීන රූපවාහිනී ජාලය | -205 | 3 | -99 |
| 40 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | -360 | -247 | -224 |
| 41 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | -528 | -158 | -65 |
| 42 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | 57 | 85 | 44 |
| 43 | රාජ්‍ය දැව සංස්ථාව | 1,274 | 825 | 126 |
| 44 | ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | 1,501 | 367 | 62* |
| 45 | සීමා සහිත ලංකා සතොස සමාගම | -695 | -1,097 | -332 |
| 46 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | 2,792 | 284 | -164 |
| 47 | ලංකා ධීවර සංස්ථාව(අ) | -47 | -20 | 13 |
| 48 | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | 640 | -85 | -122 |
| 49 | සීමා සහිත ලංකා පොහොර සමාගම | 61 | -476 | **** |
| 50 | සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 162 | -41 | **** |
| 51 | සීමා සහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගම | -784 | -268 | -279 |
| 52 | සීමා සහිත ලංකා සීනි සමාගම | 2,835 | -1,945 | -2,077 |
| | **එකතුව** | **427,385** | **538,408** | **307,482** |

*මූලාශ්‍ර : රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

**2025 අප්‍රේල් - අගෝස්තු*

*** 2025 ජූනි 30*

**** 2025 ජූලි 31*

*****2024 වර්ෂයේ දී සී/ස ලංකා පොහොර සමාගම සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ඒකාබද්ධ කර අලුතින් පිහිටුවන ලද රාජ්‍ය පොහොර සමාගම 2025 වර්ෂයේ අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලය තුළ රු. මිලියන 337 ක ලාභයක් උපයා ඇත.*

**4.3 වගුව : රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අය බදු / ලාභාංශ ආදායම**

රු.මිලි.

| රාජ්‍ය ව්‍යවසායය | 2023 | 2024 | 2025.08.31 දක්වා | 2026 | 2027 |
|---|---|---|---|---|---|
| | තත්‍ය | | | පුරෝකථන | |
| **අයබදු** | **60,497** | **33,191** | **11,466** | **83,009** | **84,168** |
| මහජන බැංකුව | - | - | - | 12,100 | 12,100 |
| ලංකා බැංකුව | - | - | - | 18,600 | 18,600 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | - | - | - | 6,650 | 6,650 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | - | - | - | 600 | 600 |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 5,000 | 10,000 | - | 10,700 | 10,700 |
| ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම | 23,000 | 9,000 | - | 10,000 | 10,000 |
| රාජ්‍ය දැව සංස්ථාව | 641 | - | 447 | 100 | 100 |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 300 | 300 | 282 | 400 | 450 |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 2,000 | 2,919 | 1,486 | 4,000 | 4,000 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 2,000 | 1,468 | 1,688 | 2,150 | 2,200 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 390 | 25 | 120 | 50 | 50 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 533 | 928 | - | 1,265 | 1,392 |
| ජාතික ලොතරැයි මණ්ඩලය | 1,000 | 1,060 | 350 | 1,000 | 1,000 |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 40 | 13 | 64 | 154 | 169 |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 620 | 300 | 25 | 60 | 60 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 500 | 500 | - | 1,100 | 1,210 |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | 4,000 | 750 | 500 | 100 | 100 |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | - | 100 | - | 150 | 150 |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 150 | 850 | 125 | 300 | 325 |
| ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 7,000 | - | 5,000 | 5,500 | 6,050 |
| ජාතික ගමනාගමන කොමිෂන් සභාව | 300 | 250 | 150 | 250 | 280 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 75 | - | - | 220 | 242 |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධන සංස්ථාව | 500 | - | - | - | 20 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 8,066 | 607 | - | 5,764 | 5,764 |
| ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 646 | 880 | 716 | 300 | 350 |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 75 | 1,749 | - | - | - |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | 350 | 15 | - | 550 | 605 |
| සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | 200 | - | 10 | - | 5 |
| ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ජාතික ආයතනය | 115 | 85 | 30 | 30 | 30 |
| පශ්චාත් උපාධි අධ්‍යයන කළමනාකරණ ආයතනය | 25 | 4 | 30 | 30 | 30 |
| වෙනත් රාජ්‍ය ව්‍යවසායයන් | 2,971 | 1,388 | 444 | 886 | 936 |
| **ලාභාංශ** | **15,204** | **7,889** | **3,172** | **14,943** | **15,436** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 30 | - | - | - | - |
| ලංකා බැංකුව | 173 | - | - | - | - |

*රු.මිලි.*

| රාජ්‍ය ව්‍යවසායය | 2023 | 2024 | 2025.08.31 දක්වා | 2026 | 2027 |
|---|---|---|---|---|---|
| | තත්‍ය | | | පුරෝකථන | |
| මහජන බැංකුව | 158 | - | - | - | - |
| සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 2,272 | 1,271 | - | 4,700 | 4,700 |
| සීමා සහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා(ශ්‍රී ලංකා)(පුද්ගලික)සමාගම | 5,500 | 1,286 | - | 5,969 | 5,969 |
| සීමා සහිත ලංකා ඛණිජ වැලි සමාගම | 2,500 | 158 | - | 500 | 700 |
| සීමා සහිත ලංකා පොස්පේට් සමාගම | 220 | 75 | 25 | 75 | 75 |
| සීමා සහිත ලංකා ලේලන්ඩ් සමාගම | 6 | - | - | 7 | 8 |
| සීමා සහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම | 125 | 75 | - | 134 | 148 |
| සීමා සහිත මන්තායි සෝල්ට් සමාගම (සී/ස ජාතික ලුණු සමාගම) | 120 | - | - | 60 | 60 |
| සීමා සහිත ලංකා පොහොර සමාගම | 22 | 15 | - | - | - |
| සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 60 | 30 | - | - | - |
| සීමා සහිත පරන්තන් කෙමිකල් සමාගම | 305 | 131 | - | 60 | 60 |
| සීමා සහිත රජයේ වාණිජ නීතිගත සංස්ථාව | 150 | 50 | - | 60 | 65 |
| සීමා සහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 223 | - | 227 | 227 | 227 |
| සීමා සහිත ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | - | 1,324 | 494 | 544 | 598 |
| සීමා සහිත ලංකා විදුලිබල සමාගම | 697 | 436 | - | 400 | 450 |
| සීමා සහිත ලංකා කාර්මික වතු සමාගම | 174 | 98 | - | - | - |
| සීමා සහිත ලංකා කෘෂි කර්මාන්ත සමාගම | 167 | 202 | 131 | - | - |
| වැවිලි සමාගම් | 554 | 559 | 134 | 400 | 570 |
| සීමා සහිත ලංකා සීනි සමාගම | 1,597 | - | - | - | - |
| ලංකා ත්‍රිපෝෂ සමාගම | 75 | 100 | 11 | 150 | 150 |
| වෙනත් රාජ්‍ය ව්‍යවසායයන් | 75 | 2,080 | 2,150 | 1,657 | 1,657 |
| **එකතුව** | **75,701** | **41,081** | **14,639** | **97,952** | **99,604** |

*මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් හා රාජ්‍ය ව්‍යපාර දෙපාර්තමේන්තුව*

# 2026 අයවැය සැකසීම සඳහා යොදා ගත් පදනම | 05

## 5.1 සමාලෝචනය

2026 වසරේ අයවැයෙහි සාර්ව ආර්ථික සහ රාජ්‍ය මූල්‍ය ඇස්තමේන්තු අයවැය සකස් කරන අවස්ථාවේදී උපකල්පන, විශ්ලේෂණ හා තීන්දු/තීරණ මාලාවක් මත පදනම් වේ. මෙම කොටස මඟින්, දළ දේශීය නිෂ්පාදිතය සහ උද්ධමනය ඇතුළු ආදායම් හා වියදම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා සලකා බලනු ලබන ප්‍රධාන සාර්ව ආර්ථික දර්ශක ගෙනහැර දක්වන අතර, ගෝලීය සහ මූල්‍ය අංශයේ සංවර්ධනයත් සමඟ රැකියා වියුක්තිය, විදේශ අංශය සහ ශ්‍රම වෙළෙඳපොළේ ප්‍රවණතා පිළිබඳව ද අවධානය යොමු කරන අතර, ඇස්තමේන්තුවල සංවේදීතාවයන් ද ඉස්මතු කරයි.

## 5.2 දළ දේශීය නිෂ්පාදිතය

දේශපාලන හා සාර්ව ආර්ථික ස්ථාවරත්වයේ ප්‍රගතිය මඟින් ශක්තිමත් කෙරෙන ශ්‍රී ලංකාවේ ආර්ථිකය අර්බුදයෙන් යථා තත්ත්වයට පත්ව ඇති අතර, කෘෂිකර්ම, කර්මාන්ත සහ සේවා වැනි අංශවල පුළුල් ප්‍රසාරණයක් පිළිබිඹු වේ. 2025 වසරේ පළමු භාගයේ දී ආර්ථිකය සියයට 4.8 කින් වර්ධනය වී ඇත. මූලික තත්ත්වයන්ට අනුව, 2026 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයෙහි සියයට 4 ත් 5 ත් අතර වර්ධනයක් අපේක්ෂා කෙරේ. දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල පුනර්ජීවනය, විදේශ අංශයේ වැඩිවන ඉල්ලුම, වැඩිදියුණු වූ සැපයුම් තත්ත්වයන් සහ සංචාරක කර්මාන්තය ඇතුළු ප්‍රධාන කර්මාන්ත සංවර්ධනය වීම මඟින් සියලු අංශ හරහා පුළුල් වර්ධනයක් අපේක්ෂා කෙරේ.

කෘෂිකාර්මික අංශය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය වන්නේ, අපනයන ඉලක්ක කරගත් අගය එකතු කළ අංශයක් බවට පත් කිරීම සඳහා එම අංශයේ ඵලදායිතාවය, තරඟකාරිත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමයි. මෙහි මූලික ක්‍රියාමාර්ග අතරට ගුණාත්මක බීජ සංවර්ධනය, ජල සම්පත් කෘෂිකර්මාන්තය සඳහා කාර්යක්ෂමව භාවිතය සහ වෙළෙඳපොළේ ඉල්ලුම හා සැපයුම අතර පරතරය අවම කිරීම ඇතුළත් වේ. මීට අමතරව, නිෂ්පාදනයේ සිට පරිභෝජනය දක්වා සමස්ත වටිනාකම් දාමය ආවරණය වන පරිදි විස්තීර්ණ දත්ත සහ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. මෙම ප්‍රයත්නයන් මගින් කෘෂිකාර්මික ඵලදායිතාව ශක්තිමත් කර සමස්ත නිෂ්පාදනය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. කර්මාන්ත අංශය ද කැපී පෙනෙන ලෙස පුළුල් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, විශේෂයෙන්ම ඉදිකිරීම් සහ නිෂ්පාදන අංශයන්හි, අගය එකතු කළ නිෂ්පාදන සහ අපනයන විවිධාංගීකරණය කෙරෙහි අවධානය යොමු වී ඇත.

දළ දේශීය නිෂ්පාදිතයෙන් විශාලතම කොටස සේවා අංශය නියෝජනය කරන අතර, මූල්‍ය, ප්‍රවාහන, තොරතුරු තාක්ෂණ, වෙළඳ සහ දේපළ වෙළඳාම් වැනි උප අංශයන්හි වර්ධනය මෙන්ම ප්‍රවාහන, ස්වයංක්‍රීයකරණය සහ ඩිජිටල්කරණය සඳහා වූ රාජ්‍ය ආයෝජන ඉහළ දැමීම හේතුවෙන් සේවා අංශය තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සේවා අංශය තුළ වර්ධනය, රටේ සමස්ත ආර්ථික සංවර්ධන උපායමාර්ගයේ ප්‍රධාන අංගයක් ලෙස සැලකෙන ඩිජිටල් ආර්ථිකයේ වේගවත් වර්ධනයත් සමඟ ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෘත්‍රිම බුද්ධිය, රොබෝ තාක්ෂණය සහ අනෙකුත් නැගී එන තාක්ෂණයන් සම්බන්ධ නවෝත්පාදනයන් සඳහා වර්ධනය වූ ආයෝජන සමඟ ඩිජිටල් ගෙවීම් යටිතල පහසුකම් පුළුල් කිරීම ආර්ථිකයට සේවා අංශයේ දායකත්වය ඉහළ නැංවීමට හේතු වේ. රජය විසින් අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ සංචාරකයන්ගේ ආරක්ෂාව සහ තෘප්තිමත්භාවය තහවුරු කිරීම සඳහා වන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම මගින් සංචාරක ව්‍යාපාරයෙන් උත්පාදනය කරන වටිනාකම ද උපරිම කිරීමට රජය අවධානය යොමු කර ඇත.

## 5.3 පාරිභෝගික මිල ගණන්

ශ්‍රී ලංකාව 2025 වසරේ ජනවාරි මාසයේ සිට මාස හතක් පුරා අඛණ්ඩව අවධමනයක් වාර්තා කිරීමෙන් පසුව, 2025 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලදී ධනාත්මක උද්ධමනයක් වාර්තා කර ඇත. ආහාර සහ මධ්‍යසාර නොවන පාන වර්ගවල මිල ඉහළ යාම සහ උපයෝගී සේවාවන් සහ ඉන්ධන ගාස්තු මිල සංශෝධනයන් මෑතකාලීන උද්ධමනය සඳහා හේතු වී ඇත. 2025 වසරේ සැප්තැම්බර් මාසය වන විට, ආහාර උද්ධමනය සියයට 2.9 ක් වූ අතර, ආහාර නොවන උද්ධමනය සියයට 0.7 ක් විය.

ඉහළ යන දේශීය ඉල්ලුම, පාලිත මිළ ගණන් සාමාන්‍යකරණය වීම සහ විචක්ෂණශීලී මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන්, ශ්‍රී ලංකාවේ උද්ධමනය 2026 වසරේ මැද භාගය වන විට සියයට 5 ක ඉලක්කය කරා ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම දැක්ම සඳහා ස්ථාවර ගෝලීය බලශක්ති සහ භාණ්ඩ මිල ගණන්, හිතකර කෘෂිකාර්මික නිෂ්පාදනයන් හා අඛන්ඩ විනිමය අනුපාත ස්ථාවරත්වයක් උපකල්පනය කෙරේ.

## 5.4 සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය

සේවා වියුක්ති අනුපාතය 2024 වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 4.5 සිට සියයට 3.8 දක්වා අඩු වී ඇති අතර ශ්‍රම බලකායේ සහභාගීත්ව

අනුපාතය ද 2024 වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 47.1 සිට සියයට 49.7 දක්වා ඉහළ ගොස් ඇත.

ආර්ථිකය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීම සහ ආර්ථිකයේ අංශ තුනෙහිම අපේක්ෂිත ප්‍රසාරණයත් සමඟ, 2026 වසරේ සේවා වියුක්ති අනුපාතය තවදුරටත් අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 5.5 විදේශීය අංශය

2025 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ භාණ්ඩ හා සේවා අපනයනයේ ඉහළ වර්ධනයක් පිළිබිඹු කරමින් අඛණ්ඩව මාසික ජංගම ගිණුමේ අතිරික්ත වාර්තා වූ අතර 2026 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජංගම ගිණුමේ ශේෂය 2024 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 1,618.0 සිට 2025 වසරේ සමාන කාලපරිඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,039.5ක් දක්වා සියයට 26.1 කින් සැලකියයුතු ලෙස වර්ධනය විය. 2024 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිඡේදය තුළ ඇ.ඩො. මිලියන 2,167.0 ක් සංචාරක ඉපැයීම් වාර්තා වූ අතර, එය 2025 වසරේ සමාන කාලපරිඡේදය තුළ ඇ.ඩො. මිලියන 2,290.0ක් දක්වා සියයට 5.7 කින් වර්ධනය විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2025 වසරේ මුල් මාස අට තුළ ඇ.ඩො. මිලියන 5,116.0 දක්වා සියයට 19.3 ක ශක්තිමත් වර්ධනයක් වාර්තා කර ඇති අතර සේවා අංශයේ ශුද්ධ ගලා ඒම් 2025 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිඡේදය තුළ ඇ.ඩො. බිලියන 2.7ක් දක්වා සියයට 2.3කින් ඉහළ ගොස් ඇත. 2025 වසරේ මුල් මාස අට තුළ වාර්තා වූ සංචාරක ඉපැයීම් සහ විදෙස්ගත ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණ වර්ධනය, 2026 වසරේ දී ශුද්ධ ගලා ඒම් තවදුරටත් පුළුල් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාතික අපනයන සංවර්ධන සැලැස්ම (2025–2029) ක්‍රියාත්මක කිරීම සහ සරල, විනිවිදභාවයෙන් යුතු සහ පුරෝකථනය කළ හැකි තීරුබදු රාමුවක් ස්ථාපිත කිරීම අරමුණු කරගත් ජාතික තීරුබදු ප්‍රතිපත්තියක් හඳුන්වා දීමත් සමඟ, ගෝලීය වෙළඳපොළ වෙත භාණ්ඩ හා සේවා අපනයන ව්‍යාප්ත වීම හේතුවෙන් විදේශ සංචිත ප්‍රමාණය ද වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෙවුම් ශේෂ සමතුලිතතාවය සහ ශක්තිමත් වූ වෙළඳපොළ විශ්වාසය තුළින් 2026 වසරේ දී විනිමය අනුපාතිකය ද ස්ථාවර මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 5.6 මුදල් සමස්තයන්

මුදල් සැපයුම උචිත මට්ටමක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. 2026 වසරේ දී අපේක්ෂිත ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.2 ක් දක්වා ඉහළ නැංවීම සහ අපේක්ෂිත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.3 ක් දක්වා අඩු කරමින් රජයේ දළ මූල්‍යන අවශ්‍යතා තිරසාර මට්ටමක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. මෙය පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කරනු ඇත.

## 5.7 ආදායම

ආදායම් ඇස්තමේන්තු වලට පාදක වන උපකල්පන ඇමුණුම III හි විස්තර කර ඇත.

## 5.8 වියදම්

වියදම් ඇස්තමේන්තු සකස් කිරීමට යොදාගත් උපකල්පන පහත පරිදි වේ:

- **වැටුප් සහ වේතන:** ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ දළ වශයෙන් මිලියන 1.3 ක සේවක සංඛ්‍යාවක් සහිත රාජ්‍ය අංශයේ ශ්‍රම බලකාය මතය. 2026 වසරේ නව බඳවාගැනීම් හරහා රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි නොවනු ඇතැයි උපකල්පනය කෙරේ. තවද, රාජ්‍ය අංශයේ සේවකයන්ට 2025 වසරේ අයවැයෙන් යෝජනා කරන ලද වැටුප් වැඩිවීම් සමඟ වාර්ෂික වැටුප් වර්ධකයන් ඇස්තමේන්තුවට ඇතුළත් කර ඇත.

- **විශ්‍රාම වැටුප් ගෙවීම්:** විශ්‍රාම වැටුප් සඳහා වන වියදම් ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ 745,000 ක් වන ඇස්තමේන්තුගත විශ්‍රාමිකයින් සංඛ්‍යාව සහ 2025 වසරේ අයවැයෙන් යෝජනා කරන ලද 2026 වසර සඳහා වූ විශ්‍රාම වැටුප් වැඩිකිරීම මත ය.

- **පොලී ගෙවීම්:** දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ ඉදිරියේදී ප්‍රතිපත්ති පොළී අනුපාත අඩු වීමේ හැකියාවත් යන ද්විත්වයේ බලපෑම හේතුවෙන් 2026 වසර වෙනුවෙන් පොලී ගෙවීම සඳහා වන වියදම අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **භාණ්ඩ හා සේවා:** භාණ්ඩ හා සේවා සඳහා වන වියදම රුපියල් බිලියන 401.0 දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **කුටුම්භ සඳහා සහනාධාර:** අස්වැසුම වැඩසටහන ඇතුළුව වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයන් සහ නිදන්ගත වකුගඩු රෝගීන් වැනි අනෙකුත් කාණ්ඩ ඉලක්ක කරගත් වැඩසටහන් සඳහා වන ප්‍රතිපාදන ඉහළයාම පිළිබිඹු කරමින් සමාජ ආරක්ෂණ ජාල සඳහා වන වියදම් ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. ඊට අමතරව, නිල ඇඳුම් සහ පෙළපොත් සැපයීම හරහා පාසල්

ළමුන්ට ආධාර, ආබාධිත සොල්දාදුවන් සඳහා සහාය, ගැබිනි මව්වරුන් සඳහා පෝෂණ වැඩසටහන්, නොමිලේ ඖෂධ සැපයීම සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා වන පොහොර සහනාධාර ඇතුළු අනෙකුත් ප්‍රධාන සුභසාධන වැඩසටහන් සඳහා අරමුදල් සැපයීම ද පුළුල් මට්ටම්වලින් අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **රාජ්‍ය ආයතන සහ සංස්ථා සඳහා වන පැවරුම්:** ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන් (SOEs) ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් මධ්‍යස්ථ වැඩිවීමක් සිදුවනු ඇත.

- **රාජ්‍ය ආයෝජන:** 2026 වසරේ දී, රාජ්‍ය ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.0 ක් පමණ වනු ඇති අතර, ප්‍රමුඛ නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් අඩු කරමින් ප්‍රමුඛතාවය දිය යුතු අංශවලට ආයෝජන යොමු කෙරේ.

- **2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත:** මෙම පනත 2024 වසරේ අගෝස්තු මස 8 වන දින සිට බලාත්මක වූ අතර 2025 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට පූර්ණ ක්‍රියාකාරිත්වයට පත්වේ. පනත යටතේ හඳුන්වා දී ඇති ව්‍යුහාත්මක, ක්‍රියා පටිපාටික සහ ආයතනික සංශෝධන, අනෙකුත් කාරණා අතර, වියදම් කළමනාකරණය ඇතුළුව රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ විනිවිදභාවය, වගවීම, විනය, ඵලදායිතාවය හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කරනු ඇත.

- **තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් විසඳුම්:** සියලුම රජයේ ගෙවීම් ඩිජිටල්කරණය සඳහා 'GovPay' වේදිකාව හඳුන්වාදීම ඇතුළු රට ඩිජිටල් සමාජයක් බවට පරිවර්තනය කිරීමේ උත්සාහයන් මගින් රාජ්‍ය සේවා සැපයීම මෙන්ම මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කරනු ඇත.

